FM 104.4,105.7

ශ්‍රී ලංකාවේ ප්‍රථම බෞද්ධ ගුවන් විදුලි නාලිකාව

"රංගිරි ශ්‍රී ලංකා"

සැබෑ මාධ්‍ය සංස්කෘතියක පෙර ගමන්කරු


# රංගිරි ශ්‍රී ලංකා

## RANGIRI SRI LANKA NEWSPAPER




FM 104.4,105.7

ශ්‍රී ලංකාවේ ප්‍රථම බෞද්ධ ගුවන් විදුලි නාලිකාව

"රංගිරි ශ්‍රී ලංකා"

සැබෑ මාධ්‍ය සංස්කෘතියක පෙර ගමන්කරු




ශ්‍රී.බු.ව. 2564- ක්‍රි.ව. 2020
දෙසැම්බර්(උඳුවප්)

මාසික බෞද්ධ සාර සංග්‍රහය ~ අන්තර්ජාල කලාපය

25












**රංගිරි ශ්‍රී ලංකා රූපවාහිනිය**

රංගිරි ශ්‍රී ලංකා
RSL TELEVISION

**UHF CH 60**
**PEO TV CH 22**
**Dialog Tv 21**
**Dish Tv 2532**

**රංගිරි ශ්‍රී ලංකා ගුවන් විදුලිය**
**දේශයේ රන් හඬ**

රංගිරි ශ්‍රී ලංකා
RSL RADIO

**FM 104.4 - 105.7**

වෙබ් : www.rangirisrilanka.lk



රංගිරි දඹුල්ල සංවර්ධන පදනමේ ප්‍රකාශනයකි.




ව්‍යවහාර මාස ක්‍රමයෙන් දොළොස්වන මාසය වන්නේ දෙසැම්බර් මාසයයි. සිංහල මාස ක්‍රමයට අවසාන මාසය ලෙස සැලකෙන්නේ උඳුවප් මාසයයි. වර්ෂ අවසාන පොහොය වන්නේද මෙම මාසයයි. මෙම පොහොය වැදගත් වන්නේ කාන්තාවන්ට විමුක්ති මාර්ගය පෙන්වා දුන් උතුම් පොහොයක් වන නිසයි.

පැරණි භාරතීය කාන්තා සමාජයට (ක්‍රි.පූ06) ආගමික හා සාමාජික නිදහස බ්‍රාහ්මණයන් (බමුණන්) විසින් අහිමිකරන ලද අතර ඒ අනුව කටයුතු කිරීමට කාන්තාවන්ට සිදුවිය.යාග ගීතිකා ගැයීමට හෝ ඒවා ඇසීමට හෝ බමුණන් විසින් කාන්තා සමාජයට තහනම් විය. ස්වාමියා මියගිය විට විවිහක කාන්තාව එම ගිනිමැලයට පැන සියදිවි හානිකර ගතයුතු නීති සමූහයක් බමුණන් විසින් ඉදිරිපත් කර තිබුණි. එම නීති කඩකිරීම සමාජයට ආගමික හා සාමාජික නිදහස ලබාදුන්නේ 06 වෙනි සියවසේ ඉන්දියාවේ පහළවුණ බුදුරජාණන් වහන්සේ ය. මහා ප්‍රජාපතී ගෝතමිය ප්‍රධාන කුල කාන්තාවන්ගෙන් ආරම්භ වූ කාන්තා සමාජය භික්ෂුණී සමාජයක් බවට පරිවර්තනය විය. එතැන්සිට කාන්තා සමාජයට විමුක්තිය උදාවිය.මෙම නිදහස ලබාදුන් උතුම් පොහොය ලෙස සැලකෙන්නේ උඳුවප් පොහොයයි. බුද්ධත්වයෙන් පස්වෙනි වසරේදී මෙම සිදුවීම ගැන ශාසන ඉතිහාසයෙහි කරුණු සඳහන් වෙයි.

ධර්මශෝක අධිරාජ්‍යයා බුදුදහම වැළඳ ගැනීමෙන් පසු බුද්ධ ශාසනයේ අභිවෘද්ධියට ශාසනික සේවාවන් රැසක් සිදු කළේය.තෙවන ධර්ම ප්‍රචාරක කටයුතු සිදුවිය. ශ්‍රී ලංකා ද්වීපයට මිහිඳු මහරහතන් වහන්සේ ප්‍රධාන දූත පිරිසක් පැමිණීමත් සමඟ මෙරට භික්ෂු ශාසනය සමාප්ත විය. අනුලා දේවිය ප්‍රධාන රාජකීය බිසෝවරුන්වත් පැවිදිවීමට අවශ්‍ය විය. දෙවනපෑතිස් රජුගේ මෙහෙයවීමෙන් සංඝමිත්තා රහත් මෙහෙණින් වහන්සේ මෙරටට වැඩමවා භික්ෂුණී ශාසනය පිහිටුවීමෙන් පරම පූජනීය පාරිභෝගික වස්තුවක් වූ ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ දක්ෂිණ ශාඛාවක් රැගෙන ඒමත් සිදු වූයේ උඳුවප් පොහෝදාය. අනුරාධපුර අටමස්ථානයන් මූලික කරගෙන විශේෂ පිංකම් මෙම පොහෝදිනය තුළ සිදුකරණු ලබයි. මෙරට භික්ෂුණීන් වහන්සේලාට පමණක් නොව ශ්‍රී ලාංකික බෞද්ධ ජනතාවට උතුම් පොහෝ දිනයක් ලෙෂ උඳුවප් පොහොය දින සැළකේ.


**ඇම්.ඩී.විජයවර්ධන**

## පුදබිමක අසිරිය

# දෙගල්දොරුව රජමහා විහාරය


කන්ද උඩරට රාජධානියට අයත් අමුණුගම නම් ගම්පියසෙහි මෙම ඓතිහාසික විහාරස්ථානය පිහිටා ඇති අතර මෙම විහාරස්ථානයේ ඇති බිතුසිතුවම් විශිෂ්ටතම ඒවා ලෙස පුරාවිද්‍යාඥයින් හඳුන්වා දී තිබේ. උඩරට රාජධානියේ රජකම්කළ නායක්කාර් රජවරුන්ගේ අනුග්‍රහය ග්‍රන්ථවල සඳහන් වෙයි. මෙම ස්ථානය ගොඩනැංවීම සඳහා මූලිකව ක්‍රියාකර ඇත්තේ කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමාය. වයස්ගතව සිටිහෙයින් රජුට එම කටයුතු අවසන් කිරීමේ ගෞරවය හිමවන්නේ රාජාධි රාජසිංහ රජතුමාමය. රජතුමාට කුඩා කාලයේදී ශිල්පය ඉගැන් වූ මොරතොට ධම්මක්ඛන්ධ හිමියන්ට මෙම විහාරය පූජා කරන ලදි.





රාජගුරු පදවියද උන්වහන්සේ වෙත පිරිනැමූ රජතුමා විහාරයේ නඩත්තුව සඳහා ද ගම්වර පූජා කළ බවද සඳහන් වෙයි.

උඩරට සිතුවම් සම්ප්‍රදය ගැමි කලාසම්ප්‍රදයක් ලෙස සලකා සිතුවම් ඇඳීම සිදුකර තිබේ. ජාතක කථා නිරූපණයේදී ඒවා වෙන් නොකර එකදිගටම චිත්‍ර නිරූපණය කිරීම මෙහි ඇති විශේෂත්වයයි. වෙස්සන්තර ජාතක කථා ප්‍රවෘත්තිය සිතුවමට නැගීමේදී විවිධ අවස්ථාවන් වශයෙන් ගස්,ගල්,පර්වත,ඇල,දෙළ යොදාගෙන තිබෙන ආකාරය දැක්විය හැකිය. විවිධ වර්ණයන් මේ සඳහා භාවිතා කර ඇති බව පෙනෙන්නට තිබේ. ''වෙස්සන්තර ජාතකය, සුතසෝම ජාතකය,සත්තු භක්ත ජාතකය, මහා සීලව ජාතකය '' යන ජාතක කථා රාශියක් මෙහි සිතුවම්ට නගා තිබේ. සැතපෙන පිළිමයට ඉදිරිපසින් නිරූපිත ''මාර යුද්ධය'' සුවිශේෂී චිත්‍රයකි. මෙහි දැක්වෙන මාරයා මුහුණ පහතින් යුක්තවීමත්, අතෙහි ආයුධ කිහිපයක් ද ඇඳ තිබේ. බුදුරජාණන් වහන්සේ මාර පරාජය කිරීමේදී මහී කාන්තාව සාක්ෂි දැරූ බව පෙන්නුම් කරන චිත්‍රයක් ද මෙහි දක්නට ලැබේ. ලෙන් දෙකක් වශයෙන් පෙන්නුම් කරන මෙහි චිත්‍රවලට අමතරව සැතපෙන පිළිම, හිඳි පිළිම යන අංශ දෙකක්ද මෙහි දක්නට ලැබේ.



මෙම ස්ථානයේ ගල් දෙකක් එකට එක්වන ස්ථානයක් වශයෙන් පිහිටා තිබේ. මෙහි ඇති ගුහාවෙහි රන් දෑකැති දෙකක් තිබූ බවත්, එක්තරා මනුෂ්‍යයෙකු එය රැගෙන ගොස් එක් දෑකැත්තක් පමණක් ගෙනවිත් තැබූවිට සියලුම දෑකැති ගෙනවිත් තබන ලෙසට මෙහි විසූ බහිරවයා නියම කරන ලදි. එම නියමය පරිදි රන්දෑකැති මෙම ස්ථානයෙහි තැබූවිට ගුහාවෙහි දොරවැසුණු බවත් එම නිසාම ''දෙගල්දොරුව'' යන නම භාවිතයට ගත් බවත් ජනප්‍රවාදයන්හි දැක්වේ.

**විජය තලවත්තේගෙදර**

# බුදු දහම හා කාන්තාව

ප්‍රාග් බෞද්ධ යුගයේ කාන්තාව සමාජයේ සැඟවුණු චරිතයක්සේ ම ඇයට ආගමික සාමාජික අධ්‍යාපනික වශයෙන් කිසිම හිමිකමක් අයිතිවාසිකමක් ලබා නොදුනි. කාන්තාව කෙරෙහි ලබා දුන්නේ අන්ත අසරණ තත්වයක් බව වටහා ගත් බුදුරජාණන් වහන්සේ වනිතාව කෙරෙහි අහිමි වූ ආගමික, අධ්‍යාපනික, දේශපාලනික, ආර්ථික හා සාමාජික යන සියලුම අයිතීන් ලබා දීමට පියවර ගත්හ. ඒ අංශ අතර දියණියක වශයෙන්, බිරිඳක් වශයෙන්, උපාසිකාවක් වශයෙන්, භික්ෂුණියක් වශයෙන් ලබා දිය යුතු සියලු වරප්‍රසාදයන් හිමිකර දීමට ක්‍රියා කළහ.

බ්‍රාහ්මණ සමාජයේ ඔවුන්ගේ ආකල්පයන් යටතේ දියණියක් බිහිවීම සැලකුවේ පරපුරේ විනාශය ගෙන දෙන අසුභදායක පෙරනිමිත්තක් වශයෙනි. එහෙත් මෙම වැරදි චින්තනය මුළුමනින්ම වෙනස් කිරීමට බුදු දහම කටයුතු කර තිබේ. දියණියක වශයෙන් ඇයට හිමිකර දිය යුතු සියලු වර ප්‍රසාද නොඅඩුව හිමිකර දුන්හ. වර්තමානයේ වුවද එදා ලැබුණු ඒ වර ප්‍රසාද කාන්තාවන් භුක්ති විඳින බව අමතක කළ යුතු නොවේ. බිහි වූ දරුවා පිළිබඳව සැළකිය යුත්තේ ගැහැණු බව හෝ පිරිමි බව නොව සෑම දරුවෙක්ම දරුවෙක් යන, ආකල්පයෙන් ක්‍රියා කිරීමට බුදු දහම පෙන්වා දී තිබේ. එහිදී ස්ත්‍රී හෝ වේවා පුරුෂ වේවා කවර හෝ දරුවෙකු ඇමතීමට බුදුරජාණන් වහන්සේ භාවිතා කළේ "පුත්ථිමා"(පුතා) යන ආදරණීය වචනයයි. මෙයට කදිම නිදසුනක් ලෙස, දිනක් කොසොල් රජතුමා බුදුරජාණන් වහන්සේ හමු වීමට පැමිණ කණස්සල්ලෙන් සිටීමට හේතු විමසන විට මල්ලිකා දේවියට දියණියක් ලැබුණු බව කණගාටුවෙන් දැන්වීය. එම අවස්ථාවේ බුදුරජාණන් වහන්සේ කොසොල් රජුට පැහැදිලි කළේ,

"ඉත්ථිපිහි ඒකච්චියා - සෙය්‍යො පෝස ජනාධිප
මේධාවිනි සීලවතී සස්සු දේවා පතිබ්බතා"
"තස්සායෝ ජායතී පොසෝ - සූරෝ හෝති දිසම්පති
තාදිසා සුභගියා පුත්තෝ - රජ්ජම්පි අනුසාසති"

රජතුමනි, කනස්සල්ලට පත් නොවන්න. දියණිය පුතෙකුටත් වඩා ශ්‍රේෂ්ඨ විය හැක. සිල්වත්ව පතිවත ආරක්ෂා කර සිට පුතෙකු බිහි කළ හොත් එම පුතණුවන් රාජානුශාසනාවට පවා සුදුසුය. ඔබේ දියණිය ද එවැනි කෙනෙකු විය හැකිය. මේ තුළින් කාන්තාව පිළිබඳ ඇඳ තිබූ වැරදි චිත්‍රය මුළුමනින් ම මකා දැමීමට හැකි විය.

බ්‍රාහ්මණ සමාජය යටතේ කාන්තාවට බිරිඳක් වශයෙන් ද අත් වූයේ ඉතා ශෝචනීය තත්වයකි. එදා බිරිඳට කටයුතු කිරීමට සිදු වූයේ සහකාරියක් වශයෙන් නොව මෙහෙකාරියක් වශයෙනි. නිවසක ප්‍රධානියා විය යුත්තේ ස්වාමියා පමණක් නොව බිරිඳ ද එම තත්වයට පත් විය යුතු බව සූත්‍ර රාශියකින් ම කරුණු දක්වමින් බිරිඳගේ වර ප්‍රසාද තහවුරු කර තිබේ. කාන්තා වරප්‍රසාදයන් තහවුරු කළ බුදුරජාණන් වහන්සේ ඇයට හිමි කර දිය යුතු වරප්‍රසාදයන් පුරුෂයාට සමාන ලෙසින් ම ලබා දී ඇති අයුරු සිඟාලෝවාද සූත්‍රයේ දී මනාව පැහැදිලි වේ. එහි දී ස්වාමියා විසින් බිරිඳ විෂයෙහි ඉටු කළ යුතු යුතුකම් පහක් සඳහන් කර තිබේ. ගෞරවයෙන් කථා කිරීම, අවමන් නොකිරීම, පර ස්ත්‍රී සේවනයෙන් වැළකීම, ඉසුරු පවරා දීම හා අලංකාර වස්ත්‍රාභරණ ලබා දීම දැක්විය හැක.

මෙහිදි ස්වාමියාට තම අයිතිවාසිකම් පමණක් තහවුරු කොටගෙන හුදකලා වීමට ඉඩ දී නැත. මේ තුළින් බිරිඳකගේ අයිතිවාසිකම් ද ඉටුකර දිය යුතු බව පෙන්වා දී තිබේ. එසේම කාන්තාවට සමාජයේ ගෞරවාන්විතව ජීවත් වීමට ද මේ නිසා ඉඩ ප්‍රස්ථාව ලැබේ.

සංවාස සූත්‍රයේ දී බුදුරජාණන් වහන්සේ පැහැදිලි කර දෙන්නේ ආචාර ධර්මයන්ගෙන් සමන්විය යුතු වන්නේ කාන්තාවන් පමණක් නොව දෙදෙනාම ආචාර ධර්මවල පිහිටා ක්‍රියා කළ යුතු බවයි. එහිදී සමාජයේ ජීවත්වන පවුල් හතරක් පිළිබඳ මෙම සූත්‍රයේ දක්වා තිබේ. එම කණ්ඩායම් වන්නේ ඡවෝ ඡවාය සද්ධිං සංවසති මළ මිනීයක් මළමිනීයක් සමඟ ජීවත් වීම, ඡවෝ දේවියා සද්ධිං සංවසති, මළ මිනියක් දෙව්දුවක හා විසීම, දේවෝ ඡවාය සද්ධිං සංවසති, දෙවියෙක් මළමිනියක සමඟ විසීම, දේවෝ දේවියා සද්ධිං සංවසති, දෙවියෙක් දිව්‍යාංගනාවක් සමඟ විසීම ආදියයි. මෙහි දී බුදුරජාණන් වහන්සේ මෙම කණ්ඩායම් හතරෙන් ම අනුමත කොට ඇත්තේ හතරවන පවුල් ඒකකයයි. මෙහි දී ප්‍රකාශ වන්නේ බිරිඳත් ස්වාමියාත් දෙදෙනාම ගුණ ධර්මවලින් යුක්ත වු අය විය යුතු බවයි. එක් පාර්ශවයක් පමණක් යහපත් ව අනෙක් පාර්ශවය රිසිසේ කටයුතු කරීමක් මෙහි දී සිදු නොවේ. ගුණ ධර්මවලින් යුක්ත වීම දෙදෙනාටම අනිවාර්ය වේ. මෙය වර්තමානයේ පිරිහී යන පවුල් සංස්ථාව නැවත ගොඩ නැඟීමට ප්‍රබල සාධකයක් කොට ගැනීම ඉතා වැදගත් වේ.

සංයුක්ත නිකායේ කෝසල සංයුක්තයේ භාර්යාවක් සතු විය යුතු උතුම් ලක්ෂණ පහක් පෙන්වා දේ. පතිපූජිකා (සිය ස්වාමියා ගරු සරුව පුදන), කුල නන්දනී (නෑයන් සතුටු කරන), ජනරංජනී (ජනයාගේ සිත් සතුටු කරන), ධර්මචාරිණී (සීලා දී ගුණ ධර්මයන්හි හැසිරෙන), වරාංගනා (කාන්තාවන්ට උතුම් වන්නී) යනුවෙන් වරප්‍රසාදයට ලක් වී තිබේ. මෙම උතුම් ලක්ෂණ භාර්යාවක් තුළ එක් එක් වශයෙන් නොව සෑම කරුණක්ම අඩු වැඩි වශයෙන් තම ජීවිතවලට පුරුදු පුහුණු කර ගත යුතුය. ඕනෑම ගෙයක් අලංකාර, ප්‍රිය මනාප, නිවසක් බවට පත් වන්නේ බිරිඳක් නිසාය. ගෙදර දොර කටයුතු මැනවින් පාලනය කරමින් දරුවන් හදා වඩා ගනිමින් බිරිඳක් වශයෙන් උසස් සේවයන් ඇය සලසයි.

"සත්තභරියා" සූත්‍රයෙන් භාර්යාවන්ගේ ලක්ෂණ අනුව කොටස් හතකට වර්ග කර ඇති ආකාරය දැකිය හැකිය. මාතු භරියා (මවක් බඳු බිරිඳ), භගිනි භරියා ( සොහොයුරියක් බඳු බිරිඳ), දාසි භරියා ( දාසියක් බඳුබිරිඳ), සඛී භරියා (මිතුරියක් බඳු බිරිඳ), චෝර භරියා ( සොරෙක් බඳු බිරිඳ), වධක භරියා (වධකයෙක් බඳු බිරිඳ), සාමි භරියා ( ස්වාමියෙක් බඳු බිරිඳ) මොවුන් අතුරින් පළමු හතරදෙනා ශ්‍රේෂ්ඨ උතුම් කොට දක්වා ඇත. ඉතිරි තුන්දෙනා ගර්හාවට ගක් කොට ඇත.

බුදු දහමේ කාන්තාවකට බමුණු මිථ්‍යා සංකල්ප බැහැර කොට උත්තරීතර නිදහසක් ලබා දී ඇත. බුදු දහමට අනුව කාන්තාවට ලැබිය හැකි උත්තරීතරම පදවිය වන්නේ භික්ෂුණී භාවයයි. ශාසන් දායාදයක් ලබමින් සසර දුක් කෙළවර කොට නිවන් පසක් කර ගැනීමට ද ඒ තුළින් ඇයට ඉඩ හසර සැලසුණි. ථෙරී ගාථා තුළින් එය මනාව ස්ඵුට වේ. සෝමා තෙරණියගේ ප්‍රකාශය වන

"ඉත්ථී භාවෝ නො කිං කයිරා - චිත්තම්හි සුසමාහිතො
ඤාණම්හි වත්ත මානම්හි - සම්මා ධම්මං විපස්සිනො"

මෙයින් සඳහන් වන්නේ සිත සමාධි ගත වන්නේ නම්, චතුරාර්ය සත්‍යය අවබෝධ කර ගත හැකි නම්, ආර්ය අෂ්ටාංගික මාර්ගයෙහි ගමන් කිරීමට හැකි නම්, ස්ත්‍රී භාවයේ කිනම් අඩුවක් ද යනුවෙනි. මේ තුළින් වර්තමානයේ කාන්තාවට ලබා දෙන්නේ මහත් වූ පණිවිඩයකි. කාන්තාවගේ අගය ප්‍රකට කරන ලද තවත් අවස්ථාවක් ලෙසින් මාතෘත්වය සඳහන් කළහැක. ඇය මහා බ්‍රහ්මයාට සම කළ අවස්ථාවක් ලෙස ( බ්‍රහ්මාති මාතා පිතරෝ), මව තම නිවසේ මිතුරියක් ලෙස( මාතා මිත්තං සකේ ඝරේ), දෙමාපියන් පෙරදිග දිසාව ලෙස( මාතාපිතා දිසා පුබ්බා), දෙමාපිය උපස්ථානය මංගල කරුණක් ලෙස( මාතා පිතු උපට්ඨානං), මව්පියන්ට නොසළකන්නා පිරිහෙන බව( යෝ මාතරං වා පිතරං වා) යන අවස්ථා තුළින් බමුණු මත බිඳ දමා කාන්තාවන්ට සමාජයේ ගෞරවාන්විතව කටයුතු කිරීමට, බුදු දහම තුළින් උදා කර දුන් බව මනාව ප්‍රකට වෙයි. එසේ ලබා දුන් එම ගෞරවාන්විත බව ආරක්ෂා කර ගැනීමට කටයුතු සලසා ගැනීමට, නැවත උදා වූ මහගු අවස්ථාවක් ලෙස උඳුවප් පොහෝ දිනය හඳුන්වා දිය හැකිය.

**ශාස්ත්‍රපති පානදුරේ උප්පලවණ්ණා දීපනී මෙහෙණින් වහන්සේ**

## රූපයේ යථාර්ථය

අභ්‍යන්තර රූපය වූ ඇසට ගෝචර වන බාහිර වර්ණ රූපය
අභ්‍යන්තර රූපය වූ කණට ගෝචර වන බාහිර ශබ්ද රූපය
අභ්‍යන්තර රූපය වූ නාසයට ගෝචර වන බාහිර ගන්ධ රූපය
අභ්‍යන්තර රූපය වූ දිවට ගෝචර වන බාහිර රස රූපය
අභ්‍යන්තර රූපය වූ කයට ගෝචර වන බාහිර පොට්ඨබ්බ රූපය
අභ්‍යන්තර රූපය වූ මනට ගෝචර වන බාහිර ධම්ම රූපය

මේ අභ්‍යන්තර බාහිර සියලුම රූප අවකාශය භූමිය කරගෙන ව්‍යාප්ත වෙලා තියෙන ශක්ති සමූහයකි. එසේම අභ්‍යන්තර හා බාහිර රූප සම්බන්ධීකරණයෙන් එක්වීමෙන් ඵස්සය වීමෙන් හටගන්නාවූ චක්ඛු විඤ්ඤාන ධාතුව, සෝත විඤ්ඤාන ධාතුව, ඝාණ විඤ්ඤාණ ධාතුව, ජිව්හා විඤ්ඤාණ ධාතුව, කාය විඤ්ඤාන ධාතුව, මනෝ විඤ්ඤාණ ධාතුව අවකාශය භූමිය කරගෙනමයි. මේ බව මසැසින් දකිය නොහැක. සියලුම ශක්තින් අවකාශය භූමිය කරගෙන කේන්ද්‍රය කරගෙන ලක්ෂය කරගෙන හටගන්නා බව ප්‍රකට වන බව අවබෝධ කරගන්නම වෙනවා. ඒ විදර්ශනා අවබෝධ ඤාණයයි. ශක්තීන් ගේ වෙනස්වීම චලනය වේගය නිසා අවකාශය මතින් මතුවන ප්‍රතිබිම්බයක් වශයෙන් ප්‍රකට වන ස්වභාවයට රූපය නම් වූ සම්මුතිය යෙදී ඇත. ප්‍රකටවන හටගන්නා වූ ගොඩගැසෙන ශක්තිවල ඝනකමටයි (ඝණ සංඥාව) රූප කියන්නේ.

ඉන්ද්‍රිය ගෝචර වන ආකාරයට හැඩතල අනුව ජේන මානයට දැනෙන මානයට තමයි නම් ගොත් තබන්නේ. ඒ සම්මුති සත්‍යයි. ඒ ඕලාරික තත්වයයි. මේ ධර්මතාවය සම්මුතිය මිස පරමාර්ථය නොවේ. හේතුව රූප ග්‍රහණය කරගන්නේ ඉන්ද්‍රියන් සම්බන්ධ කරගෙන නිසයි. පරමාර්ථ සත්‍යයේ ප්‍රකෘර්තිය නුවණැසින් දකින්න යථාභූත ඥාණය අවශ්‍යයි. යථාභූත ඥාණය ඇති වෙන්නේ විදර්ශනා ප්‍රඥාවෙන්මයි.

වෙන් වෙන්ව දක්වන ඇස, ඇසේ ප්‍රසාද රූපය, වර්ණ රූපය, චක්ඛු විඤ්ඤාන ධාතුව, නාමධර්ම පහ, පංච උපාදානස්කන්ධය, (බලන සිත) අවකාශය ධාතුව තුළ ප්‍රකෘතිය වසා මතුවන විකෘති ඕලාරික තත්වය විදසුන් නිවණින් විදර්ශනා ප්‍රඥාවෙන් විශ්ලේෂණය කර බලන්න ඕනෑ නැත්නම් නිත්‍ය, සැප, ආත්ම නම් වූ අවිද්‍යා පටලයෙන් ඇත්ත වසාලනවා. ප්‍රකෘතිය දකින්න බැරිවෙනවා. මුලා වෙනවා. අවිද්‍යාවෙන් වසාගත් පසු හිත සංකාර බවට පත්වී කර්ම බවට පත් වෙනවා. මේ ශක්තීන්ගේ ස්වභාවය ගැඹුරෙන් ගැඹුරට විදු ඇසින් බලා පරම අනු ඉක්මවා ගිය ස්වභාවය තැන අනිත්‍ය, දුක්ඛ, අනාත්ම බව විදුමනසට ප්‍රත්‍යක්ෂ වශයෙන් ගෝචර කරගත යුතුය.

ධාතුන්ගේ හෙවත් ශක්තීන්ගේ සුද්ධ ධර්මයන්ගේ පරිවර්තනශීලි බව අතරක් නැතිව නිරන්තර පෙරලෙන බව, වෙනස්වන බව ධම්මට්ඨිතාවයයි. ධම්ම නියාමතාවයි. මෙහි ධම්ම යන්නෙන් අදහස් කරනුයේ හට ගැනීමේ නිරුද්ධවීමත්, නිරුද්ධවීමේ නැතිවීමත් ප්‍රකට කිරීමයි.හටගැනීමේ ශූන්‍යත්වය නිරුද්ධවීමයි.නිරුද්ධවීමේ ශූන්‍යත්වය හටගැනීමයි. ඇතිබවක් නැතිවේ. නැතිබවත් නැතිවේ. අනිත්‍යයි.

මේ ස්වභාවයට පුනර්භව වචනය යෙදී ඇත. පුනර් යනු නැවත යන්නයි. භව යනු පහලවීම හෙවත් හටගැනීමයි. ලෝකධාතුන්හි යම් කිසි සංකත ධර්මතාවයක් වේ නම් ඒ සියල්ල මේ පුනර්භව ධර්මතාවයට යටත්ය.

මේ බව සංයුක්ත නිකායේ පච්චය සූත්‍රයේ උප්පාදාවා තථාගතා නං අනුප්පාදවා තථාගතානං ඨිතා ච සධාතු ධම්මට්ඨිතා ධම්මා නියාමතා ඉධප්පච්චයතා.... යනුවෙන් පැහැදිලි කරති.

15 පිටුවට....

**පූජ්‍ය පණ්ඩිත ගම්පහ සිරිසීවලී හිමි**

# මුනි සිරිපා රැඳි සමනළගිරිය



සොබා දමේ මනහර නිමැවුමක් සේ පවතින සමනොළ ගිරි ශිකරය ශ්‍රී ලංකාවී බොහෝ ප්‍රදේශයලට දර්ශනය වන්නේ අලංකාරවත් සුන්දරත්වයක් මවා පාමිනි.

අනාදිමත් කාලයක සිටම සමන්ක කූටය ලෝක වාසීන්ගේ ආකර්ෂණයට පාත්‍රවූයේ ගෞතම බුදුන්වහන්සේගේ වම් ශ්‍රීපාද ලාංඡනය මේ ගිරි ශිඛරය මත පිහිටුවා ඇතැයි යන විශ්වාසය නිසාය.

බෞද්ධ බැතිමතුන් මෙසේ විශ්වාස කලද හින්දු, කිතුනු, මුස්ලිම් භක්තිකයන් තම තමන්ට අයත් ආගමික කතෘවරුන්ගේ පා සටහන් සමනොළ කඳු මුදුනේ විද්‍යාමාන වෙතියි විශ්වාස කලහ. අදත් සමන්ත කූටය නැගීමේ අරමුණ ඇතිව ශ්‍රී ලංකාව බලා බොහෝ විදේශිකයින් පැමිණෙති.

ශ්‍රී ලංකාවේ මධ්‍යම කඳුකරයේ නිරිත දිග භාගයේ පිහිටි රත්නපුර දිස්ත්‍රිකයේ කුරුවිට කෝරළයේ උතුරු උඩ පත්තුවට අයත් වන භූමිය තුළ පිහිටි මෙහි උස මුහුදු මට්ටමේ සිට මීටර් 2230 කි. පිදුරුතලාගල, කිරිගල්පොත්ත ආදී අනෙකුත් ගිරි ශිඛර හා සසඳනකළ සමනොළ කන්ද උසින් පස්වෙනි තැන ගනී.

අතීත ශ්‍රී ලංකාව රුහුණු, පිහිටි, මායා වශයෙන් කොටස් තුනකට බෙදා තිබියදී සමනොළ කන්ද අයිතිවූයේ රුහුණටය. රුහුණේ ශුද්ධ වූ කන්ද ලෙස සලකා අරාබීහු "අල් රහුන්" යන නම තැබූහ.රුහුණේ පිහිටි නිසාදෝ "රෝහණ පබ්බත" යන නමද ව්‍යවහාරවී තිබේ.

සමනොළ කන්දේ චමත්කාරජනක දර්ශනය දෙගුණ තෙගුණ කරන්නේ ඒ හා සම්බන්ධ කඳු වැටියයි. එම කඳු වැටියේ තැන තැන නිර්මාණය වී ඇති කඳු මුදුන්ද සමනොළ මුදුනසේ කේතු ආකාරයෙන් යුක්ත වේ.

ශ්‍රී ලංකාවේ ප්‍රධාන ගංගා කීපයක්ම ආරම්භවන්නේ සමනොළ කඳු වැටියෙනි. ලංකාවේ දිගම ගඟ වන මහවැලි ගඟ සහ කළු, කැළණි, වළවේ යන අනෙකුත් ගංගාද සමනොළ කඳු වැටියෙන් ආරම්භ වේ.

රිය සකක නාභියේ සිට ගරාදි විහිදෙන්නා සේ සමනොළ වැටියෙන් ඇරඹුන මෙම ගංගාවෝ මුහුදට වැටෙති.

ලක්දිව ඈත පෙදෙස්වලට පමණක් නොව මහ මුහුදටත් සමන්ත කූටය පෙණුනු බව විවිධ ලේඛනයන්හි සඳහන් වේ. නැව්වලින් මුහුදේ යාත්‍රාකරන විට ඈතදීම සමන්ත කූටය දර්ශනය වූ බව රාජාවලියේ සඳහන් වේ.

ශ්‍රී ලංකාව බලා යාත්‍රාකරමින් සිටි නාවිකයන් මේ රටට ගොඩබැසීමට දින විස්සකට පෙර සිටම සසමනොළ කඳු මුදුන දුටු බව "ඉබන් සුර්දදිබේ" නැමති ලේඛකයා සඳහන් කරයි.

ක්‍රි:ව: 1340 දී ශ්‍රී ලංකාවට පැමිණි "ඉබන් බටූකා" මේ රටට ගොඩ බසින්නට දින නවයකට පෙර සිට මුහුදේදී සමන්ගිර දුටු බව ඔහුගේ චාරිකා විස්තරයේ සඳහන් වේ.

බොහෝ නාවිකයන් මේ රටට ගොඩ බැසීම සඳහා නැව් පැදවූයේ සමනොළ කන්ද සළකුණක් ලෙස සලකමිනි.

සමන්ගිර කරා විහිදෙන මංමාවත්

මුනි සිරිපා රැඳි සමනොළ කදු මුදුන කරා ළඟාවිය හැකි මාර්ග කීපයක් වේ. ඒ අතර ප්‍රධාන වන්නේ රත්නපුර පාර, කුරුවිට පාර, දැරණියගල, මාලිබොඩ පාර හා මාරතැන්න පාර යනුවෙන් හඳුන්වන්නේ අවශේෂ අතුරු පාරවල්ය. මේවාද සමනොළ කන්දේදී ප්‍රධාන පාරවල් හා ඒකාබද්ධ වේ. ඉන් අනතුරුව ඒවා සමන්ත කූටයට විහිදෙන්නේ ප්‍රවේශ මාර්ග දෙකක් වශයෙනි.

චූලවංශයේ සඳහන් තොරතුරු වලින් පැවසෙන්නේ පොළොන්නරු සමයේ සිරිපා කඳු මුදුන කරා ගමන් කිරීමට ප්‍රධාන මාර්ග තුනක් තිබුණු බවය. ඒ මාර්ගවල නම් චූලවංශයේ සඳහන් වන්නේ මෙසේය.

1. කදලිගාම මග්ග
2. දුග්ග මඤ්ජස
3. හූව රට්ඨඤ්ජස

මෙහි "කදලිගාම මග්ග"යනු අඹගමුව, උලපනේ, කෙහෙල්ගමුව ආදී ගම් ඔස්සේ විහිදුණු රන්රට පාර හෙවත් වර්ථමානයේ හැටන් පාර ලෙස සැළකිය හැක. "දුග්ග මඤ්ජස" යනුවෙන් හඳුන්වා ඇත්තේ ගිලීමලය, පලාබත්ගල ආදී ගම් ඔස්සේ විහිදී තිබූ වර්තමාන රත්නපුර පාර නමින් හැඳින්වෙන මාර්ගය ලෙස සැලකිය හැක. "හූව රට්ඨඤ්ජස" පාර නම් ඌව පාරය. මෙය මාරතැන්න පාර ලෙස සැලකිය හැක.

අද ජනයා බහුල වශයෙන් භාවිතා කරන්නේ හැටන් පාරය. මෙකල හැටන් පාර යනුවෙන් හැඳින්වෙන ශ්‍රීපාදස්ථානයට ළඟාවිය හැකි මාර්ගය සඳහා ඒ නම ව්‍යවහාර කරන්නේ එය හැටන් නගරයට ආශ්‍රිතව විහිදෙන නිසා විය යුතුය. හැටන් යනු ඉංග්‍රිසි නාමයකි. එය වතු වගාවත් සමඟ බිහිවූ නමකි.

පොළොන්නරු යුගයේ පවා රජරට සිට නුවර ගම්පොළ හා අඹගමුව ඔස්සේ සමන්ගිර කරා මේ මාවත කපා තිබූ බව ඓතිහාසික විස්තර වලින් හෙළිවේ.

හැටන් නගරයේ සිට මස්කෙළියට ගොස් එතැනින් නල්ලතන්නිය දක්වා වාහනයකින් ගොස් එතැන් සිට පාගමනින් සමන්කූටය නගින්නට බැතිමතුන්ට සිදුවේ. මෙම පාර රත්නපුර පාර තරම් දුෂ්කර නැත. පඩි පේළි සිමෙන්තියෙන් බැඳඇති බැවින් ගමන් කිරීමට පහසුය.

ඉදිකටුපාන, සීතගඟුල, මහගිරිදඹය වැනි තැන් ඒ නමින්ම මේ පාරේද තිබේ.

නල්ලතන්නියෙන් පිටත් වු පසුව ස්වාමි මඩම, මකර තොරණ, ගඟුලතැන්නේ ජපන් සාම චෛත්‍යය, සීත ගඟුල හා ගෙත්තම්පානද හමුවේ. ඉන් ඔබ්බට නිශ්ශංක ගුහාවත් ඊට මඳක් ඈතින් පාරේ දිවාගුහාවත් දක්නට ලැබේ. මහගිරිදඹය නඟින්නට සිදුවන්නේ දිවාගුහාව ආසන්නයේ සිටය.

නල්ලතන්නියේ සිට මකර තොරණ තෙක් මාවත විහිදෙන්නේ තේ වත්තක් මැදිනි. මකර තොරණ අසල ගණදෙවි කෝවිලකි. ඉන් ඔබ්බට වන පෙදෙස හිමය යනුවෙන් හදුන්වයි. සමන්දෙවියෝ හිමේට අධිගෘහිත දෙවියෝය. මකර තොරණ අසලට රැස්වෙන වන්දනා කරුවන් පන්සිල් සමාදන්ව සමන් දෙවියන්ට පින් පමුණුවා සමන්ගිර නැග වම් සිරිපතුල වැඳගැනීමට සැදී පැහැදෙති.

**රත්නපුර පාර**

චූලවංශ කතුවරයා දුග්ග මඤ්න්ස යනුවෙන්ද "ඉබ්න් බටූකා" බබා පාර යනුවෙන්ද හදුන්වා දී තිබෙන ශ්‍රී පාද මාර්ගය රත්නපුර මාර්ගය වශයෙන් සැළකිය හැකි බව අපි දැනටමත් පවසා ඇත්තෙමු.

රත්නපුර පාර හැටන් පාරට වඩා දුෂ්කරය. මෙකල මේ පාරෙහි සිරිපා කඳු මුඳුනට නැගෙන්නට පලාබක්ගල රාන් මහා විහාරස්ථානය තෙක්ම වාහනයකින් ගමන් කළ හැකිය. අතීතයේදි මේ පාරෙන් සිරිපා කරුණා කළ අතර පා ගමන ඇරඹුනේ ගිලීමලේදී බව පැරණි අයගෙන් අසන්නට ලැබේ. දැන් ගිලීමලේ පසුකරමින් පලාබක්ගලටම වාහනයකින් ගමන් කළ හැකිය.

පලාබක්ගල පසු කර යන කළ ප්‍රපාතාකාර අඩිපාර හමුවේ. මෙහි රන් මහා විහාරය අසල සල්පිල් පොලක්ද විශාල අම්බලමක්ද වේ. සිරිපා වන්දනාවේ යන කළ සමනොළ අඩවියේ දී ප්‍රථම වරට කළු ගඟ තරණය කරන්නට සිදුවන්නේ මෙහිදීය. සමහර බැතිමත්හු පලාබක්ගලදී කළු ගඟට බැස ස්නානය කොට පඬුරුද ගැට ගසා ගනිති. ඇතැම් අය මෙහිදී සුදු පිරුවටද හැඳ ගනිති.

පලාබක්ගල පතිරාජ පිරිවෙන පිහිටුවා තිබුනේද මේ භූමි භාගය අසලය.පිරිවෙනේ පදනම හෝ වෙනත් නටඹුන් කිසිවක් මෙහි දක්නට නැත.

මෙහි තිබුනේ යැයි කියනු ලබන සෙල්ටැම් කිහිපයක් විහාරස්ථානයට ගෙන වුත් එහි චෛත්‍යාංගනයක් සිටුවා තිබෙනු පෙනේ. පිරිවෙනේ නටඹුන් අතර වු පැලු ගල් සමහරක් පියගැට වලට සවිකර ඇත්තේය. අලංකාර ගල් කුට්ටි පාරේ අද්දර තැනින් තැන දමා තිබෙන අයුරුද දක්නට ලැබේ.

දඹදෙණිය කෝට්ටේ යුග වල මහත්සේ දියුණුවට පත්ව තිබූ පතිරාජ පිරිවෙන මේ වන විට විනාශයට පත්ව ඇත.

පලාබක්ගල කන්ද නැග යන විට පිවිසෙන්නේ ලීනි හෙලටය. තද බෑවුමක්ද ඉතා ගැඹුරු දොරුවක්ද මෙහි පිහිටියේය. මේ ගැඹුරු දෝරුව පත්ලෙන් කළු ගඟ සිහින් දිය දහරාවක් ලෙස ගලා බසී.

දොරුවේ ඉදිරි පස ඇති මහා ගල් බිත්ති වල හැපෙන ශබ්දයේ දෝංකාරය ඇසීමට මෙහිදි වන්දනාකරුවන් ආසාවෙන් රැදෙති. "ලීනි අක්කේ " මහා හඬින් ඔවුහු කෑ ගසති.මේ හඬ තමන් අභියස ඇති පර්වතයේ හැපී දෝංකාර දෙයි. මෙයද බොහෝ දෙනාට විනෝදය ගෙන දෙන්නකි.

ලීනිහෙල නැග තවත් ඉදිරියට යන කළ කටු ඉතුල් කන්ද හමුවේ. එහි දාන ශාලාවක්සද තනවා තිබේ. කටු කිතුලෙහි මදක්ඔබ්බෙහි ගජමන්නෝනාගේ අම්බලම නමින් හැදින්වෙන ගොඩ නැගිල්ලක නටබුන් දැක ගත හැකිය. වනාන්තරය වැසී තිබුන නිසා එහි ස්වාභාවය මැනවින් දැක ගැනීමට අවකාශ ලැබී නැත.

ගජමන්නෝනාගේ අම්බලම පිහිටි ප්‍රදේශය තැනිතලාවකි. මෙතැනින් තව දුරටත් ඉදිරියට කළුකරයයි. කන්ද නැඟ යන කළ හමුවන වැදගත් ස්ථානය වන්නේ සීත ගඟුලයි. එහිද විශාල අම්බලමක්ද සල්පිල්ද පොළක්ද විය. සීත ගඟුලේදී ස්නානය කොට පිරුවට ඇඳ ගෙත්තම් කිරිම චාරිත්‍රයකි. ගෙත්තම් කරන තැන ඉදිකටුපාන නම් වේ. එයින් මදක්දුරින් පිහිටියේ ධර්මරාජ ගලයි.

ධර්ම රත්නගල නමින් හැදින්වෙන තැන රමණීය ස්ථානයකි. මෙහි ගල් පර්වතයේ කපන ලද පියගැට මාලාවක් ඇත්තේය. එහි ඇති පඩි සංඛ්‍යාව සියය ඉක්මවයි. මෙහි එක්තරා කාලයක ධර්ම රාජ නැමැති ආරච්චිගේ උදවු ඇතිව මේ පියගැට පෙල තැනවු බවත් සෙල්ලිපියේ සඳහන්වේ.

"කසාවතුනම් බමුණු ගම ගිරිමහලා නම් භ්‍රහ්මණ වංශයේ උපන් සර්වඥ ශ්‍රීපති භක්ත ධර්මරාජ තාපසයන් බුදුබව පතා වෙදවනප්පෙරුමාලා නම් වු කඩක්කා ආරච්චිගේ සහයෙන් කෙටවු පියගැට මාලාවයි. "

සෙල්ලිපිය සමඟ තාපස තුමාගේ රුවද කොටා තිබේ. පර්වතයෙහි තවුස් දම් පුරමින් විසු මේ ධර්මරාජ තාපස තුමා කහවත්තේ කෙනෙකු බවද , එතුමා වෙදවනප්පෙරුමාල් නැමැත්තේකුගේ ආධාරයෙන් මේ පියගැට පෙළ කැප්පූ බවද මේ ශිලා ලේඛණයේ සඳහන්ය. ලිපිය ලියා ඇති අක්‍ෂරවල ස්වරූපයෙන් පෙනෙන්නේ එය කොට්ටේ යුගයට අයත් වන බවය.

15 පිටුවෙන්...

**ආචාර්ය ඊ.ඇම්. රත්නපාල මහතාගේ කෘතියක් ඇසුරෙන්**
**පිටපත රචනා කළේ ලලිත හෙට්ටිආරච්චි**

# ලක්දිව බුද්ධ ප්‍රතිමා කලාවේ ව්‍යාප්තිය





ප්‍රතිමා නෙලීමේ ආරම්භය ග්‍රීක යුගයට අයත්වෙන බව විචාරකයින්ගේ මතයයි. දෙවිවරුන් උදෙසා මෙම ග්‍රීක ප්‍රතිමා නිර්මාණය සිදුකර තිබේ. බුද්ධ ප්‍රතිමාවන් නිර්මාණය ඉන්දියාවේ මථුරා ප්‍රදේශයෙන් සිදුවී යැයි පිළිගත් අදහසකි. මුල් කාලයේදී බුදුරජාණන් වහන්සේ වෙනුවට ශ්‍රී පාදය, ධර්ම චක්‍රය, බෝධිය, බුද්ධසාසනය වැනි සංකේතයන් යොදාගෙන තිබෙනු දක්නට ලැබේ. කණිෂ්ක රජ දවස නිර්මාණය වූ කාසිවල බුදුරජාණන් වහන්සේගේ රූපය ඇතුලත් කර තිබූ බව එම යුගයෙන් හමුවූ කාසිවල සඳහන් වෙයි. බුදුරජාණන් වහන්සේගේ කරුණාව, ප්‍රඥාව යන ශ්‍රේෂ්ඨ ගුණයන් ඉදිරිපත් වන සේ ප්‍රතිමාවක් ආන්ද්‍රා ප්‍රදේශයෙන් හමුවී ඇත.

දෙවන පෑතිස් රජ දවස සංඝමිත්තා රහත් තෙරණින් වහන්සේ සමඟ ශ්‍රී ලංකාවට පැමිණි කුලයන් අතරින් නිර්මාණශීලී පුද්ගලයන්ද සිටි බව සඳහන් වේ. දහඅට කුලයන් ගැන එහි දක්වේ. එම පුද්ගලයන්ගේ මැදිහත් වීමෙන් භාරතීය කලා සම්ප්‍රදායන් මෙරට ආරම්භ වී යැයි ඉතිහාසඥයින්ගේ අදහසයි. ඒ අනුව දෙවනපෑතිස් රජ දවස බෞද්ධ සංස්කෘතික කලා නිර්මාණයන් ඇතිවූ බව පිළිගත් අදහසකි. අනුරාධපුරයේ රජකළ දෙටුතිස් රජතුමා රනින් බුද්ධ ප්‍රතිමාවක් නෙලා පාචීන පබ්බත නම් විහාරයේ තැන්පත් කර පුද පූජා පැවැත්වූ බව වංශකථාවන්හි සඳහන් වෙයි. දුටුගැමුණු මහ රජතුමා ලක්දිව එක්සේසත් කොට රනින් ප්‍රතිමාවක් සාදවා විහාරයෙහි තැන්පත් කළ බව මහාවංශයෙහි සඳහන් වෙයි. රුවන්වැලි සෑය අභ්‍යන්තරයෙහිද රනින් බුද්ධ ප්‍රතිමාවක් තැන්පත් කළ බව ථූපවංශ කථාවේ දැක්වේ. උත්තිය රජතුමා මිහිඳු මහ රහතන් වහන්සේ වෙනුවට ප්‍රතිමාවක් නෙලූ බවක් ගැන තොරතුරු දැක්වේ.

අනුරාධපුර යුගයේ මුල්කාලයේම බුද්ධ ප්‍රතිමාවන් නෙලීම ආරම්භවීමත ඒ යුගයේදී ව්‍යාප්තියත් සිදුවූ බව ඉතිහාසගත තොරතුරු වලින් පැහැදිලි වේ. ප්‍රතිමා නෙලීම සඳහා නිර්මාණකරුවන් විවිධ දෑ යොදාගෙන තිබේ. රත්රන්, ස්වභාවිකව පිහිටි කලුගල් පර්වත, මැටි වර්ග, බදාම වර්ග, ලෝහ වර්ග, කිරිගරුඬ පාෂාණ, ගඩොල්, කලුගල් යන ද්‍රව්‍ය වේ. ශේෂ වී ඇති නටඹුන් ද මෙම තොරතුරු සත්‍ය බවට තහවුරු කරයි. බුද්ධ ප්‍රතිමාවන් නෙලීමේදී ලාංකික කලාකරුවා ඉරියව් කිහිපයක් භාවිතා කර තිබේ. ධර්ම චක්‍ර මුද්‍රාව, අභය මුද්‍රාව, ධ්‍යාන මුද්‍රාව, භූමි ස්පර්ශක මුද්‍රාව, පරදුක්ඛ මුද්‍රාව, මේ අතර වැදගත්වේ.

බුදුරජාණන් වහන්සේ දහම් දෙසන ආකාරය ධර්ම චක්‍ර මුද්‍රාවෙන් පෙන්නුම් කරයි. මාලිගාවිල බුද්ධ ප්‍රතිමාව එබඳු නිර්මාණයකි. බුද්ධ ප්‍රතිමාවේ දකුණු අත ඉදිරියට දැක්වීම අභය මුද්‍රාවේ ලක්ෂණයයි. අඩවන් දෙනෙත් බිමට යොමුකරන දෑත එකට තබාගෙන බද්ධ පර්යන්තයෙන් වැඩ සිටීම, ධ්‍යාන මුද්‍රාවයි. මහමෙවුනා සමාධි ප්‍රතිමාව සහ තොලුවිල බුද්ධ ප්‍රතිමාව ධ්‍යාන මුද්‍රාවෙන් නෙලා ඇත. බුදුරජාණන් වහන්සේ දස පෙරුම්දම් පුරා බුදුවූ බව මිහිකත ශාක්ෂි දැරීමත් භූමි ස්පර්ශ මුද්‍රාවෙන් පෙන්නුම් කරයි. ථූපාරාමය අසලින් එබඳු ප්‍රතිමාවක් ලැබූ බවට සාධක තිබේ. පොළොන්නරුව ගල් විහාරයේ ඇති හිටි පිළිමය පරදුක්ඛ මුද්‍රාවෙන් නෙලා ඇත. නිර්මාණය කර ඇති ප්‍රතිමාවන් වර්ග තුනක් වේ. හිටි පිළිමය, ඉඳි පිළිමය (වැඩ සිටින), සැතපෙන පිළිම යනුවෙනි. හිටි පිළිමය කොටස් දෙකකට බෙදේ. බද්ධ ප්‍රතිමා සහ බද්ද නොවූ ප්‍රතිමා වශයෙනි. මහඉලුක්පල්ලමෙන් හමුවූ ප්‍රතිමාවත්, මාලිගාවිල භූමියෙන් හමුවූ ප්‍රතිමාවත් බද්ද නොවූ ප්‍රතිමාවන්ය.



මෙම ප්‍රතිමාවන් නෙළුම් මලක් මත වැඩ සිටින සේ නිර්මාණය කර තිබේ. මාලිගාවිල හිටි පිළිමය උස අඩි 34කි. උරහිස් පළල අඩි 10ක් වේ. බද්ද ප්‍රතිමාවන් නෙලා ඇත්තේ ප්‍රතිමාවට ආධාරකයක් ලැබෙන සේය. ප්‍රතිමාවට පිටු පසින් ගල් පර්වතයක් (පිහිටි) මේ සඳහා යොදාගෙන තිබේ. ධාතුසේන රජතුමා විසින් කලාවල බැම්ම අද්දර නිමවන ලද අවුකන ප්‍රතිමාව එසේ නිර්මාණය වූවකි. නෙළුම් මලක් මත වැඩ සිටින ආකාරයට මෙම ප්‍රතිමාව නෙලා ඇත. උස අඩි 42කි. අව්වැසි වලින් ප්‍රතිමාව ආරක්ෂා කිරීම සඳහා ප්‍රතිමාවට ඉහලින් පියස්සක් සවිකර තිබූ බවට නිදසුන් තිබේ.

කසාගල, සැස්සේරුව බුදුරුවගල, දෝව යන ස්ථානවල බද්ද ප්‍රතිමාවන් දැකගත හැකිය. මෙම ප්‍රතිමාවන් නෙලීමේදී කලාකරුවාගේ දක්ෂතාවය මනාකොට පෙන්නුම් කර තිබේ. පෙරවා ඇති චීවරය ශරීරයට මැනවින් සම්බන්ධ කර නෙලා ඇත. ක්‍රි.ව 5 වන සියවසෙන් මෙපිට බෝධිසත්ව සංකල්පය තදින් බලපෑ බවට එකල නිර්මාණය වූ ප්‍රතිමාවලින් පෙනේ. බුදුරුවගල, රැස්වෙහෙර, කුෂ්ඨරාජගල, යන ස්ථාන වලින් හමුවී ඇති ප්‍රතිමාවන් දැක්විය හැකිය. දප්පුල රජතුමා රියන් 15ක් උසැති බෝධිසත්ව ප්‍රතිමාවක් නෙලූ බව චූලවංශය කියයි. I වන පරාක්‍රමබාහු රජතුමා ද බෝධිසත්ව ප්‍රතිමා තුනක් නිර්මාණය කළ බව වංශකථාවල සඳහන් වෙයි.

වැඩි වශයෙන් හමුවී ඇත්තේ ථේරවාද සම්ප්‍රදායට අයත් බුද්ධ ප්‍රතිමාවන්ය. අනුරාධපුර ථූපාරාමය අසලින් අඟල් 18ක් උසැති ලෝහ වලින් නිමවූ බුද්ධ ප්‍රතිමාවක් හමුවී තිබේ. වරද මුද්‍රාව හා විතර්ක මුද්‍රාව යන ක්‍රම දෙකට මෙම ප්‍රතිමාව නෙලා ඇතිබව දක්නට ලැබේ. බුද්ධ ප්‍රතිමාවන් නෙලීමෙන් කලාකරුවා අපේක්ෂා කර ඇත්තේ බුද්ධ ශරීරය මනසෙහි මෙනෙහිකර ගැනීම සඳහා යැයි මතයක් පවතී. ජනයාගේ හදවත් තුළ බුද්ධාලම්භන ප්‍රීතිය උපදවාගෙන එමගින් කුසල සිත වර්ධනය කර ගැනීම මෙම ප්‍රතිමාවන් නෙලීමෙන් සිදුවෙන බව පැවසිය හැකිය. නිදසුනක් ලෙස දැක්වීමට ඉන්දීය හිටපු අගමැති ශ්‍රී නේරුතුමා සමාධි ප්‍රතිමාව දැක පැහැදී සමාධිගත වූ බව සඳහන් වේ. බුද්ධරූප නෙලීම මගින් හෙළ බෞද්ධ කලා නිර්මාණය දියුණුවට පත්වූ බව මෙහිලා සඳහන් කළ හැකිය.

**අජන්තා දිසානායක**

# මේ ආත්මයේදී නිර්වාණාවබෝධය ලබා ගත හැකිද?



මිනිස් වර්ගයාට සිතීමේ විමසීමේ නිදහස ලබා දුන් ශාස්තෘවරයා ලෙස බුදුරජාණන් වහන්සේට හිමිවන්නේ විශේෂ ස්ථානයකි. මෙයට නිදසුනක් වශයෙන් කාලාම සූත්‍ර දේශනාව හැඳින්විය හැක. ප්‍රඥාවට ප්‍රධාන තැනක් බුදු දහම ලබා දී තිබේ. ඒ බව මෙසේ සඳහන් වේ. ඒ අනුව බුදු දහම මිනිසාගේ විමර්ශණයට භාජනය විය.

"පඤ්ඤවනතසසායං ධමෙමා නායං දුපපඤ්ඤසස'' ප්‍රඥාවන්තයන්ට යොමු වූ දහමක් ලෙසය සඳහන් වන්නේ, ඒ අනුව බුදු දහම මිනිසාගේ විමර්ෂණයට භාජනය විය.

මිනිස් වර්ගයාට නිර්වාණ අවබෝධය ලබාගත හැකි ක්‍රම තුනක් ගැන සඳහන් වේ. බුදුවීම, පසේ බුදු වීම, රහත් වීම යනුවෙන් මෙය දක්වා තිබේ. ''මහා චක්කවත්ති සීහනාද සූත්‍රයෙන්, අරිය පරියේෂණ සූත්‍රයෙහිද " සම්මා සම්බුද්ධය පිළිබඳ තොරතුරු සඳහන් වෙයි. බුදුබව ලබාගැනීමට අනිවාර්යයෙන්ම පාරමී ධර්මයන් පිරිය යුතු බව දක්වා තිබේ. ජාතක පොත ඇසුරෙන් ඒ බව පැහැදිලි වෙයි. දීර්ඝ කාලයක් මේ සඳහා නිරත විය යුතු බව පෙන්නුම් කෙරේ. සසරදී රැස්කල කුසල් බලපාන බවද විස්තර වේ. නිවන් අවබෝධය ලබාගැනීමේදී ස්ත්‍රී, පුරුෂ භේදයක් බලනොපාන බව බුදු දහමෙහි දැක්වේ. පටාචාරා,රජ්ජුමාලා,කිසාගෞතමිය යන චරිත සඳහන් කල හැකිය.නිවන් අවබෝධකර ගැනීමට පෙරමුණ ගත් මහාප්‍රජාපතී ගෝතමිය ඒ සඳහා අනෙකුත් කුල කාන්තාවන්ගේ සහාය ලබා ගත්තාය. ඛේමා, නන්දා යන රාජකීය පවුල්වල කාන්තාවන්ද යසෝදරා දේවියද මේ අතර විය. පැවිදි වෙස්ගෙන බුදුරජාණන් වහන්සේ වෙතට ගිය කාන්තාවන් ඉල්ලා සිටියේ පැවිදිවීමට අවසර දෙන ලෙසයි. මෙම ඉල්ලීම ප්‍රතික්ෂේප කල බුදුරජාණන් වහන්සේ නිහඬ වූ සේක. තෙවරනවර කරන ලද ඉල්ලීම පිළිගෙන අෂ්ඨ ගරුධර්ම පිළිපැදීමෙන් මහණ උපසම්පදාව සිදුවෙන බව කාන්තා පිරිසට දේශනාකල සේක. කාන්තා විමුක්තිය උදා වූ මෙම උතුම් සිදුවීම උඳුවප් පොහෝ දිනක ආරම්භවීම ශාසන ඉතිහාසයෙහි සඳහන් වෙයි.

ඉන්දියාවේ අධිරාජ්‍යයක් බවට පත් වූ ධර්මාශෝක රජතුමා බුදුදහම වැළඳ ගැනීමෙන් පසු තම පුත් මිහිඳු මහරහතන් වහන්සේ මගින් බුදුදහම ව්‍යාප්ත කිරීමට ක්‍රියා කළේය. තෙවන ධර්ම සංගායනාවේ දායකත්වය භාරගත් රජතුමා රටවල් නවයකට ධර්මදූත සේවාව සිදු කළේය. ලංකාද්වීපයට වැඩම කල මිහිදු මහරහතන් වහන්සේ පළමු වරට භික්ෂු ශාසනය ආරම්භ කළහ. වැඩි කාලයක් ගත වීමට පෙර විවිධ ප්‍රදේශ වලට බුදු දහම ව්‍යාපත් වූයේ භික්ෂු ශාසනයේ ව්‍යාප්තියත් සමඟය. මේ සඳහා දෙවනපෑතිස් රජුගේ අනුග්‍රහය ලැබුණි. බොහෝ භික්ෂු පිරිසක් බණ, භාවනා කරමින් නිවන් අවබෝධය ලබා ගන්නා පුරුෂ පක්ෂයට නිවන් අවබෝධය ලබා ගැනීමට පැවිද්ද මහෝපකාරී විය. ගිහි ගෙයින් වෙන්වී ආරාම රැක් සෙවණ වැනි ජනශූන්‍ය සෙනසුන්වල වාසය කරමින් තම මූලික අරමුණ වූ නිවන් අවබෝධය ලබා ගත්හ. භික්ෂූන් වහන්සේලා දහස් ගණනක් නිවන් දුටු බව ශාසනා වංශකතාවේ සඳහන් වෙයි. සංසාරික පුන්‍ය මහිමය මේ සඳහා බලපාන බව ඇතැම් භික්ෂූන්ගේ චරිත වලින් පැහැදිලි වෙයි. කොපමණ උත්සාහ දැරුවත් නිවන් අවබෝධය ලබාගැනීමට නොහැකි වූ භික්ෂූන් වහන්සේලා ගැන තොරතුරු සඳහන් වෙයි. ගිහි ගෙයින් වෙන්වීම, මේ සඳහා අවශ්‍යබව, පෙනී යන්නේ ''සමෙබාධායං ඝරාවා සො'' යන බුදු වදනින් ගිහිගෙයි ඇති විවිධ ගැටළු නිසා විමුක්ති මාර්ගයට (නිවන් මඟට) ලඟාවිය නොහැකි බවයි. යම් ගිහි පිංවතෙකු රහත්වූයේ නම් ගිහි බව වෙනස්ව පැවිදිවිය යුතුමය.

එසේ නොවුනහොත් සත් දිනකින් ජීවිතයෙන් සමුගන්නා බව සඳහන් වෙයි. මෙයින් පෙනී යන්නේ රහත්වීම රත්වීම ගිහි කල සිදුකල නොහැකි බවයි. රුවන්වැලි මහා දාගැබේ, ආගමික උත්සවයකට ලංකා විවිධ ප්‍රදේශවලින්, රහතන් වහන්සේලා දහස් ගණනින් සහභාගී වී ඇති බවයි. මෙම තොරතුරු ථූපවංශය, මහාවංශ යන වැනි ඓතිහාසික, ග්‍රන්ථවල සඳහන් වී තිබේ. (මහාවංශ පරිච්ඡේද) ඓතිහාසික, ශාසනික තොරතුරු අනුව අනුරාධපුර යුගයේ සිට පොළොන්නරු අවසානය දක්වා රහතන් වහන්සේලා ගැන දීර්ඝ විස්තර සඳහන් වෙති. එකල විසූ රජවරුන් රහතන් වහන්සේලා වෙනුවෙන් සාදන ලද ආරාම සහ ගල්ගුහා තොරතුරු සෙල්ලිපි වලින් හෙළිවේ.

ලංකාවේ අවසාන රහතන්වහන්සේ ලෙස සඳහන් වන්නේ කුරුණෑගල රජසමයේ වැඩ විසූ මලියදේව මහරහතන් වහන්සේය."වට්ටාරම්'' විහාරයේ වර්තමානයේ දක්නට ලැබෙන පුරාණ නටබුන් මගින් පැහැදිලි වෙයි. මෙම තොරතුරු වලින් පසුව ලංකාවේ කිසිම ප්‍රදේශයකින් රහතන් වහන්සේලා ගැන සඳහන් නොවේ. යම් භික්ෂුවක් හෝ ගිහි කෙනෙකු රහත් වූයේ නම් ඒ බව ප්‍රකාශ කිරීමක් සිදුනොවේ. රහත්බවේ ලක්ෂණයක් ලෙසින් එය සැලකේ.

පෙර කරන ලද කුසල් හේතුවෙන් රහත් බව ලැබෙන බවට බුදු දහමෙහි සඳහන් වන උදාහරණය වන්නේ " නාගිත තෙරුන්ගේ " විස්තරයි. " නාභිජානාමි දුගගතිං" දුගතිගාමී නොවී සුගතිගාමීයෙහි ඉපිද අවසාන ආත්මයේදී රහත්භාවය ලැබූ බව නාගික තෙරුන්ගේ චරිතාපදානෙන් පෙන්වාදී තිබේ. "ධම්මික උපාසක" තොරතුරු වලින් පෙනී යන්නේ කුසල විපාක මෙලොවදීම ලබාගත හැකි බවයි.

"පඤ්චානංතරියං'' පාපකර්මයන් සිදුකල අයට නිවන් දැකිය නොහැකි බවත් බුදු දහමෙහි සඳහන් වෙයි. 'තණහක්ඛයො නිබබාණං' සිතෙහි ඇතිවෙන තෘෂ්ණාව සම්පූර්ණයෙන් නැති කිරීමෙන් නිවන් අවබෝධය ලැබිය හැකි බව බුදුදහම අනුව සඳහන් කල හැකිය. "පඤ්ඤා වන්ත සසායං ධමෙමා නායං ධමෙමා දුපපඤ්ඤවසස" බුදුදහම ප්‍රඥාවන්තයින්ට පමණක් ගම්‍යවන බවයි. "ධමමං සුචරිතං චරෙ" ධර්මයෙහි හැසිරීම නිවන් අවබෝධය පහසුකරවන්නක් බවත් පෙන්වා දෙන බුදුදහම දුස්චරිතයෙන් වෙන්වී සිටිය යුතු බව " නිනං දුචෙරිතචාරි" යන්නෙන් පෙන්වා දී තිබේ. ඇතැම් පුද්ගලයින් දුෂ්චරිතවත්ව නිර්මාණගාමීත්වයට පත් වූ බවට වහසි බස් දොඩවති. මෙලොවදීම (ගෞතම සම්බුද්ධ ශාසනයෙහි) නිවන් අවවෝධය ලැබිය නොහැකියයි කිසිවකුටත් පැවසිය නොහැකිය.

"නිවන තිබෙන්නේ ,කොතැනකදැයි ,එක් අවස්ථාවක මානවකයෙකු බුදුරජාණන් වහන්සේගෙන් විමසූ විට පිළිතුර වූයේ "භයාමමනෙත කලෙබරෙ" බඹයක් වූ මෙම සිරුරෙහි නිවණ

15 පිටුවට....

විජේවර්ධන තලවත්තේගෙදර



# ලොවක් සැනසූ
# බුදු ගුණ මහිමය

"බුද්ධෝපි බුදධසස භණෙය්‍ය වණ්ණං
කප්පම්හි චෙ අඤ්ඤඤ මහාස මනෝ
කීයෙථ කපෙපා වීරදිස වත්‍යතරෙ
වපේජත නකීයෙථ තනාගතසස"

බුදුරජාණන් වහන්සේගේ ශ්‍රේෂ්ඨ චරිතය පිළිබඳව පැරණි පඬිවරුන් ලියා පල කළ ග්‍රන්ථ වල උන්වහන්සේගේ ලෞකිකවුත් ලෝකෝත්තර වුත්, ජිවිත ප්‍රවෘත්තින් මහත් උත්කර්ශයෙන් වර්ණනා කොට ඇත. ලෝකයේ යම්පුද්ගලයෙකු පිළිබඳ ලිය යුතු ලිය හැකි සෑම ගුණ ධර්මයකින්ම පරිපූර්ණ බුද්ධ චරිතය කෙනෙකුට වර්ණනා කළ හැක්කකි.

බුදුවරයෙකුගේ ගුණ වර්ණනා කළහැක්කේ එබඳුම බුදුවරයෙකු විසිනි. සෙසු කිසිම පුද්ගලයෙකුට බුද්ධ ගුණය වර්ණනා කළ නොහැක. කපක් මුළුල්ලේහි බුදුගුණ කියන්නට සිතන කෙනෙකුට ඒ කප මුළුල්ලේම කියා නිම කරලිමට කිසිසේත් කළ නොහැක. කල්පය අවසන් වේ. බුදුගුණ අවසන් නොවේ.

"බුද්ධෝපි බුදධසස භණෙය්‍ය වණ්ණං
කප්පම්හි වෙ අඤ්ඤඤ මහාස මනෝ
කීයෙථ කාපපා වීරදිස වත්‍යතරෙ
වපේජත නකීයෙථ තනාගතසස"

යන්නෙන් එය පවසති. දෙවි මිනිස් මිනිසුන් බඹුන් ආදීන් විසින් බුදුගුණ කීම ආශ්චර්යයක් නොවේ. අප්‍රාණික වු මහා භූත වස්තූන් පවා බුද්ධ බලය කාරනා කොට ගෙන මහත් හර්ෂයෙන් යුක්ත

01.වෙස්සන්තර රජතුමන් යමක ඉල්ලු යම් හැම දෙයක්ම පරිත්‍යාග කරන්නෙමියි" අධිෂ්ඨාන කළ අවස්ථාවේදී ප්‍රථම භූමිකම්පාව සිදුවිය.
02. කලිඟු රටින් පැමිණි බමුණන් අට දෙනා පාණ්ඩව නම් හස්තිරාජයා දන් දුන් අවස්ථාවේ පොළොව ගුගුරා ගියේය.
03.සත්තසතික මහා දානය දුන් අවස්ථාවේ තුන්වන භූමි කම්පාව ඇතිවිය.
04. වෙස්සන්තර බිසව හා දරුවන් දෙදෙනා සමඟ හිම වතට ගිය අවස්ථාවේදී සතර වන භූමි කම්පාව ඇති විය.
05.දරුවන් දෙදෙනා දන් දුන් අවස්ථාවේදි පස්වන භූමි කම්පාව ඇති විය.
06.වෙස්සන්තර බිසව බමුණාට දන් දුන් අවස්ථාවේදී සයවන භූමි කම්පාව ඇති විය.

දරුවන් දෙදෙනා බමුණා අතින් මුදවාගෙන සඳ මහරජතුමාට දොළොස් අක්ෂෞහිණියක් සෙනඟ සමග හිමාලයට ගොස් වුසති දේවිය, වෙස්සන්තර රජු, ජාලිය, ක්‍රිෂ්ණජිනා යන මොවුන් සමඟ සතුටු කඳුළු වගුරුවමින් සිටි අවස්ථාවේ සත්වන භූමිකම්පාව විය.

බෝ මැඩදී ප්‍රතීත්‍ය සමුක්ෂා ධර්‍මය සමරන අවස්ථාවේදී දසදහසක් සක්වල මහපොළොවදොළොස් දොළොස් වාරය බැගින් මෙසේ එක්ලක්ෂ විදි දහසක් වාරයෙහි මහී ගර්ජන නම් පූජාවක් විය. ධම්ම චක්ක පවත්වන සූත්‍ර දේසනාව අවසාන වු අවස්ථාවේ සකළිස් යොදුන් ඝණකඩ මහ පොළොව කම්පිත විය. ධම්ම චක්ක පවත්වන සූත්‍රය අවසාන වු අවස්ථාවේ සතළිස් යොදුන් ඝණකඩ මහපොළොව කම්පිත විය. බිම්බිසාර රජු වේළුවනාරාමය බුද්ධ ප්‍රමුඛ මහා සංඝයාට පූජා කළ අවස්ථාව, මච්ඡිකාසණ්ඩ නම් නුවර චිත්‍ර නම් සිටාණන් මහානාම මහා ස්ථවීරයන්ට අම්බාටක උයන පූජා කිරිම හා ලක්දිව මහමෙව්නා උයන මහා සඟනට පූජා කළ අවස්ථාව යන තුන් තැන්හිදි පොළොව කම්පා විය.

මහා ප්‍රජාපතී රහත් මෙහෙණින් වහන්සේ පිරිනිවන් පාන්නට සිතූ අවස්ථාව, පිරිනිවන් පෑම තුන් අවස්ථාවේදි ද පොළොව කම්පා විය. යශෝදරා මෙහෙණිය පිරිණිවන් පෑමට සිතූ අවස්ථාවේදි ද පොළොව කම්පා විය. බෝසතුන් කුසී දෙව්ලොවින් බැස මහාමායා දේවිය කුස පිළිසිඳ ගැනිම, බිහිවිම, බුදුවිම යන අවස්ථා වලද මහී ගර්ජනා ඇතිවිය. බුදුරදුන් ආයුසංස්කාරය හැරි, පිරිණිවන් පෑම යන අවස්ථාවේදී දස දහසක් පොළොව එක්ලක්ෂ විසිදහස් වාරයක් කම්පිත විය. මෙකී බුද්ධ බල මහිමය කරණ කොට ගෙන ඇති වු පෘථිවි කම්පා සියළු බුදුවරුන්ට සාධාරණ ධර්මයන්ම වේ. (පොත පත ඇසුරිනි)

**නිලූකා සේනාරත්න**

# පරාජය තුළින් ජයග්‍රහණය ලබන්නට නම්....

එදා මෙන් අදත් සමාජයේ කථාබහට ලක්වෙන කරුණක් වන්නේ ජය පරාජය පිළිබඳ කථාවයි. එම කරුණ පිළිබඳ අවශ්‍ය තොරතුරු බිඳක් ඉදිරිපත් කිරීම මෙම ලිපියේ අරමුණ බව පළමුවෙන්ම සඳහන් කිරීම උචිත වන්නේය. ජය පරාජය ගැන වටිනා උපදෙස් හා අදහස් බුද්ධ චරිතයෙන් හා බෝධිසත්ව චරිතයන්ගෙන්ද අපට දැකිය හැකිය.

බුදුබව ලබා ගැනීම සඳහා බෝමැඩ අසලදී දස මරුන් පැරදවූ බව එහි සඳහන් වෙයි. එම දසමාර ජයග්‍රහණයෙන් පසුව බුදුබව ලබාගත් බවයි වැඩිදුරටත් සඳහන් වන්නේ. තම සිතේ ඇතිවූ කෙලෙස් මරුන් පැරදවූ බවයි එම විස්තරයෙහි දැක්වෙන්නේ. එම මාර පරාජය සඳහා බෝසතාණන් වහන්සේ අධිෂ්ඨානයෙන් හා වීර්යයෙන් ක්‍රියාකළ ආකාරයත් එහි විස්තර වේ. බෝධිසත්ව කාලයේදී වෙළඳ කුලයක නායකයෙකු ලෙස ඉපදුනු ආත්මයකදී ගැල් වලින් වෙළඳාමේ යෙදුණු අතරමගදී මුහුණපෑමට සිදුවූ අනතුරෙන් තම පිරිස බේරාගත්තේද වීර්යයෙන් හා උත්සාහයෙන්, අධිෂ්ඨානයෙන් ක්‍රියාකළ නිසාය.

එසේ නොවුයේ නම් එම ජීවිත විනාශයට පත්වෙන්නට ඉඩ තිබුණි. මෙවැනි තොරතුරු වලින් පෙනී යන්නේ යම් පරාජයක් පසුබෑමක් වළක්වා ගැනීමට අධිෂ්ඨානය හා වීර්ය අවශ්‍ය වන බවයි. නායකත්වය සතු යුතුකම් මැනවින් තේරුම් ගෙන ඒවා ඉටුවෙන අයුරින් ක්‍රියාකිරීම ජයග්‍රහණයේ මාවතයි. ක්‍රීඩාවකදී වුවත් කණ්ඩායම් නායකයාගේ ක්‍රියාකලාපය අනුවයි එම කණ්ඩායම ජයග්‍රහණය කරණු ලබන්නේ.

යම් කණ්ඩායමක ජයග්‍රහණයක් ලබාගැනීමට නම් එම කණ්ඩායමේ ඇති අඩුපාඩු සකස් කරගනිමින් ඉදිරියට ගමන් කළ යුතුය. තරගයකදී ජය මෙන්ම පරාජයද සිදුවිය හැකිය. ජය මෙන්ම පරාජය යන දෙකේදීම ඉවසා දරා ගැනීමේ හැකියාව එම නායකත්වයට තිබිය යුතුය. අධ්‍යාපනය හදාරණ දරුවන් පෙනී සිටින විභාගයන් ගැනද දෙමවුපියන් දරණ මතය වන්නේ අනිවාර්යෙන්ම විභාගයෙන් තම දරුවා සමත් විය යුතුය යන ආකල්පයයි. සැබැවින්ම විභාගයකට පෙනී සිටින සියලුම දෙනා සමත් වේවි යැයි සිතීම පවා අනුවණකමකි. එය තීරණය වන්නේ දරුවාගේ උත්සාහය හා අධිෂ්ඨානය මතය.

අධ්‍යාපනය හදාරණ දරුවෙකු යම් විභාගයකින් අසමත්වූ විට එයට එරෙහිව දෙමවුපියන් බැන වැදීම, තාඩන පීඩන ඇති කිරීම අද සමාජයේ දක්නට ලැබෙන්නකි. එසේ කිරීම බලවත් වරදකි. එය දරුවාගේ ඉච්ඡාභංගත්වයට එය තදින්ම හේතුවන්නකි.

දෙමව්පියන්ගේ තාඩන පීඩන ඉවසාගත නොහැකි වූ දරුවන් ජීවිත අසාර්ථකත්වයට පත් කරගත් අවස්ථාවන් නැත්තේද නොවේ. දෙමව්පියන්ගේ යුතුකම හා වගකීම වන්නේ විභාගයෙන් තම දරුවා අසමත්වුවහොත් (පරාජයට පත් වුනොත්) නැවත වරක් උත්සාහවන්තව එම දරුවාට අධිෂ්ඨානශීලිව කටයුතු කිරීමට ස්නේහයෙන් උපදෙස් ලබාදීමය.

එවිට එම විභාගයෙන් සමත්වීමට දරුවාට ශක්තිය ඇතිවේ. ජීවිතයේ යම් බලාපොරොත්තුවක් ඇතිවෙන පරිදි ක්‍රියාකිරීම දෙමව්පිය හා ගුරුවරුන්ගේ වගකීම වන්නේය. නිදසුනක් ලෙස මෙසේ ඉදිරිපත් කළ හැකිය. ලංකාවේ රජකළ වළගම්බා රජතුමා ස්වාභාවික විපත් වලදීද (රතැසි උවදුර - සාගතය) මුහුණ දුන් රජ කෙනෙකි.

සතුරු විපත් වලදී එතුමා තාවකාලික පසුබෑමක් සිදුකොට මනාකොට යලි සැලසුම් සහගතව සංවිධානය වී සතුරන් පරාජය කළ බව ඉතිහාසගත තොරතුරු වලින්ද පැහැදිළි වෙයි. ජාතියට හා ආගමට විශාල සේවාවක් සිදුකිරීමට එතුමාට අවස්ථාව ලැබුණි. ඒ සඳහා නොපසුබස්නා උත්සාහයත් අධිෂ්ඨානයත් හේතුවිය. වර්තමානයේ පවතින විවිධ සංවිධාන දුබලවන අවස්ථා දක්නට ලැබේ.

එම දුබලතාවයත් අක්‍රියකාරිත්වයත් නිසාම ජයග්‍රහණය ලැබිය නොහැකි තත්වයට පත්වේ. එහිදී සිදුවන්නේ ඔවුනොවුන්ට දොස් කියවා ගැනීමය. එවිට සිදුවන්නේ සමඟිය නැතිවී සංවිධානය දෙදරායෑමයි. ජයග්‍රහණයේදී මෙන්ම පරාජයේදීද එකට බැඳී සිටිය යුතුය.

සමඟිව ක්‍රියාකළ යුතුය. එසේ කිරීමෙන් පරාජය වෙනුවට ජයග්‍රහණය ලඟාකරගත හැකිය. අවශ්‍ය වන්නේ අධිෂ්ඨානයත්, සමගියත් උත්සාහයත් පමණි.

**විජය තලවත්තේගෙදර**





# බුදුසමය හා සැබැඳුනු ශාන්තිකර්ම හා පූජා විධි

බුදුසමයත් උඩරට පහතරට, සබරගමු යන සම්ප්‍රදායන්ට අයත් ශාන්ති කර්ම බලිතොවිල් යාතුකර්ම අතරත් සුවිශේෂී වූ සබඳතාවයන් පවතින බව ඒවාහි සිදුකරනු ලබන පූජාවිධි හා චාරිත්‍ර විධි දෙස විමර්ශනයක යෙදීමේදී පැහැදිලි වේ.

බුදුදහම ලෝකයේ පහළ වූයේ භාරතදේශයේ පැවැති දෙවියන් සහිත යාගහෝම පුදපූජා වන්දනා මාන ආදියෙන් ගහණවූ ආගමික චින්තනයට ඉඳුරා පටහැනි නවතම දාර්ශනික පදනමක් ඇති ආගමක් ලෙසටය. බුදුසමයෙහි මූලික පරමාර්ථය වනුයේ පුද්ගලයාගේ විමුක්තිය සාක්ෂාත් කරගැනීමේ ප්‍රතිපදා මාර්ගයක් ඉදිරිපත් කිරීමයි. පුද්ගලයාට ස්වකීය විමුක්තිය උදාකරගැනීම සඳහා බාහිර ඇදහිලි විශ්වාස හෝ යාගහෝම පුදපූජා හෝ අවශ්‍ය නොවන බවත් ඒ සඳහා ඔවුන්ට අවශ්‍ය වනුයේ අරි අටගි මග පෙරටු කොටගත් ප්‍රතිපදාව අනුගමනය කිරීම බවත් පුද්ගලයාට ස්වකීය ප්‍රඥාවෙන්ම අවබෝධ කරගත යුත්තක් බවත් බුදු දහමෙහි ඉගැන්වීමය. මුල් බුදුසමය විසින් යාගහෝම පුදපූජා අර්ථ විරහිත ක්‍රියාසේ සළකා ඒවා බුදු සමයෙන් නිශ්ප්‍රභා කොට ඇත.

එසේ වුවද ආගමක් වශයෙන් බුදුදහම ලෙඩදුක් අතුරු ආන්තරා ආදියෙන් අත්මිදීමට සිදුකරන ලද යාගහෝම, ශාන්ති කර්ම පූජා විධි ආදියෙහි එල්බගෙන සිටි මිනිසුන් බුදු සමයේ අනුගාමිකයින් බවට පත්වූ පසු ඒ හා සමාන ක්‍රියාදාමයක් ඉදිරිපත් කිරීමට සිදුවිය. ඒ අනුව තත්කාලීන සමාජයෙහි ප්‍රකටව පැවති ඉහත සඳහන් කළ ඇදහිලි, විශ්වාස, පුද පූජා විධීන් බුදු දහමේ ආගමික හා දාර්ශනික සංකල්ප වලට පටහැනි නොවන සේ සකස් කොට වහන්සේ විසින් මෙන්ම බෞද්ධ ශ්‍රාවකයින් විසින් ද යම් යම් ක්‍රියා කලාපයන් අනුගමනය කරන ලද බව මුල්වකවානුවේ බෞද්ධ ග්‍රන්ථවල එන තොරතුරු වලින් අනාවරණය වේ.

ක්‍රි.පූ 3 වන සියවසේ මැද භාගයේදී පමණ මිහිඳු මහ රහතන් වහන්සේ විසින් ලංකාවට හඳුන්වාදෙන ලද්දේ ඉහත දැක්වූ ඇදහිලි, විශ්වාස, පූජා විධි, යාගහෝම බෞද්ධ ඉගැන්වීම් වලට පටහැනි නොවන සේ සකස්කර ගැනීමේ ආගමක් වශයෙන් විකාශනය වීමය.

මෙසේ ලංකාවට බුදුසමය හඳුන්වා දීමෙන් අනතුරුව ඔවුන්ගේ ජීවන දර්ශනය තුල විශාල විපර්යාසයක් සිදුවිය. ඒ අනුව පොදු ජනතාව ලෝකෝත්තර විමුක්තිය ආගමික ජීවිතයේ පරමාර්ථය කරගැනීම හා එම විමුක්තිය ආධ්‍යාත්මික ගුණධර්ම වලින් පමණක් මිස අධිභෞතික බලවේග වලින් ලබාගත නොහෙන දෙයක් ලෙසට පිළිගන්නා ලදී. එසේ වුවද බුදුදහම කෙතරම් ප්‍රබල ආගමක් වුවත් ඔවුන් මෙතෙක් ඇබ්බැහිවී සිටි අධිභෞතික බලවේග පිළිබඳ සංකල්පය ඔවුන් අතුරෙන් මුළුමනින්ම ඉවත්කර දැමිය නොහැකි විය. එහි ප්‍රතිඵලය වූයේ ජනතාව බෞද්ධාගමික ප්‍රතිපත්ති හා ඉගැන්වීම් අනුගමනය කරන ගමන්ම එම ආගමට අයත් නොවූ අධිභෞතික බලවේගවල පිහිට ආරක්ෂාව පතන්නට පුරුදු වීමයි. මෙය එවකට බුදුසමයට මුහුණපෑමට සිදුවූ ප්‍රබල අභියෝගයක් විය.

මෙහිදී එකී අභියෝගය ජයගැනීම සඳහා බුදුසමය විසින් ගන්නා ලද ක්‍රියා මාර්ගය වූයේ එවකට ජනතාවගේ ඇදහීමට පාත්‍රවී සිටි දේව, යක්ෂ, ප්‍රේත ආදීන්ට බෞද්ධ අදහස් කාවද්දා ඔවුන් බුදු සමය ආරක්ෂා කරන බුදුන් වහන්සේට යටහත් පහත් උන්වහන්සේගේ අණට කීකරුව ක්‍රියාකරන පිරිසක් බවට පත්කරලීමයි. එවකට ජනතාව අතර ඇදහීමට පාත්‍රවී සිටි සුමන සමන් දෙවිඳු බුදුසමයට සම්බන්ධ කර ගැනීමෙන් මේ බව සනාථ වේ. වර්තමානයේ දී පවා සුමන සමන් දෙවිඳු ශ්‍රී පාදස්ථානය ආරක්ෂා කරන දෙවියෝ බවට පත්වීමෙන් ඒ බැව් පැහැදිළි වේ. මෙසේ අනිකුත් විෂ්ණු, නාථ, පත්තිනි යන මහා දෙවිවරු බුදු සමයට සම්බන්ධකර ගෙන ඇත.

බොහෝ ශාන්තිකර්ම වලදි ඇඳුරන් විසින් ප්‍රථමයෙන්ම පංච ශීලය ගෙන ශාන්ති කර්මය ආරම්භ කෙරේ. මේ ආකාරයට බුදු සමයේ බලපෑම නිසා ලෙඩදුක් අතුරු ආන්තරා සමනය කරගැනීම සඳහා ශාන්තිකර්ම ව්‍යුහයේ සිදුකරනු ලබන ප්‍රතිකර්ම පිළිවෙත් හා චාරිත්‍ර විධි බෞද්ධ විශ්වාස හා ආකල්පය මූලිකව සිදුකරනු බන ඒවා බවට පත්විය. බලියාග ශාන්තිකර්ම ක්ෂෙත්‍රයේදී බෞද්ධාගම් සාහිත්‍යයෙන් ලත් ආභාසය ඍජුව පෙන්වන අවස්ථා දැකිය හැක. නමස්කාරය, සත්දින, දොළොස්මස, දොළොස් රැස, කරණුවක්, පත්තිය, දසමහා දෝෂය, සත්සතිය, සවණග්ගණය, සවනග්ග ධාතු ථූපවංශය, සෙත්රුවන් මල් (ශාන්තිමාලය) පාරමිතා දසය, සූවිසි විවරණය, අටවිසි පිරිත, පසළොස්මස්ථාන, සොළොස්මස්ථාන, මගුල් ලකුණු, නවගුණ පිරිත, මහා සිරස පාද කවි, උණවීදිය, විශාලා ශාන්තිය හා රුවන් සූතුර හෙවත් රතන සූත්‍රය යන කවිපොත් විසිඑකම (21) බලිශාන්ති කර්මය කෙරෙහි අපමණ ලෙස බලපා ඇති බව පෙනී යයි.

බලියාගයෙහි පිරිත්හුය හා කඩතිර ඇරීම සඳහා ගායනා කරන කවි පංති බොහොමයක් බුදුන් වහන්සේ හා සම්බන්ධ වූ ඒවාය. එස්ම ශාන්ති කර්මයකදී තොවිල්ගේ ඇතුලු අනෙකුත් සියලු දෑ (පූජා භාණ්ඩ) පිරිසිදු කර ගැනීම සඳහා කහදියර ඉසීම කරනු ලැබේ. විශාලා මහනුවරට පැමිණි තුන්බිය දුරුකිරීමට බුදුරජණන් වහන්සේ පිරිත් පැන් ඉසීම සිදුකරන ලදී. එසේම අනුරුද්ධ තෙරුන්ගේ බඩේ රුජාව සංසිඳවීම සඳහා සුමන සාමණේරයන් වහන්සේ අනෝතප්ත විලෙන් පැන් ගෙන ආ බව බෞද්ධ ග්‍රන්ථවල සඳහන් වේ. තොවිල් වලට ගන්නා වූ දෙහි ආතුරයාට සෙත්පතා කැපීම සඳහා භාවිතා කරති. එසේම ආතුරයා විථියට බැස්සවීමට පෙර ඉරි ඇදීමට පසු පියුම තබා ඒ මත දෙහි ගෙඩි හතක් තබයි. බුද්ධත්වය ලබාගැනීමට වජ්‍රාසනයේ වැඩහුන් බුදුන් වහන්සේ ඉදිරිපිටට මාරයා අවුත් මිණිපළඟ ඉල්ලා සිටින ලදී. මේ අවස්ථාවේදී බුදුරජාණන් වහන්සේ වෙනුවෙන් සාක්ෂිදීමට සිටියේ මිහිකත පමණි. ඇය සාක්ෂිදීමේදී පොළොවට කෙළපිඬක් ගැසුවාය. එම කෙළ පිඩ දෙව්ලොව ඉපදුණි. දෙස්කී නිසා දෙහිවී යැයි යකැදුරෝ අර්ථකථනය කරති. යක් තොවිල් වලදී හදිහූනියම් කැපීමට ගන්නා පුහුල් ගෙඩිය මහා කාශ්‍යප තෙරුන් වහන්සේ දැවූ සොහොනින් උපන් බව පැවසේ. එසේම තොවිල්, කංකාරි සඳහා නිතරම ගන්නාවූ බුලත් වලට දලුමුර කියාද භාවිත කෙරේ.

යක් තොවිල් වලදීද ඇතැම් අවස්ථා වලදී බෞද්ධ මුහුණුවරක් ගෙන ඇතිබව තොරතුරු විමසන විට පෙනී යයි. විශේෂයෙන් හූනියම් කැපිල්ල වැනි ශාන්ති කර්මවලදී ගායනා කරනු ලබන කවි, මන්ත්‍ර ස්තෝත්‍ර ආදිය ගැන විමසන විට එහිදී බුදුගුණ උන්වහන්සේගේ බලය අටවිසි, සූවිසි බුදුවරුන්ගේ බලය පිරිත් බලය, සූවිසි බුදුවරුන්ගේ පිරිත් බලය ආදිය ඇතුලත් කොට කවි, මන්ත්‍ර ආදිය ගායනා කිරීමෙන් මේ බැව් අනාවරණය වේ.

මේ පිළිබඳව සිය අදහස් දක්වන මහාචාර්ය සෙනරත් පරණවිතාන (ප්‍රාග් බෞද්ධ යුගයේ ආගම හා ඇදිහිලි විශ්වාස) මාර්ටින් වික්‍රමසිංහ (සිංහල විචාර මඟ) මහාචාර්ය එරදිරිවීර සරත්චන්ද්‍ර (සිංහල ගැමි නාටකය) යන විද්වතුන් බුදු සමයත් ශාන්තිකර්ම අතර කිසියම් සම්බන්ධතාවයක් තිබූ බව පෙන්වා දී ඇත. බලි ආදී ශාන්තිකර්ම වලදි ආතුරයා අතට දෙන පිරිත් හුය, බුදු සමයට සම්බන්ධ වේ. බුදු රජාණන් වහන්සේ පිරිනිවන් මංචකයේ වැඩහුන් අවස්ථාවේදි ලංකාව ආරක්ෂා කරනු වස් වරම්ගත් සක් දෙවිඳුගේ අණලත් උපුල්වන් දෙවිඳු විජය රජුගේ අතෙහි බැඳි පිරිත්හුයට මෙය සමාන කරති.

පහතරට ප්‍රදේශවල පවතින සූනියම් කැපිල්ල රටයකුට හෙවත් රිද්දියාගය මහසොහොන් සමයම සන්නියකුට හෙවත් දහඅට සන්නිය යන ප්‍රධාන ශාන්තිකර්ම හතරටම බුදු සමය බලපා ඇත. මෙකී ශාන්තිකර්ම සතරෙහිම ආරම්භයේදී ත්‍රිවිධ රත්නයට නමස්කාර කිරීමත් දෙවිවරුන් උදෙසා පහන් දැල්වීමත් සිදුකෙරේ. එසේම යන්ත්‍ර මන්ත්‍ර වැඩිකොටසක නව අරහාදී බුදුගුණ අඩංගුකොට ජප කිරීම් හා යන්ත්‍ර සකස් කිරීම් කරති. උදාහරණ ලෙස "සීවලී යන්ත්‍රය" දැක්විය හැක.

මේ ආකාරයට විමසා බලන විට බුදුසමයත් ශාන්ති කර්ම හා පුද පූජා විධීන් අතර ගොඩනැගී ඇති මෙම සම්බන්ධතාවය නිසා ශාන්තිකර්ම වලදී යකුන් මැඩලීමටත් රෝග සුවකිරීමටත් කරනු ලබන බොහෝ වත්පිළිවෙත් වලට හා චාරිත්‍රවලට බලපාන සංකල්ප සමූහයක් බුදුමයෙන් එකතුවී ඇතිබව අවසන් ලෙස පෙන්වාදිය හැකිය.

**විශ්‍රාමලත් සහකාර සංස්කෘතික අධ්‍යක්ෂ
ඩී. එම්. එච්. කරුණාරත්න
මහත්මාගේ අභාවයෙන් පසු උපහාර පිණිස පලකෙරේ**

රංගිරි ශ්‍රී ලංකා RSL NEWSPAPER

රංගිරි - ශ්‍රී ලංකා මාධ්‍ය ජාලය
රංගිරි දඹුල්ල සංවර්ධන පදනම,
අංක 130, දඹුල්ල.

දුරකථනය: 066-2283606 (දිගුව 161) හෝ 071 5361328
ෆැක්ස්: 066-2284603
ඊමේල්: rangirinewspapers@gmail.com
වෙබ් අඩවිය: www.rangirisrilanka.lk

# "උඳුවප් දායාදයෙන් පාඩම් උගනිමු"

උඳුවප් ............

අදින් වසර 2564 කටත් ඔබ්බෙන් දිනෙක උඳුවප් මස පුර පසළොස්වක පෝ දිනක ජය ශ්‍රී මා බෝ සමිඳුන් අප රටට වැඩම කරවන ලදහ.

ලෝක ධාතුවේ පවතින සජීවී ශ්‍රේෂ්ඨ වෘක්ෂයක් මුල් කරගනිමින් ......... සිට ශ්‍රී ලංකද්වීපය බුද්ධ, ධම්ම, සංඝ යන තුන් සරණේ ආනුභාවයෙන් උතුම් සංස්කෘතියක උරුමකම් ලද බව ලොවට හඬගා කීමට තවත් උදාහරණ අවැසි නොවෙති.

ශ්‍රී ලාංකීය ජාතියත්, සංස්කෘතියත් ශ්‍රී මහා බෝධියත් එකම රන් හුයකින් ඇමිණූ අනර්ඝ ........

දළඳා සමිඳුන් ශ්‍රී ලංකාවට වැඩම කරවන තෙක්ම රාජ්‍යත්වයේ මාහැඟි සංකේතය වූ ජය ශ්‍රීමා බෝධිය, දඹදිව රාජ්‍ය දෙවරක්ද, ශ්‍රී ලංකා රාජ්‍ය තෙවරක්ද වශයෙන් වැදුම් ලබා ඇති බවද අප මෙනෙහි කළ යුතුව ඇත.

ශ්‍රීමා බෝධිය සමඟින් අපට සංස්කෘතියක්ද, චාරිත්‍ර වාරිත්‍ර රැසක්ද ඥාති සමූහයක්ද නව ජීවන මාර්ග හා සංස්කෘතික ආගමික පූජෝපහාර රැසක්ද ලැබිණි. එසේම නව ඇවතුම් පැවතුම් රටාවක්ද, ජනාවාස සමූහයක්ද අප වෙත දායාද විය. බෝධි පූජාව ඒ අතරින් ප්‍රමුඛ අංගයකි. එය අද පවා ලංකාවේ ගම් නියම් ගම් පුරා පවතින ශ්‍රේෂ්ඨ පූජාකර්මයකි.

මෙලෙස සැලකූ කළ රටත් එහි සමස්ථ රට වැසියනුත්, අප සංස්කෘතියත් ජය ශ්‍රීමා බෝධීන් වහන්සේට ණය ගැතිය. ජය ශ්‍රීමා බෝධිය මුල් කොට ගෙන ශ්‍රී ලංකාවේ ....... සකස් වී ඇතුවා සේම ගම් නියම් ගම් නගර හා පළිත් මට්ටමින් විහිදී ඇති අනේක බෝධි රාජයානන් වහන්සේලා මුල් කරගනිමින් ගම්මාන දහස් ගණනක ආගමික කේන්ද්‍රස්ථාන ගොඩනැගී ඇති බව පැහැදිළි සත්‍යයකි. ඒ සියල්ල ශ්‍රී ලංකීය විඥාණයේ මුදුන් මල්කඩ බඳු ආගමික වස්තූන් වී තිබේ. දෛනික ජීවිතය දුක සැප, නින්දා ප්‍රශංසා, ලෙඩ දුක ආදී සියල්ලේම අපේක්ෂාව, සංහිඳියාව මෙන්ම ප්‍රත්‍යක්ෂ මාහැඟි ............. වී ඇත්තේද ශ්‍රීමා බෝධීන් වහන්සේමය. කිරිදරුවෙකුගේ පටන්ම නිර්වානය දක්වා බෞද්ධයින් සියල්ල අපේක්ෂා කරන්නේ ඒ වෙතිනි.

මෙසේ බිහිවූ සභ්‍යත්වයක් ලෝකයේ තවත් නම් තිබිය නොහැකිය. අතිපූජනීය ජය ශ්‍රීමා බෝධිය යනු ලෝවැසි බෞද්ධයින්ගේ ප්‍රාණ නාලිය බව ඉදුරාම කිවහැකිය.

පවුල් ඒකකයද, ගමද, නගරයද, රටද, රාජ්‍යයද ගොඩනැගුනේ මේ මඟිනි.

එහෙත් අදවන විට රටේ සංස්කෘතිය, සභ්‍යත්වය, සදාචාරය මෙන්ම ....... ජනජීවිතයම පවා මහා ඛේදවාචකයකට ගොදුරු වූ බවක් දිස්වෙයි. අනිත්‍ය බුදු ගුණ ජය ශ්‍රීමා බෝ සමිඳුන්ගේ ආශිර්වාදයෙන් යළිත් මෙරට තුළ මනා ආගමික සංස්කෘතික පරිවර්තනයක් සිදුවේවායි ප්‍රාර්ථනා කරමු.

# අලුත් අවුරුද්දම සුබ වෙන්න නොවරදින මග මෙන්න

2021 ජනවාරි පළමුවනදට වසරක් ගෙවී නව වසරක් උදාවනු ඇත. එහිදී නව සිතුම් පැතුම් හා නව ක්‍රියාකලාප ඔස්සේ වැඩ කිරීමට නොයෙන් දෙනා සිතා සිටිති. 2020 වර්ෂය තුළ සිදු වූ වැරදි අඩුපාඩු සකසාගෙන තම අරමුණු කරා යන්නට රටවැසියාට හැකියාවක් ඇත්තේ උත්සාහය තුළිනි. අද අප අතර ක්‍රමක්‍රමයෙන් නැති වී යන උට්ඨාන වීර්‍ය්‍ය අපි නැවත දියුණු තියුණු කරගෙන උදාවෙන මෙම නව වසර තුළ සියළු අභියෝග ජයගන්නට සිතා ගැනීම ඉතා වැදගත් වේ.

උට්ඨාන වීර්‍ය්‍ය ඕනෑම පුදුගලයෙක් තුළ තිබිය යුතු දියුණු වීමේ ලක්ෂණයකි. එය ඇත්නම් කළ නොහැකි දෙයක් නැති තරම්ය. ගොවිතැන, වෙළදාම, ගවපාලනය, දුනු ශිල්පය, රාජ්‍ය සේවාව ආදියට දක්ෂ වීම ඒ කෙරෙහි අනලස් වීම, උපායෙන් හා විමසීමෙන් යුක්ත වීම සුදුසු කළ ඒ කාර්‍ය්‍යයන් සම්බන්ධව කටයුතු කිරීම උට්ඨානවීර්‍ය්‍ය නම් වේ. රටක නායකයෙක් වේවා, ගොවියෙක් වේවා, භික්ෂුවක් වේවා, වෙළෙන්දෙක් වේවා, ගෘහාධිපතියෙක් වේවා, ඕනෑම තරාතිරකම වේවා උට්ඨාන වීර්‍ය්‍ය පැවතිය යුතුය. නැත්නම් රටක, සමාජයක, ගමක, නිවසක දියුණුවක් අභිවෘද්ධියක් ළඟා කරගත නොහැකිය.

අද ලෝකය ගත්තත් එම නාටකයාගේ උත්සහය නිසා දියුණු වූ රටවල් බොහෝ ගණනාවක් ඇත. ජපානය, සිංගප්පූරුව, මැලේසියාව, තායිවානය වැනි රටවල් ඒ අතර සුවිශේෂි වේ. මී මැස්සන් සේ, වේයන් සේ උත්සහය ඇතිකර ගැනීම දියුණු වීමේ මාර්ගයයි. කම්මැලිකම, අලසකම ජීවිතයක් තුළ තිබුනොත් සැමදා පඅිරිහීමට ලක් වේ. එවැනි අලස අය තුළ නිතරම පවතින ගති ලක්ෂණ 06කේ සිගාලෝවාද සූත්‍රය තුළ පෙන්වා දී ඇත. එනම්,

01 දැන්ඉතා සීතලය

02. දැන් ඉතා උෂ්ණය

03. දැන් ඉතා සවසය

04. දැන් ඉතා උදේය

06. දැන් බඩ පිරිලාය

05. දැන් බඩගිනිය

යනාදි වශයෙනි.

මෙවැනි ගති ලක්ෂණ තිබුනොත් කවදාවත් දියුණු වීමට පුළුවන්කමක් නැත. එනිසා එවැනි අලසකම් නැති කරගත යුතුය. අපේ රටේ ඉතිහාසය ගත්කළ එදා පැරැන්නන් තුළ උත්සාහය උපරිම වශයෙන් තිබූ බව ඔවුන් කළ කී දේ තුළින් වටහාගත හැකිය. ආගමික වශයෙන් ගත්තත්, ආර්ථික වශයෙන් ගත්තත්, දේශපාලනික සංස්කෘතික යන මොන අංශයෙන් ගත්තත් එහි දියුණුව අද පවා දැකගත හැකිය. කෘෂිකර්මාන්තයේ දී දෑත දෙපය මහන්සි වී ලබාගත් අස්වැන්න වෙනත් රටවලටද යැවූ බව සඳහන් වේ. අක්කර දහස් ගණන් බීජ වැපිරීම සඳහා විශාල වැව්, ඇළ, වේලි හා ජලනල පද්ධති නිර්මාණය කිරීමෙන් කෘෂි කර්මාන්තය දියුණු වී රටේ ආර්ථික ස්වංපෝෂිත වූ එවුනට ආගමික සහනශීලීතාවය ඇතිකර ගැනීම සඳහා විශාල වෙහෙර විහාර, ස්ථූප නිර්මාණය වූයේද, උත්සාහයේ ප්‍රතිඵලයක් වශයෙනි. උදයට උදැල්ල රැගෙන කුඹුරට යන ගොවියා යළිත් නිවසට පැමිණෙන්නේ සවසටය. ඒ තරමට පැරැන්නන් තුළ කම්මැලිකමක් නොතිබුණි. වී ප්‍රධාන භෝගය වූවත් ඊට අමතරව විවේක වෙලාවට අල, බතල, මඤ්ඤොක්කා වැවීමටද, එයින් ප්‍රයෝජනය ගැනීමටද පැරැන්නන් උත්සුක විය. අද කාලයේ තරුණ පිරිසට එය ආදර්ශයට ගෙන දියුණු විය හැකිය.

බුද්ධ චරිතය තුළින්ද අපට උට්ඨාන වීර්‍ය්‍යයේ ඇති අගය වටිනාකම මනාව පිළිපිඹු වේ. උන්වහන්සේ දස පාරමිතා අතර වීර්‍ය්‍ය පාරමිතාවක් හැටියට සසරේ පුරන ලද්දේ මෙම උත්සාහයයි. ඒ අනුව උන්වහන්සේ නොයෙක් ආත්මවල ඇස්, ඉස්, මස්, ලේ පමණක් නොව අඹුදරුවන් පවා දන් දුන් සේක. උන්වහන්සේට දීපංකර පාදමූලයෙහි දී නිවන් දැකීමේ වරප්‍රසාදය තිබුණත් එසේ නොකොට ප්‍රාර්ථනා කළේ,

**"බුද්ධෝ හං බෝධ ඉස්සාමි**
**මුත්තෝ හං මෝචයේ පරේ**
**තිණ්ණෝ හං සාර ඉස්සාමි**
**සංසා රෝග මහබ්බයා"**

තමන් සසරින් මිදී අන්‍යයාද මුදවීමේ හා සසරින් එතෙර වී අන්‍යයාද සසරින් එතෙර කරවීමේ පරම පවිත්‍ර චේතනාව උට්ඨාන වීර්‍ය්‍යයත් සමග උන්වහන්සේ තුළ තිබුණි. සිදුහත් බෝසත් සමය තුළ සියලු සැප හැරපියා උට්ඨානයෙන් බණ භාවනා කර ලද ජයග්‍රහනය ලෙස නිවන් සැපත හැඳින්විය හැකිය. එම උතුම් චරිතය තුළින් ඕනෑම කෙනෙකුට ආදර්ශයක් ගෙන අභියෝග ජයගැනීම සඳහා එය පිටුවහලක් කරගත හැකිය.



වුල්ල සෙට්ටි ජාතකය ආදර්ශයට ගත්තත් කෙනෙකුට දියුණුවීමට බැරිකමක් නැත. එහි සඳහන් වන්නේ මී කුණක් උපයෝගි කරගෙන තරුණයෙක් ක්‍රමක්‍රමයෙන් දියුණු වූ ආකාරයයි. බුදු දහම තුළ නිතරම පෙන්වාදෙන්නේ නිවැරදි කායකර්මාදිය තුළින් මෙලොව සැප ලබා ගන්නා ආකාරයයි. එය ඉද්දිපාදයක් හැටියට සම්මා වායාම" යනුවෙන් ආර්ය අෂ්ඨාංගික මාර්ගය තුළ වැඩිය යුතු බව පෙන්වා දී ඇත. වර්තමානයට අවශ්‍යම දෙයක් හැටියට උත්සහය නොහොත් වීර්‍ය්‍ය පෙන්වා දිය හැකි අතර එය පළමුවෙන්ම මනසේ ධෛර්‍ය්‍ය වශයෙන් ඇතිකරගත යුතු අතර පසුව එය ක්‍රියාවට නැංවීමේදී නොපසුබස්නා වීර්‍ය්‍ය ඇතිකරගත යුතුය. එය කුඩා දරුවාගේ පටන් වැඩිමහල්ලා දක්වා රටක, සමාජයක, ගෙදරක තිබිය යුතු ලක්ෂණයක් ලෙස පෙන්වා දිය හැකිය.

දෙයක් හැටියට උත්සහය නොහොත් වීර්‍ය්‍ය පෙන්වා දිය හැකි අතර එය පළමුවෙන්ම මනසේ ධෛර්‍ය්‍ය වශයෙන් ඇතිකරගත යුතු අතර පසුව එය ක්‍රියාවට නැංවීමේදී නොපසුබස්නා වීර්‍ය්‍ය ඇතිකරගත යුතුය. එය කුඩා දරුවාගේ පටන් වැඩිමහල්ලා දක්වා රටක, සමාජයක, ගෙදරක තිබිය යුතු ලක්ෂණයක් ලෙස පෙන්වා දිය හැකිය.

ලෞකික මෙන්ම ලෝකෝත්තර සැපත පිණිස කරන කුසල් කර්මාදිය සඳහාද උත්සහය අවශ්‍යය. සිතෙහි පවතින ලෝභ, ද්වේශ, මෝහ වැනි අකුසල, සිතුවිලි යටපත් කරගෙන කුසල් කිරීමටත් එවැනි අකුසල් සහමුලින් උපුටා දමා නිවන් සැපත ලඟාකර ගැනීමටත් උත්සාහය අවශ්‍යය. ඒ නිසාම බුදු පසේ බුදු මහරහතන් වහන්සේලා තුළ පැවති උන්වහන්සේලා විසින් අගය කොට වදාළ ශ්‍රේෂ්ඨ ගුණ ධර්මයක් වන උට්ඨාන වීර්‍ය්‍ය රටක ජීවත්වන සෑම කෙනෙකු තුළම පැවතිය යුත්තකි. කටයුතු සාර්ථක කරගැනීමට අනාගතය සැපවත් කරගැනීමට කැමති සැම කෙනෙක්ම උත්සාහය ඇති කර ගත යුතුය. ආගම්,ජාති, කුල මල තුළ සිරනොවී එකම රටක පුරවැසියන් හැටියට අපි සෑම දෙනෙක්ම එකතු වී සමගියෙන් සහයෝගයෙන් රට දියුණු කිරීමටත අපගේ දියුණුව ඇති කර ගැනීමටත් උත්සහයෙන් සියළු කටයුතු කරගෙන යාමට උදාවන අළුත් අවුරුද්ද තුළ ප්‍රාර්ථනාවක් වශයෙන් තබාගනිමු.

කොබෙයිගනේ පුබ්බිලිය ශ්‍රී සාරානන්ද පිරිවෙනේ ආචාර්යය
ගලේවෙල පුවක්පිටිය ශ්‍රී බෝධිරාජාරාමයේ ගලගෙදර රතනවංශ හිමි.

# සඳ සිසිල

සංස්කාරක
"සඳ සිසිල"
රංගිරි ශ්‍රී ලංකා පුවත්පත
අංක 130,
නුවර පාර,
දඹුල්ල.

## අප්පච්චි........

ජීවන බර කරට අරන් මුදල් සොයන පියා
දරු සෙනෙහස හිතේ තියන් අගවන්නැති පියා
වෙහෙස වෙලා උදේ ඉඳන් ගෙදරටවිත් පියා
හෙට දවසේ අප පැතුමන් සඵල කරයි පියා

කුමාර ගුරුසිංහ ආරච්චි
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.

## ආදර අම්මේ......... අගනේය ඔබේ සෙනෙහස

අසරණ කමයි ලෝකයේ රජ වුනේ
දුප්පත් කමයි සාමය නැති කලේ
පෙරදා තිබූ සාමය කොයිබද ගියේ දුරස් වී
අම්මා ගියේ මෙහෙකාරියක සේ
දුක්බර දිවියේ නිමාව දකින්නයි..............

විෂම වූ ලෝකයට ගොදුරු වු
පියාගේ කරදර ගංඟවේ
නිමග්න වු ඔබේ දියණිය
කෙසේ නම් ඉවසම්ද ?
අම්මේ
හඩගා අසන්නෙමි............
ඔබේ සෙනෙහසේ සුවඳ
නොලබන්නට තරම්
පව්කාරියක වුනේ කෙසේ ද මා...........
අම්මේ
මවකගේ ආදරණීය උණුහුමක
සුවඳ

හැමදා පතන්නෙමි මා
එපා අම්මේ පුංචි දෝණිට
සුරඟන ලොවක්
එයින් නොහැකිය මා
සනසන්නට
මෙරට තනිවූ පුංචි දෝණිට
අගනේය සුර ලොවකටත් වඩා
ඔබේ සෙනෙහස්..........
සුවඳ.............

ඩී.කේ. ලක්මිණි කුමාරි බංඩාර
ගලේවෙල

## සිත

හවය පුරා සැරිසරමින්
පිනටම තන්හාවෙන්
නිවනද ඇත මග අරිමින්
සසරද අනේ දුක් විඳිමින්

කුසල් වඩා සිත සීලෙන්
කරන පිනන් කුසල් මගින්
බියකරු බව කෙටි කරමින්
නිවනද ඇත සිත සන්සුන්

*එම්. ජී. මානන්ගොඩ- වැලිමඩ*

## ජීවිතය....

ගලන ගඟක් සේ ගලායන ජීවිතය
විඳවන්නට ඇති දෙයක් නොව
විඳින දෙයකි..........
එහෙත් කිම...........
විවිධ කණ දුර්ග මැදින් යනවිට
ඒ ජීවිතය නැමැති ගංගාව වරෙක
එපාවෙයි.
කටුක බවෙන් පිරී ඉතිරෙන
ඒ ජීවිතයට
නව පිණිබිඳුවක් වී
වැටෙන්න සැනසිල්ල
එයයි ජීවිතය ලබන
ලොකුම දායාදය.............

ෂෙහානි ශෂිනිකා
ආනන්ද ජාතික පාසල
පුත්තලම.



සෑ රජුන්
මඳ සමඟ වෙලී
බෝ මළුවෙ සිලිය මැද
පින් බරවූ සෑ රජුන්
නැගුණි නිලඹර උසට

සොම් නසින් පිරි හද
නෙතු රැඳුන විටදි සැම
සෑ රජුන් අහස උස
අපේ විස් කමක් නොව

අපි ලගින් නිති සරණ
උතුම් මිනිස් හදේ
පැතුම් ඉටුවී තැනුන
රුවන් විමනක්ය මෙය

බැතින් හදතුල රැඳුන
වැඳුම් නිරතුරු වදිමු

යූ.ජී.නිලූකා චන්දන මල්කාන්ති සේනාරත්න.
වෑඋඩ




දහසක් වැව් බැඳි රජරට
කුට්ටම් පොකුණු ඇත් පොකුණු ඈ
නෙක සිරින් මත් කළ
පඬු අබා කල සිට
නෙක දනෝ කළ දිය කෙළි
සිහිකරයි මහාවංශය..........
මව් කුසේ නොදැනුවත්ව කළ
දිය කෙළි ජය කෙහෙළි කොට
අපේ දරුවන්ට ලොව නගන්නට
ගහකොල වැව් දිය එක්ව
දිවි ගෙවන්නට
අගනා දිවි අපමණ මුදාලන්නට
දුන් හැඩ වැඩ හඬ
හදවතම ඇමතූ බව
අදරැති පියෙකු සේ
තුති පුදමු මේ නිල් දියවරට
සේම
රත්නයක් වන් සිසු දරුවනට එකසේ රැඳුණු......
දෙගුරුන් ලෙස අපේ තුති කවි මල් පුදමිනේ.....
නිදුක් නිරෝගීව සරන්නට ලැබ
මේ නිල් දියවරේ......රැදේවා ඔබෙ නම
දිය සිඹින සුලඟසේ.........

ජී.වයි.එච්. උදේනි විතානගේ ගුරු මාතාව
අ/ තම්මැන්නාපුර විදුහල
අනුරාදපුර.



## දු දන ගති

| | |
|---|---|
| හෙට මොනවද | වෙන්නේ |
| මිනිසුනි නැත | දන්නේ |
| කොහිදැයි මේ | යන්නේ |
| නැත යන තැන | දන්නේ |
| පෙන්වන සැම | ගුණ |
| සිත යට ඇත | කුණ |
| දෙසනවා වැදි | බණ |
| හරි මඟ නැත | දැන |
| දෙවියන් යැද | සෙත |
| සැනසෙන යටි | සිත |
| මියැ දෙන තුරු | ගත |
| වනසති යහ | පත |
| වැඩ තිබුණත් | ගොඩ |
| කර දුන්නත් | හැඩ |
| දුන්නොත් ළඟ | ඉඩ |
| ඉල්ලන් කකන | දඩ |
| නොතකන අණ | ගුණ |
| ජගතුන් සැම | තැන |
| ඇති තැන යහ | ගුණ |
| වනසති, සැම | දින |
| පණ දෙන්නට | කතා |
| කළ ගුණ නැත | සිතා |
| දුදනන් ගැන | කතා |
| මොනවද? තව | කතා |

සිති ගමගේ

## සිත් අහසට සුබ පැතුම්

*සිත් අහස බිලිදෙකි*
*ඉපැදිලා සතියකි*
*දිදුලන සඳවතකි*
*රන්ගිර වාසනාවකි*

*රන්කිරි මුවෙහි ගෑ දින*
*වැණුවා උතුම් මව් ගුණ*
*ඒ මහා බලයෙන*
*රැදේවා රන්ගිරි ගුවන*

*අහසක් තරම් වන හිතේ ඇති සිතුවිලි*
*රහසක් නොකොට ලොවටම බෙදා කර හෙළි*
*සහසක් සිතුම් හෙළි කරන්නට නොව මැලි*
*දිරියක් ලැබේවා රැදෙනට නොසෙල්ලී*

*සුරනි නර්මදා ගාල්ලගේ*
*කුරුදුගහ හැතප්ම - ඇල්පිටිය*

## සංවර්ධනය

අහස සිපගත් උස් ගොඩනැගිලි
ජීවන බරට පමණක්
දෙවනි වන.....
.
ගුවනින් ගොඩබිමින් පාලම් දසත
සිනහවක් නොදත් මිනිසුන්
මාරුවන......


හන්දියක් ගානෙ බුදු පිළිම
නිවනට නොයන බස්,
නැවතුමයි එතැන......

විශ්ව ගම්මානයකි ලොවම
පැය විසිහතර
මදි කියන......

භාග්‍යා එම්. හේරත්
කැකිරාව.

භාග්‍යා එම්. හේරත්
කැකිරාව

# යථාවබෝධයෙන් භාවනා කිරීම



**"භාවේති කුසලා ධම්මා ආසේවති වඩ්ඩේති ඒතායති භාවනා"**

**(කුසල් දහම් වැඩිදියුණු කිරීම සඳහා සිත එක්තැන් කරගැනීම භාවනාව වේ)**

මිනිස් බව ලැබීම දුර්ලභ අවස්ථාවක් වන බව බුද්ධ දේශනාවේ සඳහන්ය. අප උත්සහ ගත යුතු වන්නේද ඒ ලද මිනිස් බවින් උපරිම ප්‍රයෝජන ගෙන තමන්ටත් සමාජයටත් අර්ථකාරී ලෙස ජීවිතය හැඩ ගසා ගැනීමය. බෞද්ධයන් ලෙස අපගේ සාස්තෘන් වහන්සේ පෙන්වා දුන් මඟ ගමන් කිරීමය. ඒ සඳහා අනුගමනය කළ යුතු මූලික පියවර තුනකි. එනම්, දානය, සීලය, භාවනා, යන ත්‍රිවිධ පුන්‍ය ක්‍රියාවන් ය.

දානය විවිධ අර්ථයන්ගෙන් විවරණ වේ. නිවැරදි දේ කිරීම, බොරු නොකීම, සත්‍ය වචන කථා කිරීම, කේලාම් නොකිම, අන්‍යයන්ගේ අර්ථවත් වැඩ ගැන කථා කිරීම, මෘදු වචන කථා කිරීම, හිස් බව නොකියා අර්ථ දේ කිම, ආදී මේ සියල්ලටම නිවැරදි පිළි පැදීම උතුම් දානයයි. ඒ සඳහා අවශ්‍ය වන්නේ නිවැරදි අවබෝධය පමණි. ජීවිතය අර්ථවත් කර ගැනීමට අර්ථවත් දේ සිතීමද මහගු දානයකි. නිවැරදි දැක්මට අනුව අර්ථවත් සමාජ අවබෝධයකින් යුතුව කටයුතු කිරීම සමාජයට දිය හැකි දානයකි.

පුද්ගලයකුට තම කාය කර්ම වුවද සමාජයට හිතකාමී ලෙස ඉටු කිරීම ඉතා වැදගත්ය. සීලයෙන් කය හා වචන දෙකේ මිනිස් කම චරිතවත් කම සීලාචාර බව බෞද්ධ කම තහවුරු වේ.

සිතෙහි ක්‍රියාකාරීත්වයන් මුළුමනින්ම පාලනය වන මෙහෙයුම් බල වේගය හෙවත් පද්ධතිය සිතයි. ඕනෑම කෙනෙකුට ක්ෂණිකව සිතුවිල්ලකින් මහා දාමරිකයකු වීමට සේම සියළුම දුක් දොම්නස්සයන් විඳ දරා ගනිමින් නිවී සැනසුන පුද්ගලයෙකු වීමටද සිත බලපායි.

ඒ සඳහා අවශ්‍ය වන්නේ තම සිත තමාට අවනත කර ගැනීම පමණි. සිත දෙස බැලීමට හදුනා ගැනීමට හික්මවා ගැනීමට සංවර කර ගැනිමට ඇති මනෝවිද්‍යාත්මක උපක්‍රමය ලෙසට භාවනාව" හඳුන්වා දෙයි.

දානයෙන් පමණක් සීලය හා භාවනාව යන උසස් ගුණ නොවැඩේ. එයින් තෘෂ්ණාව තාවකාලිකව යටපත් කිරීමට හා තුනී කිරීමට පමණක් ඉඩ ලැබේ.

දානයෙන් දාන සීල දෙකේ වැඩුනොත් එයින් භාවනාව නොවැඩේ. එයින් ආමිස පූජාවෙන් භාවනාවට අවශ්‍ය කරන සූදානම් පරිසරයක් ගොඩ නැගේ. එලෙසම භාවනාවෙන් ත්‍රිවිධ පුණ්‍යත්‍රියාවම වැඩේ. තණ්හාව මුල් කොට ගත් කෙලෙස් උපාදාන හා සංයෝජක තදංග (මොහොතකට) (කාලයකට) සමුච්ඡේද (මුළුමනින්ම) යනාදි වශයෙන් පියවරෙන්පියවර ප්‍රහීණ කරගැනිමටත් ඇති එකම මඟ භාවනාවයි.

භාවනාව සඳහා අවශ්‍ය වන කායික මානසික හා භෞතික පරිසරය ගොඩ නගා ගැනිම හා විධිමත්ව සූදානම් වීම සඳහා දානය වත් පිළිවෙත් හා ආමිස පුජා ඇතුලත් වන චාරිත්‍ර සීලයන්, පංච සීලයන්, උපොසථ සිලයන්, දස සීලයන්, සාමණේර සීලයන්, ඇතුලත් වන චාරිත්‍ර සීලයන් පූර්ව කෘත්‍ය වශයෙන් වැඩීම අවශ්‍ය වෙයි. භාවනාවේ ප්‍රභේද 02 කි. එනම්, සමථ හා විප්පස්සනා යනුවෙන් හඳුන්වයි.

## සමථ භාවනාව

පංච නී වර්ණයන් තාවකාලිකව යටපත් කරන , සංසිඳුවන, සමථයකට පත් කරවන භාවනාව සමථ භාවනාවයි. මෙය සමාධියත් සමාධිය මඟින් සිතත් දියුණු කර ගැනීමට උපකාරී වන බැවින් සමාධි භාවනාව චිත්ත භාවනාව යන නමින්ද හදුන්වයි. භාවනා ක්‍රම 40 කි. ලෞකික සමාධිය දියුණු කර ගෙන ධ්‍යාන හා අභිඥා උපදවා ගැනීමටත් එම ගින් බඹ ලොව උපත ලබාගැනීමටත් අවස්ථාව සලසා ගතහැක.

## විපස්සනා භාවනාව

ජීවිතය හා ලෝකය අනිත්‍ය, දුක්ඛ, අනාත්ම ආදී වශයෙන් ඇති සැටියෙන් විවිධාකාරයට දැකීමට බැලීමට අවබෝධ කර ගැනීමට පකාරී වන්නේ විපස්සනා" භාවනාවයි. මහා සතිපට්ඨාන සුත්‍රයේ දී විදර්ශනා භාවනාවට කර්මස්ථනෙ 21 දේශනා කොට ඇත. විදර්ශනා භාවනා ක්‍රමය බුදු දහමේ හැර ලෝකයේ අන් කිසිම ආගමික, දර්ශනයක , ශික්ෂණයක , ප්‍රතිපදාවක , කිසිම දිනක ඇතුලත් නොවේ. එය බුදුදහමට ආර්ය මාර්ගයට පමණක් ආවේණික වු භාවනා ක්‍රමයයි.

මාර්ග ඵල ලැබීම සඳහා රූප ධ්‍යාන තත්වය පසු කළ යුතුව ඇත. ධ්‍යාන වලට ඵලබ ගත් පුද්ගලයාට නැව ඒ වාට සමවැදිය හැකිය. අභිඥා උපදවා ගත හැකිය.

යහපත් මනුෂ්‍යයෙකු ලෙස ජිවත් වෙමින් මාර්ග ඵල ලබාගෙන නිර්වාණාව බෝධය සඳහා සෑම දෙනාම වීර්‍ය කරගත යුතුය.

**චවින්ද්‍රා නිරෝමණී වෛද්‍යරත්න**

# සසරේ ඇති තතු කවි ඇසින්

**සැඟවෙමි එබෙමි නිසසල වෙමි**
**සසල වෙමි**
**ඇඹරෙමි එහෙත් පසුනොබසිමි**
**නොනව තිමි**
**කවදා කොතනකදි හෝ මහ මුහුද**
**හිමි**
**හමුවන කෙනෙහි මා සතු බර**
**ඔහුට දෙමි**

ඇත්තෙන්ම මෙම පද්‍ය, පද සතරකට සීමා වුවද එහි ගැබ්ව ඇති අර්ථය ඉතා ගැඹුරුය. කවිය කෙරෙහි අවධානය සිත බොහෝ දුර ගමන් කිරීමට ඉඩ සලසා ඇති බව පෙනේ. මෙහි හමුවන බාධක අතරින් නොනැවතී අවසානය තෙක් ගලන දිගු ගංගාවක සිතිවිල්ලකි. ඉතාමත් අපහසු බාධක වලට මුහුණ දෙමින් ඒවා විඳදරා ගනිමින් පසු නොබසිමින් උත්සාහයෙන් ගලායෑමට සලස් වන්නේ කෙසේද...යත් ''සැඟවෙමින්,එබෙමින්,නිසසල වෙමින් සසල වෙමින්,ඇඹරෙමින් එහෙත් නොනැවතීන්නේමය. මෙලෙස ගඟගත් අරමුණ ආරම්බයේ පටන් අවසානය තෙක් සාර්ථක උත්සාහයක නිමාව දකින්නේ මහමුහුදත් හමුවීමත් සමඟය.ඇත්තෙන්ම මෙම කවිය තුළින් මා දකින්නේ අප සිත තුළ අප සිත තුළ එකක් පසුපස තවඑකක් වශයෙන් ගලාඑන අයහපත් චෛතිසික ධර්මයන්ගේ බලපෑම් වලට මුහුණ දෙමින් ඉවත් වෙමින් ධර්මමාර්ගය තුළ පැහැදෙමින් ඉදිරිය සලසා ගන්නා අයුරු ඉතා සරල ලෙස ඉදිරිපත් කර ඇතිබවයි. මෙය බුදුදහම හා බැඳී පවතින ගමනක් වන බවයි.මේ සියල්ල වෙන් වශයෙන් හඳුනා ගැනීමේදී කුසල කර්ම සමානකමින් යුක්තව ගලපා නිර්මාණය කිරීමට කවියා සමත්වී ඇතිබව මාසිතට හැගෙයි. මෙයින් අපට ගතහැකි පැහැදිලි ආදර්ශය නම් ජීවිතයේදී අත්වන බාධක වලින් ජයගැනීමට බුද්ධ දේශනාවේ සඳහන් පරිදි අප විසින් ඇති කරගන්නා යහපත් අරමුණුය..... අවංකබව ඉවසීම, සිහිය, වීර්‍යය,අධිෂ්ඨානය,නිහතමානි බව සමගින් උපදවාගත් නුවණින් නොනැවතී ඉදිරියට යන ගමන්මග සඳහා ඉන්ද්‍රිය කුසල ධර්මයන් සඳහා හේතුවන බව මෙයින් පැහැදිලිවේ.මේ සියල්ල සිත හා වර්ධනය කරගන්නා දහම් ප්‍රතිපදාව තුළින් ලැබෙන ජයග්‍රහණය ''මහා සයුරට'' උපමා කළ උතුම් වූ ''නිර්වාණය'' බවත් මෙම කවිය මගින් ලබාදෙන පැහැදි අර්ථය වනු ඇත.

**ඒ.මුණසිංහ**

# භික්ෂුණී ශාසනය ආරම්භය



බුද්ධ වර්ෂ ක්‍රමයෙන් නම් අටවෙනි පොහොය උඳුවප් පොහොය වේ. ව්‍යවහාර මාස ක්‍රමයෙන් 12 වෙනි පොහොය උඳුවප් පොහොයයි. කාන්තාවන්ට විමුක්ති මාර්ගය උදා කළ පොහොය උඳුවප් පොහොය වේ.

පෞරාණික භාරතයේ රජුවූ බ්‍රාහ්මණ මති මතාන්තර අනුව ජාතික හෝ ආගමික නිදහසත් අහිමි වූ පිරිසක් ලෙස කාන්තාවට ස්වතන්ත්‍රව සමාජයේ හැසිරීම වාරණය වී තිබිණි. පවුලේ කුළුඳුල් දරුවෙකුව දූරියක උත්පත්තිය පවා අනර්ථයකැයි සැළකූ ස්ත්‍රිය වැන්දඹුවක වන්නේ නම් සති පූජා කළ යුතු යැයි ඇදහූ යුගයක් විය එදවස.

එවන් පසුබිමෙක කාන්තා නිදහස සාක්ෂාත් කරමින් අප බුදුපියාණන් වහන්සේ භික්ෂුණී ශාසනය පිහිටුවීමෙන් විමුක්ති මාර්ගය හිමි කර දුන්නේ මේ උඳුවප් පොහෝ දිනකය. බුද්ධත්වයෙන් පස්වැනි වසරේදීය. මහා ප්‍රජාපතී ගෝතමී, ඛේමා, නන්දා, යශෝදරා ඈ රාජකීය කාන්තාවන් සසුන් ගතව භික්ෂුණී ශාසනය පිහිටවනු ලැබුවද වත්මනෙහි එය ඒකාන්තයෙන් පිළිගැනීමට මැලිවීම කෙසේ සාධාරණීය කළ යුතුද යන්න ප්‍රශ්නකාරීය.

අනුබුදු මිහිදු හිමිපාණෝ ශ්‍රී ලංකාද්වීපයට වැඩමවීමෙන් දෙරටක

**ලෝකවාසී බොදුනුවන්ගේ අතීතය පරම පූජනීය පාරිභෝගික වස්තුව වූ ජයසිරි මහා බෝධීන් වහන්සේ මෙරටට වැඩම කළ මහ පොහොය ද ඒ උඳුවප් පොහොය වේ. ශ්‍රී ලංකාවාසී කාන්තාවන්ගේ විමුක්ති මාර්ගය පසක් වූයේ අනුලා දේවියගේ පැතුම පරිදි පැවිදි වීමට අවසර ලැබුණ වැදගත්ම සිද්ධිය සංඝමිත්තා තෙරණියගේ සම්ප්‍රාප්තියයි.**

රාජ්‍යත්වය වඩාත් ස්ථාවර වත්මන් දඹදිව අශෝක අධිරාජ්‍යයා සහ දේවානම්පියතිස්ස නරපතියාත් රජකරන සමයකය. එදවස වුවද මෙරට කාන්තාවන් නිදහස් වූයේ දේශීය කාන්තාවන් පන්සියයක් දහම අසා පැවිදිවීමට කැමැති වන්නේද මෙහි නැත.



එසේ වුවද ඒ වෙනස තුනී කෙරුණු සංඝමිත්තා මහා තෙරණින් වහන්සේගේ ලංකාගමනය පරිපූර්ණ වූයේ ද උඳුවප් පොහෝ දිනකය. සංඝමිත්තා තෙරණින් වහන්සේගේ ලංකාගමනය හිස් අතින් වූවක් නොවේ. ලෝකවාසී බොදුනුවන්ගේ අතීතය පරම පූජනීය පාරිභෝගික වස්තුව වූ ජයසිරි මහා බෝධීන් වහන්සේ මෙරටට වැඩම කළ මහ පොහොය ද ඒ උඳුවප් පොහොය වේ. ශ්‍රී ලංකාවාසී කාන්තාවන්ගේ විමුක්ති මාර්ගය පසක් වූයේ අනුලා දේවියගේ පැතුම පරිදි පැවිදි වීමට අවසර ලැබීමෙනි. එහි වැදගත්ම සිද්ධිය සංඝමිත්තා තෙරණියගේ සම්ප්‍රාප්තියයි.

ප්‍රතිඵලයක් වශයෙනි.

ශ්‍රී ලාංකික ස්ත්‍රී වර්ගය තුළ අපරිමිත වෙනසක සන්ධිස්ථානය සඟමිත් තෙරණින් වහන්සේගේ සම්ප්‍රාප්තිය සනිටුහන් කරයි.

එසේ ඇරඹුණ සිරිලක භික්ෂුණී ශාසනයේ තෙරණින් වහන්සේ වරෙක චීන දේශයේ භික්ෂුනී ශාසනය පිහිටුවීමට ද පෙරමුණ ගත් වග ශාසන ඉතිහාසය පෙන්වා දෙයි. එසේ වැඩම කළේ දේවසාරා තෙරණින් වහන්සේය.

සමසක් වැනි කෙටි කාලයකින් අනුලා දේවියගේ සසුන් ගතවීමෙන් මෙරට ඇරඹී භික්ෂුණී සංඛ්‍යාව හතලිස් දහසක ඉක්මවූ බවද දැක්වේ. දුටුගැමුණු රජ දවස මිරිසවැටි පූජෝත්සවයට භික්ෂුණීන් වහන්සේ අනූදහසක් සැපත් වූ බවද වංශකථාවේ දැක්වේ.

රුවන්වැලි සෑ රඳුන්ගේ සමාරම්භක උත්සවය දා පියදස්සී තෙරණින් වහන්සේ දෙසූ දහම් සූත්‍රය ඇසූ දහ හතර දහසක් කාන්තාවන් ධර්මාවබෝධය ලැබූ වග **මහා වංශයේ 29 වන පරිච්ඡේදයේ** පෙන්වා දෙයි. **මහිලා, ගිරිකාලී, දාසී, සමණා** ආදී වූ භික්ෂුණීන් වහන්සේ පස් නමක් රුහුණේ සිට අනුරාධපුරය වැඩ කර විනය ඉගැන්වූ පුවත දීප වංශයේ දැක්වේ.

බැමිණිටියා සාය පැවැති යුගයේ පවා උන් වහන්සේ ශාසන උන්නතිය වෙනුවෙන් පෙනී සිටියහ. පොලොන්නරු යුගයේ මහා මල්ලක නම් වූ භික්ෂුණී ආශ්‍රමයක් සිව්වන මිහිදු රජතුමා වසින් කරවා පූජා කරන ලද බවද දැක්වේ.

එසේ නම් භික්ෂුණී සසුන අපේ රටෙන් අතුරුදහන් වීමේ ඛේදවාචකය කුමක් වුවද අද වන විට මෙරට කාන්තාවන් අත්පත් කරගත් වරප්‍රසාද බොහෝය. රජයේ රැකියාවන්ට පමණක් නොව දේශපාලනයට ද කාන්තා සහභාගිත්වය ප්‍රවර්ධනයට ඉඩකඩ හිමිය.

එසේ නම් **රංගිරි දඹුලු රජ මහා විහාරය මුල්කොට ගෙන පූජ්‍යපාද ඉනාමලුවේ ශ්‍රී සුමංගල හිමිපාණෝ ප්‍රමුඛ එම සංඝ සභාව යළි භික්ෂුණී ශාසනය පිහිටුවීමට ගත් මුලිකත්වය අතිශය සාධනීය පියවරක්ම බව සිහි කටයුතු එය අප රජ දවස භික්ෂුන් වහන්සේට ලැබුණ තැන ගෞරවය යළිත් එලෙසම සිදුවිය යුතු අතර එය අවප්‍රමාණ කිරීමට යම් යම් අංශවල අදහස් කර පරිශ්‍රමයක් දරත් නම් එය මඟහැරවීම මගින්ම පමණක් භික්ෂුනී සසුන සුරක්ෂිත කරවීම උතුම් ක්‍රියාවකි.**

දිවයින පුරා විහිදී සිටින තෙරණීන් වහන්සේ නිස්සරණාධ්‍යාසයෙන් සිදුකරන ශාසනික සාමාජික මෙහෙවර පිළිබඳ අධ්‍යනයක යෙදීමට කාලෝචිතය. බුදුන් වහන්සේ පිහිටුවා වදාළ භික්ෂු, භික්ෂුනී, උපාසක, උපාසිකා හතර වර්ගීකරණය චිරාත්කාලයක් සසුනේ පැවැත්වීමට හේතුවේවා.

ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදී
පියදාස රත්නසිංහ

# පුද්ගල පෞරුෂත්වයට බලපාන කලාව හා සංගීතය

සරලව පැවසුවහොත් පුද්ගල ආකල්ප, චිත්තවේග හා චර්යාව යම් ගැටළුවක් කෙරෙහි නිසියාකාරව කළමනාකරණය කරගැනීම පෞරුෂය වේ. එසේ නිසියාකාරව කළමනාකරණය කර ගැනීමට නොහැකි වීම මනස මත තීරණය වේ. මනස අතිවිශේෂ වේ.

මානසික ආබාධ සම්බන්ධ වෛද්‍ය නාමය Psychosis ය. මානසික ආබාධ යන්න අද වන විට ලෝකය පුරා ආන්දෝලනයට ලක්වූ මාතෘකාවක් බවට පත්ව තිබේ. සම්බන්ධයෙන් නිශ්චිත විනිශ්චයක් දීමට විද්‍යාව වුවද සමත්ව නැත. මනස සම්බන්ධ ආබාධයන්හි ගැඹුර සොයා ගැනීමට වෛද්‍ය පර්යේෂණ වෙර දරන අතර බෞද්ධාගම තුළ බොහෝ තැන්හි මේ සම්බන්ධ කතිකාවක් සිදුව තිබේ. එහි ගැඹුර දක්වා තිබේ. මනස සම්බන්ධ අර්ථ කථනය වනුයේ අපගේ දැනුම, විශ්වාස, අප තුළ ඇති අගයන් උද්වේගයන් අනුවය. පුද්ගල පරිපූර්ණත්වය සඳහා විද්‍යාව, කලාව, ආගම මහත් පිටුවහලක් වේ. ආගම, කලාව, සංස්කෘතිය, සාමාජීය බලපෑම මත අපගේ ජීවන රටාව ගොඩනැගේ. අපගේ ආවේග නිසා මොලයේ ඇතිවන ජීව රසායනික වල වෙනස්කම් සිදුවේ. මෙම ජීව රසායනික සංයුතියේ ඇතිවන වෙනස්කම් මත ඇතිවන දුර්වලතා අප "මානසික රෝග" ලෙස හඳුන්වයි.

අද තිබෙන කායික මානසික සාමාජීය වාතාවරණය තුළ පුද්ගලයාට මුහුණ දීමට සිදුවන අභියෝග හමුවේ ඉතාමත් සංවේදී ආකාරයෙන් මුහුණ දීම උදෙසා ඔවුන්ගේ මනස ඒකාග්‍රගත කලයුත්තේ කෙසේදැයි යන්න පිළිබඳ විවිධ අධ්‍යනයන් ලොව සිදුවේ.

එසේම ලෝක සෞඛ්‍ය සංවිධානය (World health organization) නිර්වචනයට අනුව සෞඛ්‍ය යනු මිනිසාගේ කායික, මානසික, සාමාජීය හා අධ්‍යාත්මික යන සිව්වැදෑරුම් අංශයන්හි සමබරතාව පැවැත්ම (well being) ලෙස හැඳින්වේ. මෙයින් පුද්ගල පෞරුෂත්වය සමබර කරගැනීම උදෙසා මානසික හා ආධ්‍යාත්මික සමබරතාව අතිශය වැදගත් වේ. පුද්ගලයා චිත්තාවේගික ප්‍රජානනික (logical thinking) සහ සාමාජීය වශයෙන් සමබරවීම අතිශය වැදගත් වේ. මෙහිදි කලාවෙහි එක් අංශයක් වන සංගීතය හමුවෙහි විශාල කාර්යය භාරයක් සිදුකළ හැකි බව අද වන විට ලෝකය පිළිගනිමින් පවති. මිනිසුන්ට සමාජයට නුපුරුදු නමුත් අනෙකුත් චිකිත්සක ක්‍රම ශිල්ප අභිබවා ඉදිරියට එමින් පවතින හා සාර්ථක ප්‍රතිඵල ලගාකර දෙන්නාවූ ලෝකයේ අනෙකුත් රටවල ඉතාමත් සාර්ථක ලෙස භාවිතා කරන සංගීතය මඟින් රෝග නිවාරණය සංගීත චිකිත්සාකරණය අද "Music for the mind" මනස සඳහා සංගීතය වශයෙන් ආකර්ශනීය තත්වයක් ලගාකර ගෙන තිබේ.

ලෝකය ඇතුළු ලාංකේය සමාජය සීග්‍රයෙන් සමාජ ආර්ථික වෙනස්කම් වලට ලක්වේ. මෙහිදී පුද්ගලයාට පෞද්ගලික වශයෙන් මෙන්ම පවුල් වශයෙන්ද ගැටළු ඇතිවේ. විවෘත ආර්ථිකයත් සමඟ මිනිසා බොහෝ පරිවර්තනයන්ට ලක්විය. මුල්කාලයේ පැවතුන විස්තෘත පවුල් ක්‍රමය (Extended family) තුළ පවුල් සංස්ථාව තුළින්ම ගැටළු විසඳා ගැනීමේ ක්‍රමයක් පැවතුන අතර දරුවන් මානසික වශයෙන් බිඳ වැටීමකට ලක් නොවුනි. නමුත් න්‍යෂ්ටික පවුල් (Nucler family) බිහිවීම තුළ ගම සමඟ ඇති බැඳියාව නැතිවී යාම සමඟම මව, පියා, දරුවන් වෙන් වෙන් වශයෙන් ජීවත් වීමට පුරුදු විය. යම් යම් අවස්ථාවල දරුවන් දිවා සුරැකුම් මධ්‍යස්ථාන (Day care center)වලද මව පියා කාර්යය බහුල බැවින් ආදරය, සෙනෙහස අහිමි වීම මතද යම් යම් මානසික හා පෞරුෂමය දුර්වලතා පෙන්වයි. විවෘත ආර්ථිකය අනුව සැකසුනු අධ්‍යාපනය තුළ දරුවා පීඩනයට පත් වීම සාහිත්‍ය, කලාව, සෞන්දර්ය, ඉතිහාසය, ආගම වැනි අධ්‍යාත්මය සමඟ සම්බන්ධ විෂයන් වලින් දුරස් වීම යන හේතු මත මානසික සහනය සඳහා වෙනත් මාධ්‍යයන් කෙරෙහි අවධානය යොමුකිරීම දක්නට ලැබේ. සියළු දේවල් විද්‍යාත්මකව ඔප්පලු කළ යුතුයැයි සලකන, සිතන පරිසරයක් තුළ බිඳුණු පවුල් සංස්ථා, අන්තර් පුද්ගල සංස්ථා බිඳවැටීම්, එම නිසා අන්‍යයන්ට ගෞරව නොකිරීම යනාදිය වර්ධනය වීම හා යහපත් අන්තර් සම්බන්ධතා උදෙසා අවශ්‍ය වන සියුම් මානසික සම්බන්ධතා වලින් පුද්ගලයන් සීග්‍රයෙන් ඈත්වීමට දක්නට ලැබේ. එසේම පුද්ගල ජන විඥානය වෙනස් කිරීම විෂයෙහි ජන මාධ්‍යය විශේෂ බලපෑමක් සිදු කරයි. මේ ප්‍රතිඵල මත පුද්ගලයා තුළ "මානසික පීඩාව" (Stress) ඇතිවීම.

මෙහි අවසානය සාම්ප්‍රධායික ක්‍රම ශිල්ප මඟින් පිළිසරණක් නොමැති තැන විවිධ දර්ශන වල හා අදෘශ්‍යමාන ක්‍රම ශිල්ප කෙරෙහි පිහිට පැතීය. එහෙත් මෙම පැතිකඩයන් නිරවුල් කරගැනීම උදෙසා කලාව බොහෝ සේ ඉවහල් වනබව අදවන විට පිළිගෙන තිබේ. එබැවින් කලාව උපයෝගි කොට ගෙන බොහෝ උපදේශන හා චිකිත්සන ක්‍රම භාවිතය සීග්‍ර වේ.

අද ලෝකයේ පවතින සෑම වෛද්‍ය ක්‍රමයකම ප්‍රධාන මතය වන්නේ පුද්ගලයාගේ නිරෝගි භාවය සදහා මානසික සුවය ඉතාම අත්‍යවශ්‍ය බවයි. සීග්‍රයෙන් වර්ධනය වන මානසික හා කායික ප්‍රශ්න අද ලෝකයටම ප්‍රශ්නයක් වී පවති. අදවන විට පෙරදිග වෛද්‍ය ක්‍රම පිළිබඳ පවත්නා විශ්වාසය වර්තමානය වන විට වැඩිවෙමින් පවති. මෙහිදි ආයුර්වේද වෛද්‍ය ක්‍රමය කෙරහි පවත්නා විශ්වාසය වැඩිය.

ආයුර්වේදයේ චාරක සංහිතාවේ "සිද්ධි ස්ථානම්" නම් කොටසේ සංගීතය ඉතාමත් සාර්ථක රෝග නිවාරණ ක්‍රමයක් හැටියට හඳුන්වයි. සංගීතය එක එල්ලේම ඖෂධයක් නොවුනත් එය මඟින් ශරීරයේ දේහ ප්‍රකෘති තුළ විශාල වෙනසක් කිරීමේ හැකියාව පවති.
ආයුර්වේදයට අනුව පුද්ගල මනස රාජසික, තාමසික, හා සාත්වික වශයෙන් කොටස් තුනකට බෙදා දැක්විය හැක.

1. රාජසික - ආශාවන් වැඩි, ශරීරය පින වීමට කැමති.
2. තාමසික - අඳුරේ සිටිනවා වැනි, කිසිම දෙයක් ගණන් නොගෙන ඉන්න මනස.
3. සාත්වික - මනස පාලනය කරගනිමින් මධ්‍යස්ථව ක්‍රියා කරවීම.

මෙහිදි රාජසික, තාමසික තත්වයන් මිනිසාට විවිධ රෝග හා පීඩා ඇති කරයි. මේවා "මානස්ථ දෝශ" නම් වේ. මෙසේ ආශාවන්, හැගීම් පාලනය කොටගත නොහැකි වීම මෙන්ම සමාජ, ආර්ථික, මානසික, කායික වටපිටාව ඔරොත්තු නොදීමද පෞරුසමය දුර්වලතාවයක් වේ. එසේම පුද්ගල පෞරුෂය ගොඩනැගීම උදෙසා මානසික යහපැවැත්ම කෙතරම් දුරට බලපාන්නේද යන්න පිළිබඳව බෞද්ධ ධර්මය තුළද මානව පැහැදිලි කොට තිබේ.

ලෝක ධර්මයෙන් මඩනා ලද යමෙකුගේ සිත නොසැලේද ශෝක රහිත වේ. නිර්මල වේද, බිය රහිත වේද එය උතුම් මංගල කරුනකි.

(මංගල සූත්‍රය)

පුද්ගල යහපැවැත්ම උදෙසා පහත සඳහන් කාරණා අතිශය වැගත් වේ.

මානසික යහපැවැත්ම - මානසික රෝග නැති බව, බොහෝ අත්දැකීම් වලට නම්‍යශිලී ලෙස ප්‍රතිචාර දැක්වීමේ හැකියාව හ ඒවා හඳුනා ගැනීම.

කායික යහපැවැත්ම - මේ සඳහා රෝග වලින් තොරවීම.නිසි පෝෂණය, සක්‍රිය අගයෙන් ක්‍රියාත්මක වන ශරීරයක් පිහිටීම.

සාමාජීය යහපැවැත්ම - තමා තුළ වෙන් වෙන් වශයෙනුත් අනෙක් පුද්ගලයන් සමගත් සමාජය සමගත් ඒ ඒ පුද්ගලයින් හා සෙසු ලෝකයා සමඟත් එකමුතු සහජීවන සම්බන්ධයක් පැවැත්වීමට ඇති හැකියාව.
මෙහිදී සුබවාදි මනුශ්‍ය පරිසරයක් ගොඩනැගීම, සුභවාදි ආර්ථික තත්වයක් ගොඩනැගිම කෙරෙහිද අවධානයට ලක්වේ.

මෙහිදි විශේෂයෙන්ම 20 වන සියවස ආරම්භයේ සිටම බොහෝ විට 1900 ගණන් වල සිට පුද්ගලයා විවිධ සමාජ පසුබිම් තුළ විවිධ රැකියා සඳහා මෙම ආර්ථික, සමාජීය, දේශපාලන හා සංස්කෘතික පරිසරය තුලසිට යෙදීම. ඔවුන් රැකියා ගත වූ විට විවිධ ගැටළු සහගත තැන් මතුවේ.

1.රැකියාවට තෝරා ගැනීම
2.රැකියාවේ රැදී සිටීමට නොහැකි වීම.

මේ නිසා රැකියා අතහැර යාම් හා මානසික තෘප්තිමත් භාවයකින් තොරව කරන්නන් වාලේ රැකියාවේ නියුක්ත වීම දක්නට ලැබිණ. මෙහිදි මාර්ග උපදේශය, පෞරුෂ වර්ධනය (Training Programes) ආදි වශයෙන් බොහෝ අනුශාඛාගත විෂයන් බිහිවීම තුළින් මෙම අර්බුදකාරි තත්වය විසදීමට උත්සහ ගැනීම. පෞරුෂ ගුණාංගයන්ට ගැලපෙන රැකියා තෝරා දීම. චින්තනය වෙනස් කිරීම මඟින් පෞරුෂමය හා හැකියාවන්ට ගැලපෙන රැකියා ලබාදිම අරමුණු කරගැනීම. මෙහිදී

1.රැකියාවට යන පුද්ගලයා විශ්ලේෂණය කිරීම
2.වෘත්තිය විශ්ලේෂනය කිරීම.
3.පුද්ගලයා හා වෘත්තීය විශ්ලේෂනය කිරීම.

මෙහිදි සංගීත චිකිත්සාකරණය හා උපදේශනය පනදනම් කොටගෙන තරුණයාට, ශිෂ්‍යයාට පාසල හා ජීවන බලවේග ජය ගැනීම උදෙසදා වඩාත්ම වැදගත් වන "මනස" මූලික කොට ගෙන යොදා ගනු ලබන අත්හදා බැලීම් වඩාත් සාර්ථක වී ඇතිබව දැනට කරන ලද පර්යේෂන මඟින් තහවුරු වී තිබේ.

පෞරුෂමය දුර්වලතා සතු තරුණයා තුළ දක්නට ලැබෙන ගති ලක්ෂණ

1 Dipressed Mood - ජීවිතය එපා වීම, උදාසීන බව, කලකිරීම.
2 Insomnia Initial - ඇඳට ගිය විට පැය ගණන් නින්ද නොයෑම.
3 Insomnia Dilayed - පාන්දර යාමේ ඉතාමත් කලින් අවදි වීම.
4 Work Ivgrest - වැඩකිරීමට ඇති උදාසීන බව
5 Relardation - මලානික බව
6 Agitation - ඉක්මන් කෝපය
7 Anxiety - (අනාගතය,විවාහය,ජීවිතය,ග්‍රහඅපල) තැතිගැන්ම බිය
8 Somatic Geraral - ශරීරයේ බර බවක් තිබීම
9 Loss of wight - බර අඩුවීම
10 Genital Sexual About - ලිංගික හා අර්තව ප්‍රශ්ණ

Courses

මෙවැනි පෞරුෂමය දුර්වලතා නැතහොත් මානසික ප්‍රශ්ණ නැති කිරීම මෙසේ දැක්විය හැකිය.

1. Treatment - ප්‍රතිකාරය
2. Prevention - නිවාරණය
3. Personal Development - පුද්ගල සංවර්ධනය.

සිතුවිලි අසමතුලිත වුවහොත්, මනස ව්‍යාකූල වුවහොත්, චර්යාව (Behaviour) අසමතුලිත වේ. මනස වියවුල් වලින් තොර නම් චර්යාව තුළින් එය පෙන්වයි. ඇත්තෙන්ම ප්‍ුගලයා යනු මනසයි. පුද්ගල ක්‍රියාකාරිත්වය යනු මනසේ ක්‍රියාකාරිත්වයයි. සංවිඥානය ලෙෂ හදුන්වන්නේ උඩුසිත හෙවත් අවධිමය මනසයි. මේ මනසේ ඉතා කුඩා කොටසකි. එදිනෙදා ජීවිතයට මෙය ඉතා වැගත් වේ. පූර්ව සවිඥානය ලෙස අපේ ආසන්නම මතකයන් හදුන්වයි.

අවිඥානය වූ කලි මනසේ විශාලම කොටසය. පුද්ගල ගැටලු වලට හේතුව වනුයේ අවිඥානයයි. මෙම අවිඥන අත්දැකීම් පුද්ගලයාගේ උපත දක්වාම දිවේ. ඇත්තෙන්ම පුද්ගල ක්‍රියාකාරිත්වය යනු අවිඥනයේ ක්‍රියා කාරිත්වයයි. මෙහිදී මතකය ගිලිහී නොයයි. මේවා අවරෝධනය (repression) වේ. අප ලබන පීඩාකාරී දෑ

15 පිටුවට...

**රෂිකා රෝශිනි සමරවීර**


බෞද්ධ සාහිත්‍යයෙහි එන ථේරී ගාථා ඇසුරෙන්...
භද්‍රා කුණ්ඩලකේශී
සැකසුම හා චිත්‍ර
3
...තව දින දෙකකින් මොහුගේ හිස ගසා මරා දැමීමට නා... නියම කරමි.. එතෙක් මොහු මේ.. වීදි දිගේ රැගෙන ගොස්.. සිර ගෙයි දමනු....
..එමෙන්ම.... මොහුව මරා දමන බව දන්වා මුළු රට.. පුරාම... අණබෙර කරුවන්.. පිටත්කර හරිනු...
අසව්.. අසව්.. බරපතල සොරකමක් කර හසුවූ පුරෝහිත පුත් සත්තුකව තව දින දෙකකින් හිස ගසා.. මරා දමනු ඇත.
ඩං ඩං.. ඩං.
ඕ්.. අසව්.. අණබෙර කාරු.. කියනදේ.. දැන් බය සත්තුකව වීදි දිගේ අරගෙන එයි.. හැමෝටම පේනිය..
අහෝ... පුරෝහිත තුමාගෙ පුතුයා.. මෙතරම්.. සිටු සම්පත් තිබිලත් ඇයි බොහු.. මෙවන් සොරකමක් කර පෙළඹුනේ....
කරුමෙ තමයි
රාජ අණ පරිදි හිස ගසා මරා දැමීමට නියම වූ සත්තුකව.. වද බෙර ගසමින් සෙබළුන් විසින් රජගහ නුවර වීදි දිගේ රැගෙන යමින් සිටියා.....
ඩං... ඩං...
..ඩං... ..ඩං... ඩුම.. ඩුම..




# ප්‍රේමයේ හා ජීවිතයේ අරුත කියාදෙන සොඳුරු ගීතයක්

රාත්‍රිය සිර ගෙයක්
අන්ධකාරය රුදුරු දඬුවමක්
ප්‍රේමයේ වරද කළ
පරාජිත පෙම්වතුනි,
නුඹලාට රාත්‍රිය සිරගෙයක්
අන්ධකාරය රුදුරු දඬුවමක්.....

නින්ද විඳි කෙනෙක් නම් ඔබ
දැකිය යුතුම වේ සිහිනයක්
ආදරය කළා නම්
පහන් කළ යුතුය නිදි නැති රැයක්

හදවතක් තිබුණි නම්
තිබිය යුතුම වේ ඔබට ප්‍රේමයක්
ප්‍රේමයක් තිබුණු තැන
සැඟව ඇති සදතනික ශෝකයක්.

**ගේය පද - රජී වෙල්ගම**
**සංගීතය හා තනුව - දර්ශන රුවන් දිසානායක**
**ගායනය - අමරසිරි පීරිස්.**



අමරසිරි පීරිස් මහත්මා

"ප්‍රේමතෝ ජායතී සෝකෝ - ප්‍රේමතෝ ජායතී භයං
ප්‍රේමතෝ විප්පමුත්තස්ස - නත්ථි සෝකෝ තොභයං"

යන බුදු වදන අප කොතෙකුත් අසා ඇත්තෙමු. එහෙත් අප කිසිවෙකුත් ජීවිතයේ වූ බැඳීම් වලින් මිදෙන්නට උත්සහ නොකරන්නෙමු. ඇලීම්,බැඳීම්,ගැටීම් පුහුදුන් මිනිස් සිතේ ස්වභාවයයි.

දරක ප්‍රේමය හැරුණු විට අප සිත් තදින් බැඳෙනුයේ ස්ත්‍රී පුරුෂ ප්‍රේමයේදීය. අපගේ සිත් සසල කරවන්නට එය සමත්ය. ස්ත්‍රී පුරුෂ ප්‍රේමය හඳවතට පිවිසුන විට ජීවිතය ප්‍රබෝධයෙන් සැනසීමෙන් පිරී යයි. නැවුම් බලාපොරොත්තු වලින් පිරී යයි. එහෙත් ප්‍රේමය බිඳ වැටුණු විට ජීවිතය වාලුකා කතරක් බවට පත් වෙයි. පෙර ගත කළ ජීවිතය සම්පූර්ණයෙන් උඩු යටිකුරුව ඇතැම් විට මානසික රෝගීන් පවට පත් වෙති. ඇතැම්හු පීඩනය දරාගත නොහැකිව ජීවිතයට සමුදෙති. ප්‍රේමය අප විසින්ම අපටම කරගනු ලබන්නාවූ වරදක් බව වැටහෙනුයේ තරුණ ජීවිත අකාලයේ විනාශයට පත් වන විටය.

ජීවිතයේ කොතෙකුත් පරාජයන්ට මුහුණ දුන්න ද ප්‍රේමයේදී ලබන්නාවූ පරාජය දරා ගත නොහැක්කකි.

රාත්‍රිය මිනිසාට මහත් සුවයක් ගෙන දෙන්නකි. අවිවේකී ගතටත් සිතටත් සුවයක් ලබා දෙමින් මිනිසුන් නිදි සුව වැළඳ ගනිති. එහෙත් පරාජිත පෙම්වතුන්ට පෙම්වතියන්ට අවිවේකී දහවලට වඩා විවේකී රාත්‍රිය මහත් වධයකි. රත්‍රිය ගුප්ත බව නිහැඬියාව තුළ මොවුන්ගේ සිත් තව තවත් වේදනාවට පත්වේ. හදවත පාරවන ප්‍රේමණීය මතකයන් විවේකී සිත තුළට නිරායාසයෙන් ගලා එයි. මේ සිතුවිලි ගලා ඒම නතර කළ හැක්කක් නොවේ. එය සිතේ ස්වභාවයයි. නිරායාසයෙන් සිතට පිවිසෙන්නාවූ සිතුවිලි දමය පරිජිත පෙම්වතුන්ගේ නින්ද අහිමි කරයි. පරාජිත පෙම්වතුන්ට පෙම්වතියන්ට රාත්‍රිය සිරගෙයක් වන්නේ එහෙයිනි.

නිදිසුව විඳින්නෙකු සිහිනයක් දැකීම සාමාන්‍ය දෙයක් සේම ප්‍රේම කළා නම් අපට විරහ වේදනා ලැබීමද සාමාන්‍ය දෙයකි. එසේනම් ප්‍රේමය නිසා අප ජීවිතයෙන් පලායා යුතු නැත.
වෛරයෙන් පීඩිතව අනෙකාගෙන් පළිගත යුතු නැත.

රජීගේ පද වැල මතු පිටින් රස විඳින්නෙකුට හමුවන්නේ පරාජිත පෙම්වතුන්ට විරහව උපේක්ෂාවෙන් දරාගන්නට දෙනු ලබන උපදේශයකි. එහෙත් එහි සැඟවුණු ගැඹුරු අරුත් සොයා යන්නෙකුට ප්‍රේමය පරාජිත පෙම්වතුන්ට පමණක් නොව පුහුදුන් සියලු මිනිස් වර්ගයාට අපගේ ජීවිතය පිළිබඳ වූ සනාථන සත්‍යයක් හමුවෙයි.

රාත්‍රිය නිහඬය, නිශ්චලය, ගුප්තය. එහි අඳුර විනිවිද නොපෙනේ. රාත්‍රිය යන්නෙන් සංසාරය නිරූපනය වේ. සංසාරයේ ඉමක් කොනක් නැත. තෙරක් නොපෙනෙන සංසාරය පිළිබඳ නිශ්චිත අනාවැකියක් කිව නොහැක. මේ ආත්ම භාවයෙහිදි මිනිසෙකුව උපදින අප ඊළඟ භවයේ මිනිසෙකු වේද? නැත්නම් තිරිසන් සතෙකු වේ දැයි කිව නොහැක. කොපමණ දුක් පිඩාවන්ට මුහුණ දෙන්නට සිදුවේදැයි කිව නොහැක. එබැවින් සංසාරය සිරගෙයකි. බුදු රදුන් අනේක ජාති සංසාරං" ලෙසින් උදන වාක්‍ය ප්‍රකාශ කළේ සංසාරය නැමති ගෙය සාදන්නාවූ තෘෂ්ණාව ප්‍රහීණ කළ නිසාවනි.

**දීඝා ජාගරතෝ රත්ති - දීඝං දීඝං සන්තස්ස යොණං**

**දීපෝ බාලානං සංසාරො - සද්ධම්මකං අවිජානනං"**

යනුවෙන් බුදුරදුන් දේශනා කළ ගාථාවේ අරුත වන්නේ නිදි මරන්නාට රාත්‍රිය දිගය. ගමනක් ගොස් වෙහෙස වූ පුද්ගලයාට යොදුනක දිගය. සද්ධර්මය නොදන්නාවූ මෝඩයාට සසර දිගය යනුවෙනි.

බෝධි චර්යාවතාර සූත්‍රයේ ශාන්ති දේවයෙන් මෙලෙස කියයි.

"වැල්ලෙන් තැනූ ගෙය
කඩා වැටුණා සිටි ඇසිල්ලේ
නොහඬව මෝඩ කොලු
වැලි ගෙවල් වල සැටි එහෙමයි
දැන ගනු නම් යෙහෙකි,
කිත් පැසසුම් ද එලෙයසි"

ප්‍රේමය යනු බැඳීමකි. එය තෘෂ්ණාවකි. තෘෂ්ණාව වැලි ගෙයකි. කැඩෙන බිඳෙන බව දැන දැනම වැලි ගෙවල් සාදන්නාවූ අපි මෝඩයන් නොවේද?

ගීතයේ දෘශ්‍යමාන වන මතු පිට අරුන පිළිබඳව යළිත් විමසා බැලුවහොත් සැබෑ ආදරයක් කළ හැක්කේ බුදු, පසේ බුදු, මහරහත් ආදී නිර්ක්ලේශී පුද්ගලයන්ට පමණකි. එමෙන්ම එය එක් පුද්ගලයෙකුට පමණක් සීමාවූවක් නොවේ. මුළු මහත් විශ්වයටම පැතිරුණකි.

පුහුදුන් මිනිසුන් වන අප ප්‍රේම කරනුයේ අයත් කර ගැනීමේ ආත්මාර්ථයෙන් යුතුවයි. වේදනාවක්, දොම්නසත් ඇතිවන්නේ තමාට ඔහු හෝ ඇය අයත් කර ගැනීමට නොහැකි වූ නිසාය. නැතිනම් තමන් විසින් අයත්කර ගන්නට ප්‍රාර්ථනා කළ තැනැත්තා තවත් කෙනෙකුට අයිති වීම නිසාය.

සැබෑ ප්‍රේමය තුළ තිබිය යුත්තේ පරිත්‍යාගයයි. අප සැබවින්ම යමෙකුට ආදරය කළා නම් ඔහුගේ හෝ ඇයගේ වෙන්වීම වෙනුවෙන් අපි කඳුළු හෙළිය යුතුනොවේ.ප්‍රිය විප්‍රයෝගය හදවතේ දරාගෙන නිහඬව සිටින්නා පරිත්‍යාගශීලී ප්‍රේමවන්තයෙකු ලෙස නම් කළ ද, ඔහු හදවතින් වේදනා විදියි. මෙලෙස වේදනාවක් ඇතිවන්නේ තෘෂ්ණාව නිසාවෙනි. එසේ නම් පෘථග්ජන මිනිසාට කෙදිනකවත් සැබෑ ප්‍රේමයක් කළ නොහැකිද? තෘෂ්ණාව, බැඳීම්, ආර්මාර්ථය නසන තුරු අයත් කර ගැනීමෙන් තොර සදකාලික සර්ව සම්පූර්ණ සැබෑ ප්‍රේමයක් අපට වින්දනය කළ නොහැක.

රජී, වසන්ත වෙවල්ගමයන් ගේ ගී පද රචනාව ස්ත්‍රී පුරුෂ ප්‍රේමයෙන් ඇරඹී ජීවිතයේ ගැඹුරු අරුත් සොයා ගමන් කරයි. දෘශ්‍ය අරුතින් ඔහු අපට පවසන්නේ ප්‍රේම කළ අයෙකුට විරහව විඳින්නට සිදුවීම අති සාමාන්‍ය අත්දැකීමක් බවයි. එය සකල ප්‍රේමවන්තයින්ට පොදු වූ කරුණකි. එබැවින් විරහව උපේක්ෂාවෙන් දරාගත යුතු බව අපට හැඟේ.

ගීතයේ සැඟවුණු අරුත තුළ අප දකින්නේ තෘෂ්ණාව සංසාරය පිළිබඳව බුදුරදුන් දෙසූ බෞද්ධ දර්ශනයේ සාරයයි. එකම ගීතයක් තුළින් බහු අරුත් නන්වමින් රජී, අප අන්ධකාරයෙන් ආලෝකය වෙත රැගෙන යයි. ආනන්දයෙන් ප්‍රඥාව කරා රැගෙන යයි.

දර්ශන රුවන් දිසානායකගේ තනුව හා සංගීතය ගීතයේ අරුත් මැනවින් අප හඳ තුළ රඳවන්නට සමත් විය. අමරසිරි පිරිස්ගේ මධුර වූ දර්ශනික හඬ ගීතය තුළ අපසිත ඒකාත්මික කරයි.

චාමිකා ජනානි ද සිල්වා

# සඝමිත් තෙරණීන් වහන්සේ මෙරටට වැඩමකළ ජය ශ්‍රී මහබෝධීන් වහන්සේ

සීතල උඳුවප් මාසයේ පුර පසළොස්වක පෝය දින උඳුවප් සඳ නැගී එන ගුවනෙහි බබලන කල්හි ඒ සෞම්‍ය සඳවතිය සේ, සදා කල්හි බෞද්ධයන්ගේ සැදැහැති හදවත් තුළ වැඩ වාසය කරන සංඝමිත්තා මහරහත් මෙහෙණින් වහන්සේ මතකයට නැගී එන්නේය. ශ්‍රී බුද්ධ වර්ෂ 236 වැන්නේ එනම් ක්‍රි.පූ. 307 වැන්නේ ශ්‍රී මහබෝධීන් වහන්සේත් වැඩමවාගෙන සඝමිත් තෙරණින් වහන්සේ, දීප වංශයෙහි සඳහන් පරිදි,

01. උත්තරා මහ රහත් මෙහෙණිය
02. හේමා මහ රහත් මෙහෙණිය
03. මසාරගල්ලා මහ රහත් මෙහෙණිය
04. අග්ගමිත්තා මහ රහත් මෙහෙණිය
05. දාමිකා මහ රහත් මෙහෙණිය
06. චේග්ගු මහ රහත් මෙහෙණිය
07. පබ්බතා මහ රහත් මෙහෙණිය
08. මත්තා මහ රහත් මෙහෙණිය
09. මල්ලා මහ රහත් මෙහෙණිය
10. ධම්මදාසි මහ රහත් මෙහෙණිය

යන මහ රහත් මෙහෙණින් වහන්සේලාත් සමඟ මේ රටට වැඩම වන ලදී. ඒ බව බෝධි වංශයේ විස්තරයට අනුව මෙසේ සඳහන් කළ හැකිය.

එනම් ධර්මාශෝක රජතුමා විධුරින්ද නම් රාජ කුමාරයෙකුට පිරිවර සමඟ බෝධින් වහන්සේ ආරක්ෂා කිරීමට නියම කලේය. එසේම අටළොස් කුලයක දෙවියන් හට ආරක්ෂාව රැකවරණය ලබා දෙන ලෙසද නියම කලේය. දහඅට කුලයකට අයත් 210 ක් වූ පිරිවර ජන සමූහයාද බෝධින් වහන්සේ සමඟ මේ රටට එවන ලදි. ඔවුන්ට පහත සඳහන් තනතුරු පවරා තිබිණි. බෝධි වංශයේ සඳහන් පරිදි එම තනතුරු 24කි. (සුවිස්සකි)

01. කඩුගන්නා තනතුර
02. බමුණු තනතුර (මාහා බෝධියට ශාන්ති කිරීම සඳහා)
03. උතුරු පස්නා තනතුර (මහබෝ මඟුලෙහි රන් ධජ,රිදි ධජ, ආදිය නැංවීම සඳහා)
04. මහවෙළ දනා (සුවඳ දුම් දීම, සුවඳ දුම් ඇල්ලීම)
05. මහබෝ රකිනා (දුනු හී ගෙන බෝධියට බැසිය හැකි කපුටන් ආදි සතුන් එළවීම)
06. සරස්නා (කුඩ ඉහලීමේ තනතුර)
07. කිලිගුණ (අලුත් මල් සැපයීමේ තනතුර)
08. කපුනා (ලද පස් මල් සැපයීම)
09. දොරනා (මහා බෝ ගෙයි දොරටුවෙහි ආරක්ෂා කටයුතු)
10. පෙහෙරකරුණා (පෙරහන්කඩ හා නූල් සැපයීම)
11. කුඹල්කරුණා (පාත්‍රා භාජනාදිය සැපයීම)
12. මල්කරුණා (මල්දම්, මල්වඩම් සැපයීම)
13. ගඳකරුණා (සුවඳ ද්‍රව්‍ය සැපයීම)
14. මහසීනා (ධජපතාක සැපයීම)
15. මුළුරකිනා (පූජාව සඳහා බත් සැපයීම)
16. කඹුරුනා (කතුරු, කියත්පත් කරවීම)
17. ලෝකුරුනා (රන් රිදි කැටපත් සැපයීම)
18. අටකෙලිනා (රන්වැට රිදිවැට හා රන් වළන් සැපයීම)
19. ඇදුරුනා (වියත් මඩුළු, රුවන් මඩුළු කරවන්නා)
20. මුදුන්ත වරුෂා (වියන් කරවන්නා)
21. පැළවානා (හේවිසි පූජා පැවැත්වීම)
22. සත් කරුණා (සේසත් කරවා දීම)



23. උයන්ගොවුවා (මල් රුක් රෝපණය කරවීම)
24. පෙරහර බිසෝ (පැන් වැඩීම) ආදී වශයෙනි.

සුමිත්ත හා බෝධි ගුප්ත යන ශාක්‍ය පුත්‍රයන් දෙදෙනාට රාජකීය ඇඳුම් පැළඳුම් අන්දවා මුසින්ත කුමරාට කුලවාසීන්ද, බෝධිගුප්ත කුමරාට බෝධීන් වහන්සේද ආරක්ෂා කරන ලෙස භාර දුන්හ. බෝධින් වහන්සේට පැන් වඩනු සඳහා රාජ කන්‍යාවන් 04 දෙනෙක්ද රන් කෙන්ඩි 08 ක්ද, රිදී කෙන්ඩි 08 ක්ද දෙන ලදි. ගංගා නදියේ සරසන ලද නැවක බෝධින් වහන්සේත්, සඝමිත් තෙරණියත්, අරිට්ඨ කුමාරයාත්, බෝධිගුප්ත නම් කුමාරයකු ප්‍රධාන කොට ඇති උසස් වංශික කුමාරවරුන්ද නන්වා සෙසු කුල වලට අයත් පිරිස් වෙනත් නැව් වලටද නැන්වීය.

දින 07කින් නැව තාම්රලිප්ත නම් තොටට පැමිණියේය. ඒ එන අතර මගදී නොයෙක් තොටුපල වල හිදී මිනිසුන් මෙන්ම දෙවියන්ද පුද පූජා පැවැත්විය. ධර්මාශෝක රජතුමා විසින් තාම්රලිප්ත තොටෙහිදි නැවත මනරම් මණ්ඩපයක් මත බෝධින් වහන්සේ නැවත දඹදිව රාජ්‍යයෙන් පුදා නැවත සතියක්ම පුද පූජා පැවැත්විය. රජතුමාගේ

> "සඟමිත් තෙරණිය මේ රටට වැඩම වීමේ පළමු අපේක්ෂාව වූයේ ලංකාදීපය තුළ මෙහෙණි සසුන ආරම්භ කිරීමයි. පැවැද්ද ලබනු අපේක්ෂාවෙන් කලක සිට ඊට ඇප කැප වී සිටි අනුලා බිසව ප්‍රමුඛ කාන්තා පිරිස සංඝමිත්තා තෙරණියගෙන් පැවැද්ද ලබා ගෙන නොබෝ දිනකින් කෙලෙස් ප්‍රහීන කලහ."

ස්වර්ණමය වූ සංඛය රාජ කන්‍යාවන් අතටද රිදී සංඛය සිටු කන්‍යාවන් අතටද දී අනවතප්ත දිනක බෝධින් වහන්සේ ඔසවා තම හිස මුදුනෙහි කර වටක් ජලයට බැස නැවෙහි තැන්පත් කරවිය. එසේ කර සෙසු බෝධීන් වහන්සේ රැගත් නැව ලංකාව බලා පිටත් කොට කදුළු සලමින් නැව් පෙනෙන තෙක් මානයේ බලා සිටියේය. බෝධින් වහන්සේ රැගත් නැව මුහුදට පිවිසි කල්හි යොදුනක් පමණ මුහුදු රළ නැතිව ගොස් පස් පියුමින් සුපිපි මලින් අලංකාර වුන අතර අහසෙහි පොළවෙහි වසන දෙවි දේවතාවන් නොයෙක් ආකාරයේ පුද පූජා පැවැත්විය. මේ අතර නාග ලෝකයෙන් පැමිණි නාගයන්ට බෝධින් වහන්සේ ලබා ගැනීමට මහත් ආෂාවක් ඇතිවිය. නාගයින් දසදහස් ගණනක් එකතු වී මුහුදේ රැළි නංවමින් අන්ධකාර කරමින් විෂ දුමක් පිට කළාය. දෙවියන්ටත් බෝධින් වහන්සේ ආරක්ෂාවට පැමිණි සෙන්පතියන්ටත් මේ සිදුවන්නේ කුමක්දැයි සිතා ගන්නට වත් නොහැකි විය. එවිට සඝමිත්තා මහරහත් තෙරණින් වහන්සේ දිවසින් බලා සියල්ල තේරුම් ගෙන ඉතා විශාල ගුරුළු වේශයක් මවාගෙන නාගයන් බිය වද්දවා ඔවුන් මෙල්ල කළහ. නාගයන් සඟමිත් තෙරණින්ගෙන් සමාව ඉල්ලා සතියක් පුද පූජා පැවැත්වීමට බෝධින් වහන්සේ නාග ලෝකයට රැගෙන යාමට අවසර පැතීය. ඒ අනුව බෝධින් වහන්සේ නාග ලෝකයට වැඩම කරවා එහිදි නොයෙනක් ආකාරයෙන් පුද පූජාවන්ට බදුන් විය. ඉන් පසු නැව ලංකාවේ දඹුලු තොට නම් ස්ථානයට ගොඩ බැස්සේය.

දෙවන පෑතිස් රජතුමා නුවර උතුර දොරටුවෙහි පටන් දඹුලු තොට දක්වා මාර්ගය අලංකාර කර චතුරංගනී සේනාව සමඟ දඹුලු තොටට පෙරහරින් ගොස් පංච තූර්ය නාදයෙන් හා මල් සුවද විලවුන් ආදියෙන් පූජා පවත්වා කරවටක් දියට බැස බෝධින් වහන්සේ හිසින් ගෙන අලංකාර මණ්ඩපයක තැන්පත් කර අශෝක අධිරාජයා අනුගමනය කරමින් මුළු ලංකා දීපයම බෝධින් වහන්සේට පූජා කළහ. එහිදී දින 03 ම විවිධ පුද පූජා පැවැත්විය.

.දඹුලු තොට දක්වා මාර්ගය අලංකාර කර චතුරංගනී සේනාව සමඟ දඹුලු තොටට පෙරහරින් ගොස් පංච තූර්ය නාදයෙන් හා මල් සුවද විලවුන් ආදියෙන් පූජා පවත්වා කරවටක් දියට බැස බෝධින් වහන්සේ හිසින් ගෙන අලංකාර මණ්ඩපයක තැන්පත් කර අශෝක අධිරාජයා අනුගමනය කරමින් මුළු ලංකා දීපයම බෝධින් වහන්සේට පූජා කළහ. එහිදී දින 03 ම විවිධ පුද පූජා පැවැත්විය.

අනතුරුව බෝධින් වහන්සේ නැගෙනහිර තිස්ස විහාරය පිහිටි තැනට වැඩම කරවිය. මිහිඳු හිමියන් විසින් උපදෙස් දෙන ලදුව බුදුන්වහන්සේ වැඩ සිටි තැන් වල දා ගැබ් ආදිය පිහිටවනු පිණිස ඒ ඒ තැන්වල බෝධින් වහන්සේ මඳක් වැඩ හිඳ වූයේය. තිවක්ක නම් බ්‍රාහ්මණයාගේ ගම එවන් ස්ථානයකි.

මේ අයුරින් පෙරහරින් අනුරාධපුර නුවරට පැමිණි බෝධින් වහන්සේ රෝපණය සඳහා විශේෂ පුද පූජා සහිත උත්සව සංවිධානය කෙරිණි. බෝධි ගුප්ත කුමාරයන් හා පිරිස රජ වෙස් ගත් අතර දෙවන පෑතිස් රජු දොරටුපාල වෙස් ගත්තේය. සඟමිත් තෙරණිය සමඟ පැමිණි සොළොස් කුලයට අයත් පිරිස විසින් බෝධින් වහන්සේ රථයෙන් බිමට වැඩමවන ලදී. ඔවුන් අතින් මිදුණු බෝධින් වහන්සේ අසූරියනක් අහසට පැන නැගී ෂඩ්වර්ණ රශ්මි මාලාවක් විහිද වූ සේක. මේ ප්‍රතිහාර්ය දුටු දසදහසක් බුදු සසුනේ පැවිදි වූහ. හිරු බැස ගිය පසු බෝධින් වහන්සේ ආකාසයෙන් බැස රෙහෙණ නැකතින් භූමියේ පිහිටි සේක. ඒ වෙලෙහි මහ පොළව කම්පා වූ සේක. රන් කටාරමෙහි සියලු මලු පිටතට විත් බිමට ඇද ගත්හ.

දෙවියෝ සාදු නාද දෙමින් දිව්‍යමය පංචතූර්ය නාද පැවැත්විය. ගිගුරුම් හා දහස් ගණන් විදුලි දහරා පැතිර ගොස් ඝන හිම වළාකුළු බෝධින් වහන්සේ පිරිවරා රැස්විය. එසේ සත් දිනක් පැවතුණි. ඉන්පසු වළාකුළු වලින් මිදුණු බෝධින් වහන්සේ දර්ශනය විය. මිහිඳු මා හිමියන්, සඝමිත් තෙරණිය හා දේවානම් පියතිස්ස රජතුමා ඇතුලු පිරිස රැස්වූහ. ඒ සියලු දෙනා බලා සිටියදීම බෝධින් වහන්සේ නැගෙනහිර ශාඛාවෙන්

අවසන් පිටුවට....

**අජන්තා දිසානායක**

# ඇසීමෙන් ලද ධර්මානිශංසෙ



ඇසීම යනු පැරණි යුගය තුළ පැවති ශිල්ප ශාස්ත්‍ර ක්‍රමයකි. බොහෝ දේවල් ඇසීමෙන් ග්‍රහණය කර ගත් අයුරු අතීතය දෙස බැලීමෙන් අවබෝධ කරගත හැකිය. බහුශ්‍රති යනුවෙන් හැඳින්වෙන්නේ බොහෝ ඇසූ පිරූ තැනැත්තාය. අතීතය තුළ පැවතියේ යමක් ගුරුවරයාගෙන් අසා දැන ඉගෙන ගැනීමය. එය ධර්මය තුළ වුවද ඒ ආකාරයෙන්ම පැවතුනි. ඒ අනුව සුනාථ යන වචනය අපට සිහියට ගැනීමට පුළුවන. ධර්මය වුවද පළමුව ඇසීම කළ යුතුය.

කුමන භාෂාවකින් වුවද විකාශය වන දෙයක් ශබ්ද රසය තුළින් ගෝචර කර ගැනීමට පුළුවන. විශේෂයෙන් මෑත යුගයේ හින්දි භාෂාව ඒ අතර විශේෂත්වයක් ගනී. විශේෂයෙන් බුදුරජාණන් වහන්සේ දේශනා කළ භාෂාව වන්නේ පාලි භාෂාවයි. ලොව ඇති මිහිරිම භාෂාවක් වශයෙන් පාලි භාෂාව ප්‍රකටය.

එම භාෂාව තවත් සුවිශේෂත්වයක් දරන ලද්දේ බුදුකෙනෙක් එම භාෂාව මාධ්‍ය කොට ගෙන ලෝක සත්ත්වයාට දහම් පණිවිඩය විකාශය කිරීම තුළිනි. මුලු ත්‍රිපිටකයම පාලි භාෂාවෙන් නිර්මිතය. එය ලොව ඇති කිසිදු භාෂාවකට නොදෙවෙනි භාෂාවකි. සෑම ජන කොටසකටම තම රටට දේශයට ආවේණික භාෂාවක් ඇත. භාෂාව යනු අදහස් හුවමාරු කරගැනීමේ මාධ්‍යයකි. එය මිනිස් සන්තානය තුළ ගැඹුරින්ම කිඳා බැස ගනු ඇත.

ඒ සඳහා මිනිස් තිරිසන් බේදයකුදු නැත. තිරිසන් සත්වයින් පවා භාෂාවක් තුළින් පාලනය කළ හැක. විශේෂයෙන් පාලි භාෂාව තුළින් බුදුහිමි තිරිසන් සත්වයින්ටද ආමන්ත්‍රණය කොට ඇත. තිරිසන් සතුන් පවා ධර්ම දේශනා කරන අවස්ථාවන්වලදී එය නිස්කලංකව හිඳ ගෝචර කරගෙන ඇත. ඒ බවට හොඳම උදාහරණයක් ලෙස විමාන වත්ථු පාලි අට්ඨ කතාවෙහි මණ්ඩූක දේව පුත්‍රයාගේ කතාව ඉදිරිපත් කළ හැකිය.

එහි සඳහන් වන්නේ අප බුදුන් වහන්සේ වරක් ගර්ගරා නම් පොකුණු තෙර චම්පා නගර වාසීන්ට ධර්මය දේශනා කරන කල්හි එක් මැඩියෙක් බුදුහිමිගේ මධුර ස්වරයට කන්දීගෙන සිටියහ. එහිදි එක්තරා ගොපල්ලන් රකිනා ළමයෙක්ද එතනට පැමිණ ගවයන් පාලනය කරන කෙවිට බිමට තබා එයට ශරිරය බරවී සිටියහ. එහිදි එම කෙවිට තබා ඇත්තේ මැඩියාගේ ඇඟ උඩ බව නොදත් ළමයා එම කෙවිටට තව තවත් බැවීම නිමිති කොට ගෙන ගෙම්බාගේ මරණය සිදුවිය. නමුදු මැඩියා බුදුන් දෙසූ මිහිරි ධර්ම නාදය ඇසූ බැවින් මැරී ගොස් තව්තිසා දිව්‍ය ලෝකයෙහි ඉපදුනහ. මෙම සිද්ධිය මණ්ඩුක දේව පුත්‍රයාගේ කතා පුවත තුළින් අවබෝධ කරගැනීමට පහසුවෙන් පුළුවන. මේ බව ලෝවැඩ සගරාවෙහි 131 වෙනි ගාථාව තුළින්ද පැහැදිලි වෙයි.

එනම්,

**බුදුන් දෙසන බණ මිහිරෙන්ම සිත තැනී**
**පසන්ව උන් මැඩියෙක් කැවිටකින් ඇනී**
**එයින් මිය නිදස ලද ඉසුරු බෙහෙවිනී**
**මෙවන් දහම් ඇසුමට මැලි නොවව් දැනී**

වශයෙන් ඒ බව පැහැදිලි වේ. ධර්මය ඇසීමේ ආනිසංස අතර වුවද **අස්සුතං සුනාති, සුතං පරියෝදපේති** ආදී වශයෙන් නොඇසූ දේවල් ඇසීමත් ඇසූ දේවල් අලුත් වීමත් දැක්විය හැකිය. එසේ නම් ඕනෑම දෙයක් පළමුව ඇසීම වැදගත් වේ. විශේෂයෙන් ධර්මය ශ්‍රද්ධාවෙන් ගෞරවයෙන් ඇසීම තුළින් අනන්ත අප්‍රමාණ පිං සිද්ධවේ. ඒ අවස්ථාවට එළඹෙන සිත ඉතා ප්‍රභාෂ්වරය. එම චුති චිත්තය ඊළඟ ආත්මය සැපවත් කරදීමට සහය වේ.

මරණාසන්නව සිටින පුද්ගලයාට වුවද සතිපට්ඨානය බොහෝ දුරට ඇස්සවීමට ඉඩ සලස්වන්නේ එම හේතුව බැවිනි. එම ලෙඩාට පිරිතෙහි හෝ ධර්මයෙහි අර්ථය නොවැටහුනත් ඔහුගේ මනස තුළ මේ අසන්නේ බුදුන් දෙසූ ධර්මයයි. යන සිතුවිල්ල පහළ වේ. ඒ විගසම ශ්‍රද්ධාව ගෞරවයද පැන නගිනු ඇත.

යමක වග්ගයේ 16 වෙනි ගාථා ධර්මයෙහි නිධාන කතාව පිළිබඳ අවධානය යොමු කිරීමේදි ඒ බව වඩාත් පැහැදිලි වේ. ධම්මික උපාසක තුමා ඉතා ශ්‍රද්ධාවෙන් පින් දහම් දරමින් ජිවත් වූ උපාසකයෙකි. දියණිවරු 7 දෙනෙකුත් පුතණුවරු 7 දෙනෙකුත් සිටි ඔහු වයෝවෘද්ධ වී අන්තිම අවසාන පැය කීපය ගත කරන කල්හි දූදරුවන්ට සතිපට්ඨාන සූත්‍රය අසන්නට අවශ්‍ය බව මතක් තළහ.

එයට අවධානය යොමු කළ දූදරුවන් භික්ෂූන් වහන්සේලා නිවසට වඩම්මවා එය ඇසීමට සැලැස්සූහ. පිරිත අසන ගමන් ධම්මික උපාසකතුමාට සියලු දිව්‍ය ලෝක වලින් අපගේ දිව්‍ය ලෝකයට එන්න යනුවෙන් ඇරයුම් ලැබුන ආකාරය එහි වැඩිදුරටත් සඳහන් වේ.

රෝගාතුර වූ බොහෝ දෙනෙකුට පිරිත් නොතේරුණත් සුවය ලැබුණ හා ලැබෙන බව පරම සත්‍යයි. ගිරිමානන්ද සත්ත බොජ්ජංග සූත්‍ර තුළින් ඒ බව පැහැදිළිවේ. මේ ආදී වශයෙන් බලන කල්හි ඇසීම තම මනස සුවපත් කරගැනීමට ඇති ලොව ප්‍රධානම ඖෂධයක් බව පැහැදිළි වේ. අද වුවද සංගීතය තුලින් ද එය සිදු කරනු ඇත. ඡත්තමානවක කතා පුවත තුළින්ද ඒබ ව පැහැදිලි වේ.

මේ ආදී බොහෝ පුවත් තුළින් ඇසීමෙන් ගතසිත සුවපත් කැදෙන අතරම මෙලොව පරලොව දිවියද සරු කරවනු ඇත. විශේෂයෙන්ම ධර්මය ඇසීම සියලු ඇසීම් වලට වඩා ලොව ඇති බලවත්ම ඖෂධය බව "ධම්මඖෂධ සමං ඒතං පිවත භික්ඛවො" යන පාඨය තුළින් පැහැදිළි වේ. එසේ නම් ධර්මය නොතේරුනා යනුවෙන් සිතා එය නොඅසා සිටීමට උත්සුක නොවිය යුතුය. එයට හේතුව ධර්මය ඇසීම තුළින් වුවද බොහෝ පින්සිදු වන බැවිනි.

**කොබෙයිගනේ පුබ්බිලිය**
**ශ්‍රී සාරානන්ද පිරිවෙනෙහි**
**ආචාර්ය ගලගෙදර**
**රතනවංශ හිමි**

# උඳුවප් පොහොය සමඟ බැඳුණු භික්ෂුණී ශාසනය....



ගෞතම සම්බුද්ධ ශාසනයෙහි සඳහන්වන තොරතුරුවලට අනුව භික්ෂු,භික්ෂුණී,උපාසක,උපාසිකා යන සිව්වනක් පිරිසක් ගැන විස්තර වේ. බුදුරජාණන් වහන්සේ විසින් පවත්වන ලද ප්‍රථම ධර්ම දේශනාවේ පසු පළමුවන භික්ෂු පිරිසක් ආරම්භ විය. වස් සමාදන්වීමද ඒ සමගම සිදුවිය.උපාසක,උපාසිකා යන පිරිස ද ඒ සඳහා සම්බන්ධ වූ බව තොරතුරු අනුව පෙනීයයි. මෙසේ ශාසනයේ භික්ෂූන් වහන්සේලාත් උපාසක,උපාසිකා පිරිසත් ක්‍රමක් ක්‍රමයෙන් වර්ධනය විය. එයට බලපෑ ප්‍රදාන සාධකය වන්නේ බුදුදහමෙහි අන්තර්ගතවන සත්‍ය වූ ධර්ම කරුණු පදනම් වීමය. ඉන්දියාව පුරා බුදුදහම ව්‍යාප්ත වන්නේ එවකට බමුණන් විසින් ඉදිරිපත් කර තිබූ සමාජ විරෝධි ඉගැන්වීම් අභිබවා යෑමෙනි. බ්‍රාහ්මණ ක්ෂත්‍රිය,වෛශ්‍ය,ශුද්‍ර යන සමාජ බෙදීම අසාධාරණ ක්‍රම වේදයක් බව පෙන්වාදුන් බුදුදහම සියලුම දෙනා වෙත කරුණා,මෛත්‍රිය,සමානාත්මතාවය යන උතුම් ගුණාංගයන් මතුවෙන අයුරෙන් පෙන්වාදී තිබේ. මෙයින් ඇති වූ ප්‍රතිඵලය වූයේ බුදුදහම වැළඳගත් ශ්‍රාවක,ශ්‍රාවිකා පිරිසක් භික්ෂූන් වහන්සේලාත් වැඩිවීමය. බමුණන් විසින් ආගමික හා සාමාජික නිදහස නැතිකර සමාජයෙන් කොන්කර සිටි කාන්තාවන් තම නිදහස් අරගලය ආරම්භ කළහ.බමුණන්ගේ මතය වූයේ යම් පවුලකට කුළුදුල් දරුවෙකු උපත සිදුවීමේ දී දැරියන් (දියණියන්) ලැබුණෝ නම් එය අසුභ දෙයක් ලෙසටය. කාන්තාවන් සමාජයෙන් පිළිකුලට භාජනය කිරීමට උත්සාහ දරා ඇති බව බ්‍රාහ්මණ ඉගැන්වීම් වලට පෙනියයි.

මෙවැනි පසුබිමක කාන්තාවන් තම විමුක්තිය සොයායෑම ඇරඹීය. බුදුදහමෙහි පෙන්වාදී තිබෙන සමානාත්මතාවය මෛත්‍රිය,කරුණාව ගැන ගුණාංගයන් ගැන ප්‍රසාදයටපත් කාන්තාවෝ බුදුදහම වටා රැස්වූහ. ඔවුන්ගේ තීරණය වූයේ බුදුරජාණන් වහන්සේ හමු වී තම විමුක්තිය ලබාගැනීමටය.මෙම කාන්තා පෙරමුණේ මූලිකත්වය මහාප්‍රජාපති ගෝතමිය,ඛේමා,නන්ද,යශෝධරා යන රාජකීය කාන්තාවන් දැරූහ.ශ්‍රමණ වෙස්ගෙන බුදුරජාණන් වෙතට ගිය කාන්තාවන් පැවිදිබව ලබාදෙන ලෙස ඇයද සිටියහ.බුදුරජාණන් වහන්සේ පළමුවරත්, දෙවනවරත් ප්‍රතික්ෂේප කලත් නැවත වරක් ඉල්ලා සිටි කාන්තාවන්ට අෂ්ටගරු ධර්ම සහිතව පැවිද්ද හා උපසම්පදාව ලබාදුන් සේක. මෙම උතුම් සිදුවම් උඳුවප් පොහෝ දිනයේ ක්‍රියාත්මක වූ බව ශාසන ඉතිහාසයෙහි සඳහන් වෙයි.

ඉන්දියාවේ අධිරාජ්‍යා බවට පත් වූ ධර්මාශෝක රජු දවස ශාසනයේ ව්‍යාප්තිය ඉතා හොඳින් සිදුවිය.ඒ බව තම පුතණුවන් වන මිහිඳු මහරහතන් වහන්සේ ශාසන ගතවීමෙන් පෙනීයයි. දියණියද සසුන් ගතවිය. තෙවන ධර්ම සංඝායනාවෙන් සිදු වූ ප්‍රතිඵලය වූයේ රටවල් නමයකට ධර්මය ව්‍යාප්තවීමය. ශ්‍රී ලංකාවේ භික්ෂු ශාසනය ඇතිවූයේ එයින් පසුවය. මිහිඳු මහ රහතන් වහන්සේ අරිට්ට කුමරා පැවිදිකර භික්ෂු ශාසනයට මුලපිරීය.එතැන් සිට භික්ෂු පිරිස වර්ධනය වන්නට විය. මේ වනවිට කාන්තාවන්ද උතුම් පැවිද්ද අපේක්ෂාවෙන් පසුවිය. මේ බව දෙවන පෑතිස් රජුට දන්වා සිටියහ. රජතුමා මිහිඳු මහරහතන් වහන්සේට ප්‍රකාශකර සිටි අවස්ථාවේ, තමන්ට කාන්තාවන් පැවිදි කිරීමට නොහැකි බව පෙන්වා දුන්නේය. ඒ සඳහා තම නැගෙණිය වූ සංඝමිත්තා තෙරණිය ගෙන්වා ගැනීමට කටයුතු කරන ලෙසට රජුට දැන්විය. මේ සඳහා ක්‍රියාත්මක වූ රජතුමා තම මිත්‍ර වූ ධර්මශෝක රජුට දන්වා යැවීය.ධර්මාශෝක රජු තම දියණිය වූ සංඝමිත්තා තෙරණින් වහන්සේත් පරිවාර පිරිසත් ජය ශ්‍රී මහාබෝධින් වහන්සේගේ දක්ෂිණ ශාඛාවත් ශ්‍රී ලංකාද්වීපයට එවීමට ක්‍රියා කෙළේය. එතැන් සිට භික්ෂුණී ශාසනයට මුලපිරුණි.අනුලා දේවිය ප්‍රධාන රාජකීය කාන්තාවන් සංඝමිත්තා තෙරණින් වහන්සේ වෙතින් පැවිද්ද හා උපසම්පදාව ලැබිය. එම සිදුවීම සනිටුහන් කරවන උඳුවප් පොහොය කාන්තා සමාජයේ විමුක්තිදායක දිනය ලෙස සැළකේ. වසර ගණනාවක් සමාජ සේවයක් ඉටු කරමින් සම්බුද්ධ ශාසනයේ දියුණුවට මෙහෙවර ඉටුකළ බව ශාසන ඉතිහාසයේ සඳහන් වෙයි. භික්ෂුණී ශාසනයේ දියුණුව ලැබූ ප්‍රතිඵලය පෙන්නුම් කරන්නේ චීන දේශයටද භික්ෂුණී ශාසනය ගෙනයෑමට සමත් වීමෙනි. වංශකතාවල සඳහන් වන්නේ මහිලා,ගිරිකාල,දුසී,සමණා යන නම්වලින් ප්‍රසිද්ධ භික්ෂුණීන් වහන්සේලා රුහුණේ සිට අනුරාධපුරය දක්වා ධර්මය ව්‍යාප්ත කිරීමෙහිලා මෙහෙවරක යෙදී සිටි බවයි. සිවුවන මිහිඳු රජතුමා මහා මල්ලිකා භික්ෂුණිය වෙනුවෙන් අසපුවක් සාදා පූජාකළ බව සෙල්ලිපියක සඳහන් වෙයි.

පොළොන්නරු යුගයෙන් පසු භික්ෂුණී ශාසනයේ පිරිහීමේ ආරම්භය සිදුවිය. මේ සඳහා විවිධ සමාජීය හේතූන් බලපෑ බව ශාසන ඉතිහාසයේ සඳහන්වේ. ආරක්ෂාව, ප්‍රත්‍ය පහසුකම් පිලිබඳ ගැටලු ප්‍රධාන වී තිබේ. මෙසේ පිරිහීමට පාත්‍ර වූ භික්ෂුණී ශාසනයේ යළි ආරම්භයක් සිදුවන්නේ රංගිරි දඹුලු විහාරස්ථානය මූලික කරගෙනය. වත්මන් විහාරාධිපති අති පූජ්‍ය මහානායක ස්වාමීන්ද්‍රයාණන් වහන්සේ ඉනාමළුවේ ශ්‍රී සුමංගල මාහිමියන්ට හිමිවන්නේ ගෞරවයකි. ලක්දිවපුර විසිරී සිටින දහසකට අධික භික්ෂුණීන් වහන්සේලාගෙන් සම්බුද්ධ ශාසනය මූලික කරගෙන සිදුකරන මෙහෙවර ප්‍රසංසා කටයුතුය.මේ නිසාම සම්බුද්ධ ශාසනයේ සිව්වනක් පිරිසද සම්පූර්ණ විය. මේ නිසා ම උඳුවප් පොහෝ දින බෞද්ධ ජනතාවට උතුම් දිනයක් බවට පත් වී හමාරය.

ඇම්.ඞී.විජයවර්ධන

## උදාවෙන අලුත් අවුරුද්දේ උට්ඨාන වීර්‍යයෙන් කටයුතු කිරීමට අධිෂ්ඨාන කරගනිමු

2021 ජනවාරි පළමුවනදට වසරක් ගෙවී නව වසරක් උදවනු ඇත. එහිදී නව සිතුම් පැතුම් හා නව ක්‍රියාකලාප ඔස්සේ වැඩ කිරීමට නොයෙන් දෙනා සිතා සිටිති. 2020 වර්ෂය තුළ සිදු වූ වැරදි අඩුපාඩු සකසාගෙන තම අරමුණු කරා යන්නට රටවැසියාට හැකියාවක් ඇත්තේ උත්සාහය තුළිනි. අද අප අතර ක්‍රමක්‍රමයෙන් නැති වී යන උට්ඨාන වීර්‍ය අපි නැවත දියුණු තියුණු කරගෙන උදාවෙන මෙම නව වසර තුළ සියළු අභියෝග ජයගන්නට සිතා ගැනීම ඉතා වැදගත් වේ.

උට්ඨාන වීර්‍ය ඕනෑම පුදුගලයෙක් තුළ තිබිය යුතු දියුණු වීමේ ලක්ෂණයකි. එය ඇත්නම් කළ නොහැකි දෙයක් නැති තරම්ය. ගොවිතැන, වෙළදාම, ගවපාලනය, දුනු ශිල්පය, රාජ්‍ය සේවාව ආදියට දක්ෂ වීම ඒ කෙරෙහි අනලස් වීම, උපායෙන් හා විමසීමෙන් යුක්ත වීම සුදුසු කළ ඒ කාර්‍යයන් සම්බන්ධව කටයුතු කිරීම උට්ඨානවීර්‍ය නම් වේ. රටක නායකයෙක් වේවා, ගොවියෙක් වේවා, භික්ෂුවක් වේවා, වෙළෙන්දෙක් වේවා, ගෘහාධිපතියෙක් වේවා, ඕනෑම තරාතිරකම වේවා උට්ඨාන වීර්‍ය පැවතිය යුතුය. නැත්නම් රටක, සමාජයක, ගමක, නිවසක දියුණුවක් අභිවෘද්ධියක් ළඟාකරගත නොහැකිය. අද ලෝකය ගත්තත් එම නාටකයාගේ උත්සහය නිසා දියුණු වූ රටවල් බොහෝ ගණනාවක් ඇත. ජපානය, සිංගප්පූරුව, මැලේසියාව, තායිවානය වැනි රටවල් ඒ අතර සුවිශේෂි වේ. මී මැස්සන් සේ, වේයන් සේ උත්සහය ඇතිකර ගැනීම දියුණු වීමේ මාර්ගයයි. කම්මැලිකම, අලසකම ජීවිතයක් තුළ තිබුනොත් සැමද පිරිහීමට ලක් වේ. එවැනි අලස අය තුළ නිතරම පවතින ගති ලක්ෂණ 06ක් සිගාලෝවාද සූත්‍රය තුළ පෙන්වා දී ඇත. එනම්,

01. දැන් ඉතා සීතලය
02. දැන් ඉතා උෂ්ණය
03. දැන් ඉතා සවසය
04. දැන් ඉතා උදේය
05. දැන් බඩගිනිය
06. දැන් බඩ පිරිලාය යනාදි වශයෙනි.

මෙවැනි ගති ලක්ෂණ තිබුනොත් කවදාවත් දියුණු වීමට පුළුවන්කමක් නැත. එනිසා එවැනි අලසකම් නැති කරගත යුතුය. අපේ රටේ ඉතිහාසය ගත්කළ එදා පැරැන්නන් තුළ උත්සාහය උපරිම වශයෙන් තිබූ බව ඔවුන් කළ කී දේ තුළින් වටහාගත හැකිය. ආගමික වශයෙන් ගත්තත්, ආර්ථික වශයෙන් ගත්තත්, දේශපාලනික සංස්කෘතික යන මොන අංශයෙන් ගත්තත් එහි දියුණුව අද පවා දැකගත හැකිය. කෘෂිකර්මාන්තයේදී දෑත දෙපය මහන්සි වී ලබාගත් අස්වැන්න වෙනත් රටවලටද යැවූ බව සඳහන් වේ. අක්කර දහස් ගණන් බීජ වැපිරීම සඳහා විශාල වැව්, ඇළ, වේලි හා ජලනල පද්ධති නිර්මාණය කිරීමෙන් කෘෂිකර්මාන්තය දියුණු වී රටේ ආර්ථික ස්වංපෝෂිත වූ එවුනට ආගමික සහනශීලීතාවය ඇතිකර ගැනීම සඳහා විශාල වෙහෙර විහාර, ස්ථූප නිර්මාණය වූයේද, උත්සාහයේ ප්‍රතිඵලයක් වශයෙනි. උදයට උදැල්ල රැගෙන කුඹුරට යන ගොවියා යළිත් නිවසට පැමිණෙන්නේ සවසටය. ඒ තරමට පැරැන්නන් තුළ කම්මැලිකමක් නොතිබුණි. වී ප්‍රධාන භෝගය වුවත් ඊට අමතරව විවේක වෙලාවට අල, බතල, මඤ්ඤොක්කා වැවීමටද, එයින් ප්‍රයෝජනය ගැනීමටද පැරැන්නන් උත්සුක විය. අද කාලයේ තරුණ පිරිසට එය ආදර්ශයට ගෙන දියුණු විය හැකිය.

බුද්ධ චරිතය තුළින්ද අපට උට්ඨාන වීර්‍යයේ ඇති අගය වටිනාකම මනාව පිළිපිඹු වේ. උන්වහන්සේ දස පාරමිතා අතර වීර්‍ය පාරමිතාවක් හැටියට සසරේ පුරන ලද්දේ මෙම උත්සාහයයි. ඒ අනුව උන්වහන්සේ නොයෙක් ආත්මවල ඇස්, ඉස්, මස්, ලේ පමණක් නොව අඹුදරුවන් පවා දන් දුන් සේක. උන්වහන්සේට දීපංකර පාදමූලයෙහි දී නිවන් දැකීමේ වරප්‍රසාදය තිබුණත් එසේ නොකොට ප්‍රාර්ථනා කළේ,

බුද්ධෝ හං බෝධ ඉස්සාමි
මුත්තෝ හං මෝචයේ පරේ
තිණ්නෝ හං සාර ඉස්සාමි
සංසා රෝගා මහබ්බයා

තමන් සසරින් මිදී අන්‍යයාද මුදවීමේ හා සසරින් එතෙර වී අන්‍යයාද සසරින් එතෙර කරවීමේ පරම පවිත්‍ර චේතනාව උට්ඨාන වීර්‍යයත් සමග උන්වහන්සේ තුළ තිබුණි. සිදුහත් බෝසත් සමය තුළ සියලු සැප හැරපියා උට්ඨානයෙන් බණ භාවනා කර ලද ජයග්‍රහනය ලෙස නිවන් සැපත හැඳින්විය හැකිය. එම උතුම් චරිතය තුළින් ඕනෑම කෙනෙකුට ආදර්ශයක් ගෙන අභියෝග ජයගැනීම සඳහා එය පිටුවහලක් කරගත හැකිය.

චුල්ල සෙට්ටි ජාතකය ආදර්ශයට ගත්තත් කෙනෙකුට දියුණුවීමට බැරිකමක් නැත. එහි සඳහන් වන්නේ මී කුණක් උපයෝගි කරගෙන තරුණයෙක් ක්‍රමක්‍රමයෙන් දියුණු වූ ආකාරයයි. බුදු දහම තුළ නිතරම පෙන්වාදෙන්නේ නිවැරදි කායකර්මාදිය තුළින් මෙලොව සැප ලබා ගන්නා ආකාරයයි. එය ඉද්දිපාදයක් හැටියට "සම්මා වායාම" යනුවෙන් ආර්ය අෂ්ඨාංගික මාර්ගය තුළ වැඩිය යුතු බව පෙන්වා දී ඇත. වර්තමානයට අවශ්‍යම දෙයක් හැටියට උත්සහය නොහොත් වීර්‍ය පෙන්වා දිය හැකි අතර එය පළමුවෙන්ම මනසේ ධෛර්‍යය වශයෙන් ඇතිකරගත යුතු අතර පසුව එය ක්‍රියාවට නැංවීමේදී නොපසුබස්නා වීර්‍යය ඇතිකරගත යුතුය. එය කුඩා දරුවාගේ පටන් වැඩිමහල්ලා දක්වා රටක, සමාජයක, ගෙදරක තිබිය යුතු ලක්ෂණයක් ලෙස පෙන්වා දිය හැකිය.

ලෞකික මෙන්ම ලෝකෝත්තර සැපත පිණිස කරන කුසල් කර්මාදිය සඳහාද උත්සහය අවශ්‍යය. සිතෙහි පවතින ලෝභ, ද්වේශ, මෝහ වැනි අකුසල, සිතුවිලි යටපත් කරගෙන කුසල් කිරීමටත් එවැනි අකුසල් සහමුලින් උපුටා දමා නිවන් සැපත ලඟාකර ගැනීමටත් උත්සාහය අවශ්‍යය. ඒ නිසාම බුදු පසේ බුදු මහරහතන් වහන්සේලා තුළ පැවති උන්වහන්සේලා විසින් අගය කොට වදාළ ශ්‍රේෂ්ඨ ගුණ ධර්මයක් වන උට්ඨාන වීර්‍ය රටක ජීවත්වන සෑම කෙනෙකු තුළම පැවතිය යුත්තකි. කටයුතු සාර්ථක කරගැනීමට අනාගතය සැපවත් කරගැනීමට කැමති සැම කෙනෙක්ම උත්සාහය ඇති කර ගත යුතුය. ආගම්,ජාති, කුල මල තුළ සිරනොවී එකම රටක පුරවැසියන් හැටියට අපි සෑම දෙනෙක්ම එකතු වී සමගියෙන් සහයෝගයෙන් රට දියුණු කිරීමටත් අපගේ දියුණුව ඇති කර ගැනීමටත් උත්සහයෙන් සියළු කටයුතු කරගෙන යාමට උදාවන අළුත් අවුරුද්ද තුළ ප්‍රාර්ථනාවක් වශයෙන් තබාගනිමු.

කොබෙයිගනේ පුබ්බිලිය ශ්‍රී සාරානන්ද පිරිවෙනේ ආචාර්යය
ගලේවෙල පුවක්පිටිය ශ්‍රී බෝධිරාජාරාමයේ
ගලගෙදර රතනවංශ හිමි

14 පිටුවෙන්...

තථාගතයන් වහන්සේලා ලෝකයේ පහල වූවත් පහල නොවූවත් ධාතුන්ගේ ශක්තින්ගේ ඇතිවීම නැතිවීම (අනිත්‍ය බව) සදාකාලිකවම ලොව විද්‍යාමානයි. ශක්තීන්ගේ ස්වභාවය නිරන්තරයෙන් වෙනස්වීමයි. පරිවර්තනශීලී ක්‍රියාකාරීත්වය සදාකාලිකව සිදුවන නිසා කිසිදු පරම අංශුවක් වත් ඒකියත්වයක් තුළ ස්ථාවරව නොපවතී.

මේ මහා චලිතය මහා වේගය, ශක්තීන්ගේ විෂමය තුළ නිරතුරුව සිදුවන අන්‍යෝන්‍ය වෙනස අතරත් නැතිව ඉඩසක් නැතිව අසංඛ්‍යම වේ. මේ මහා විශ්ව ධාතුන්ම මහා චලිතයකි. ලෝක යට වේගයකි. එහි ආරම්භයක්, අවසානයක් පැනවිය නොහැක. මේ ශක්ති ජාලයේ ස්වභාවය අනිත්‍ය තාවය ලෙෂ භාග්‍යවතුන් වහන්සේ වදාලහ. මේ අනිත්‍ය තාවයට යටත් නොවන සජීවී අජීවී ලෝකයේ කිසිවක් නැත. ෂත්වයා සම්බන්ධ ව ඇති අභ්‍යන්තර ඇස, කණ, නාසය ආදී රූපත් බාහිර වර්ණ රූප, ගන්ධ රූප ආදියත් එස්සයෙන් හටගන්නා වූ විඤ්ඤාණ ශක්තිය ද මේ නිසා අනිත්‍ය වේ. විඤ්ඤාන ශක්තිය තුළින් නිකුත් වන නාම ධර්ම පහ පංචඋපාදානස්කන්ධය නිත්‍ය සැප ආත්ම වශයෙන් අල්ලා ගැනීම දුක ලංකරගත්තා වේ. රූපාදී සංකත ධර්මවල යථාභූත ඥාණ දර්ශනය පහල කර ගැනීමෙන් දුක අතහැරේ. ලෝකයා අතහැරේ. රූපයෙන් නිදහස් වීම යනු දුකෙන් නිදහස් වීමයි. හෙවත් ලෝකයෙන් නිදහස් වීමයි . රූපමය මන තුළ නිවන නොවන නිසා, සංයුක්ත නිකායේ අස්සු සූත්‍රයේ මෙසේ සඳහන් වේ.

යාවඤ්චිදං භික්ඛවේ අලංමේව සබ්බ සංඛාරේ සු නිබ්බින්දදි තුං - අලං විරජ්ජිතුං - අලං විමුච්චිතුං

ඒ නිසා මහණෙනි, හටගත් සියළු සංස්කාරයත් පිළිබඳව නිර්වින්දනයට, විරාගයට, මිදීමට, පැමිණීමට සුදුසු වන්නේය.

භාග්‍යවතුන් වහන්සේ විශ්ව පදාර්ථ පිළිබඳව නිරීක්ෂණය, පරීක්ෂණය, නිගමනයේදී යථාභූත ඥාණ දර්ශනය පිළිබඳව අවබෝධ ඥාණයේදී ස්කන්ධයේ පදාර්ථය ඉක්මවා පරම අනුව ඉක්මවා ඉලෙක්ට්‍රෝන, ප්‍රෝටෝන න්‍යෂ්ඨියේ ශක්ති පුංජයක් ඉක්මවා පරමාණු සර්භයේ ශක්තිය ඉක්මවා අවකාශයේ මායිම් ඉක්මවා මහා විශ්වයේ අචින්තය වෙත මනසින් පැමිණියහ.

ජීවිතයත්, චලනයත් දෙකක් නොවේ. ද්විත්වයක් නොමැත. චින්තනය චින්තනයක් මිස චින්තකයෙක් නැත. චින්තනය ඉවත්කළ විට චින්තකයාද ඉවත් වේ. බලමි, අසමි, ආඝ්‍රාණය කරමි. රස බලමි. පහස ලබමි. සිතමි. අත්හල විට මම ද ඉවත් වේ. මම සිටින තාක් මර වසයම වේ. මම ඉවත්වීමම මාරවසඟයෙන්ද ඉවත්වීම සිදුවේ.

06 පිටුවෙන්....

ඇති බවයි. මෙයින් පෙන්වාදී තිබෙන්නෙනිවණ තමා ළඟම පවතින බවයි.

මෝහාන්ධකාරයෙන් වැසී ඇති ප්‍රඥාව දියුණු කල විට "ප්‍රඥාඥා උදපාදී, විණි උදපාදි" ආලෝකෝ උදපාදී,යනුවෙන් පෙන්වා දී ඇති පරිදි (ධමම චක්කපවතතන සුත්‍රය) තමාගේ නැණස තෘෂ්ණාවෙන්, සම්පූර්ණයෙන්ම දුරුකල විට " නිවණ" නැමති ප්‍රඥාලෝකය ඇති වෙන බවයි.

එබැවින් සමාජයේ වෙසෙන යම් කපටි පුද්ගලයින්ගේ මිථ්‍යා මතවලට නොරැවටී ප්‍රඥාව මෙහෙයවා තම සිත දියුණු කරගැනීමෙන් ගෞතම බුදු සසුනෙහිදීම, නිවන ළඟාකරගත හැකිවන බව අවබෝධ කරගැනීම, තම තමන් විසින් සිදුකරගත යුතුව ඇත.

''තුමෙහහිකිච්චං ආතපපං අකඛාතාරො තථාගතා"

බුදුරජාණන් වහන්සේ නිවන් මඟ පෙන්වාදී තිබේ. එයට අනුකූලව ක්‍රියා කිරීම බෞද්ධ ඔබ අප සැමගේ අධිෂ්ඨානය විය යුතු වේ.

04 පිටුවෙන්..

## මුනි සිරිපා රැඳි සමන්ත කූටය

හැරම්ටිපානට අප ලඟා වන්නේ ධර්මරාජ ගල තරණය කර යෑමෙන් අනතුරුවය. එරත්තේ සිට දිවෙන කුරුවිට පාර රත්නපුර පාර හා යා වෙන්නේ හැරම්ටිපානේදීය. මෙහිද ලොකු අම්බලමක් තිබේ. වන්දනා කාලයේදී පමණක් පවත්වනු ලබන සල්පිල් සමූහයක්ද මෙහි ඇත.

රත්නපුර පාරෙන් සමන්තකූටයට නඟින කෙනෙකුට මහාගිරි දඹයෙන් ඔබ්බට පිහිටි ගිරිශිඛරය ප්‍රථම වරට දිස්වන්නේ මෙහිදීය. සමනොළ කන්දේ කේතු රූපාකාර ශිඛරය ඉතා ප්‍රතාපවත් ලෙස හා චමත්කාර ජනක අන්දමට මෙතැනට දර්ශනය වෙයි. හැරම්ටිපාන පිහිටියේ මුහුදු මට්ටමෙන් මීටර් 1909 ක උසිනි. (අඩි 6300 ක් පමණ) කූටය මුදුනට සම්ප්‍රාප්ත වීම පිණිස තවත් මීටර් 321 නැග යා යුතු වේ.

මීළඟට අපට හමුවන වැදගත් ස්ථානය වන්නේ ආඬියා මළ තැනයි. සීතාවක රාජසිංහ රාජ්‍ය සමයේ ශ්‍රී පාදස්ථානය අයත් කරගෙන සිටි ශිව භක්තිකයන්ගෙන් ප්‍රධානියෙකු මෙහි මරණයට පත් වු නිසා මෙම නාමය මෙතැනට ව්‍යාවහාර වන බව ජනවහරේ පවත්නා කතාවලින් කියැවේ.

ආඬියා මළ තැන්නේ සිට කූටයට නැගීමට ඇත්තේ ඉතාම දුෂ්කර මාර්ගය නැග ගිය විට අපට දක්නට ලැබෙන්නේ ඇහැළ කණුවද වැදගත් සිහිවටනයකි. අඩි දෙකකින් පමණ උසැති සිලින්ඩාකාර ශෛලමය ස්ථම්භයක් වන මෙය දැන් දෙකඩ වී තිබේ. එහි ඉහළ කැබැල්ල පහළ කැබැල්ල මත ඇති අයුරු දක්නට ලැබේ.

මෙයට ඉහලින් ඇති පාර යකඩ වැටකින් දෙකඩ බේදා තිබේ. ඒ වන්දනා කරුවන්ට නැගිමට හා බැසිමට පහසු වනු පිණිසය. තරණය කිරිමට අපහසු ප්‍රපාතාකාර කේතු රූපාකාර ශිඛරය මහගිරි දඹේ නමින් හැදින්වේ. සපුගස් තැන්නේ සිට ආරම්භ වන අතුරු පාර රත්නපුර පාර හා සම්බන්ධ වන්නේද ඇහැළ කණුව සමීපයෙදීය.

වන්දනා කරුවන් විසින් හුණු තවරනු ලැබ තිබීම ඇහැළ කණුවේ දක්නට තිබීම විශේෂතාවයකි. කවර අරමුණක් සඳහා මෙය පිහිටවන ලද්දේද යන්න ගැටළුවකි. මෙහි හුණු තවරා යෑමට හේතුව තමන් කූටය කරා නැග ගිය බව සෙසු අයට සන්නිවේදනය කිරිම සඳහාද යන්න සිතිය හැක.

අෑත කාලයේ මෙහි තිබෙන්නට ඇත්තේ ඇහැළ ලීයෙන් තනවන ලද කණුවකි. පසුව මෙහි සෙල් ටැඹක් පිහිටු වන්නට යෙදුන පසු පෙර සිටම පැවති ඇහැළ කණුව යන නම ව්‍යාවහාර වන්නට ඇතැයි විශ්වාස කළ හැකිය. ශ්‍රී පාදය වන්දනා කරන්නට යන සමහර බැතිමතුන් මෙහිදී සුදු පිරුවට අදිති. ඔවුන් එසේ කරන්නේ පවිත්‍රත්වය සළකාගෙනය.

අධික සීතලද රැගෙන හමා එන තද සුළඟ නිතර මෙහි පවතී.

13 පිටුවෙන්..

## පුද්ගල පෞරුෂත්වය විෂයෙහි කලාව-සංගීතය

(repression) වේ. අප ලබන පීඩාකාරී දෑ අවරෝධනය වේ. මෙය පුද්ගල හැසිරීමට බලපායි. අපගේ පෙර බවයන්හි දෑ අවිඥානය තුළ පවති. මනසේ ක්‍රියාකාරිත්වය නිතරම ගමන් කරනුයේ තෘප්තිය උදෙසාය. මෙම තෘප්තිය වේදනාකාරී නම් එම වේදනාකාරී දෑ තුළින් ඉවත්විම යහපත් වේ.

**උ.දා-** විභාගයෙන් අසමත් වීම අවිඥනය තුළට ඇතුළු වේ. පසුකාලීනව මෙය වර්තමාන ගැටලු බවට එළිදැක්වෙයි.

**"අම්මා මට ආදරේ නෑ" අවිඥානය තුළට ඇතුළු වේ.**

**"මට මේ රැකියාව වැඩක්ම නෑ"**
පසුකාලීනව මෙය වර්තමාන ගැටළුවක් බවටපත් වේ.

### යහපත් පෞරුෂයක් ඇති බව

1.අන් අයගේ සිතුම් පැතුම් අවබෝධකොට ගනී.

2.ඔබගේ දුර්වලතා පිළිගනි.

3.ඔබව අවතක්සේරු කර නොගනි.

4.අධිතක්සේරු කර නොගනි.

5.අන් අය සමඟ හොඳ සම්බන්ධතා ගොඩනගා ගනි.

6.ජීවිතය තුළට හොඳින් මුහුණ දී හොඳ ප්‍රතිඵල ලබා ගනි.

7.ඔබගැන පරාජිත හැඟීම් ඇතිකර නොගනි.

8.ජිත්තවේග වලින් කැළඹීමට පත් නොවේ.

9.යහපත් කායික සෞඛ්‍ය සහිතය.

10.පරිසරය අනුව හැඩ ගැසෙයි.

11.අන්අය තුළ සිදුවන විවිධ වෙනස්කම් වලට ගරු කරයි.

"යහපත් පෞරුෂයක් සාර්ථක ජීවිතයක අඩිතාලම වේ."

මහාකාව්‍ය රවින්ද්‍රනාත් තාගෝර් ඔහුගේ "ගීතාංජලී" කෘතියෙහි මෙසේ දක්වා තිබේ.

මා හඳ තුළ රජ කරනා
දුගී බවේ මුල සිදින්න
සැපත විපත මැදිහත් ලෙස
පිළිගන්නට දිරිය දෙන්න
සේවය තුළ මා සෙනෙහස
එල දරන්න දිරිය දෙන්න
දිළිඳු දනන් ඈත් නොකර
ලඟට ගන්න දිරිය දෙන්න
අයුක්තියට දණ නොමා
කෙලින් ඉන්න දිරිය දෙන්න
දවසේ සුළු ගැටුම් උඩින්
හිස නගන්න දිරිය දෙන්න
ගත සිත වෙර ඔබෙ බලයට
පුද කරන්න දිරිය දෙන්න

රවින්ද්‍රනාත් තාගෝර් නැමති මහා කවිදු ඔහුගේ කාව්‍ය පුරා පවසා ඇත්තේ සැබෑ පෞරුෂය යනු කායික, මානසික, සාමාජීය හා අධ්‍යාත්මික යහපැවැත්ම සහිත සමබර බව කියා නොවේද?...........

මේ සියළු දෙය උදෙසා අප අපගේ සිත නිහඬ කිරීමේ කලාව දැන සිටිය යුතුය. සිත නිහඬ කිරීමේ කලාවේ අවසානය අධ්‍යාත්මික සැනසීම වේ. සිත නිහඬ කිරීමේ විෂයෙහි කලාව, සාහිත්‍ය කෙතරම් සංවේදීද?........ මටසිළුටුද?.......... ඒ බව පසක් කොට ජීවිතය සාර්ථක කර ගැනීම උදෙසා සුභාවිත කලාව අතපත ගෑම විෂයෙහි ඔබට ශක්තිය, ධෛර්යය සහ භාග්‍යය ලැබේවා.............!

රංගිරි ශ්‍රී ලංකා
සත්‍ය ගවේෂී බෞද්ධ හඬ
රංගිරි ශ්‍රී ලංකා 2020 දෙසැම්බර් - 2564 උඳුවප් කලාපය

# ලෝ සත වෙත මෙත සිත පතුරුවමු
## (කරණීයමෙත්ත සූත්‍රය ඇසුරිනි)



. පුවත්පත්,විද්‍යුත් මාධ්‍ය යනාදි වූ සකලවිධ ජනමාධ්‍ය වෙත අවධානය යොමු කළ විට අපට ඇසෙන්නට පෙනෙන්නටඇත්තේ සිත් නොසන්සුන් කරවන්නා වූ පුවත්පත්මය. ලොව කොතැනක හෝ ගැටුමක්,ඒ තුළින්වූ මරණ සංඛ්‍යාව වැනි පුවත්පතකින් තොර වූවක් අද කිසිවිටක ඇසිය නොහැකිය. මිනිසා තුළින් මෛත්‍රී සහගත බව ක්‍රමයෙන් ගිලිහි යාමත්, එකිනෙකා පරයා එකිනෙකා නැගී සිටීමට දරණ උත්සහයත්, දැඩි වෛරී සහගත ස්භාවයත්, ඉවසීම වැනි ගුණාංග පුද්ගලයාගෙන් ඈත් වීම හා දැඩි කෝපය වැනි දුර්ගුණ ළගා කර ගැනීමත් ලොව ගැටුම්වලට හේතු සාදක වී ඇති බව නොරහසකි. ලෝ සත තුළ මෙත් සිත පහළ වේ නම් මෙකී භයානක තත්වයෙන් ලොව මුදා ගැනීමට නොඅනුමාන ය.

මිතුරාටත්, නොමිතුරාටත් හැමදෙනාටමත් මිත්‍රත්වය පැතිරවීම මෛත්‍රිය යි. මෙකී ලෝ සත වෙත මිත්‍රත්වය පතුරවන අයුරු සහ එම පුද්ගලයා තුළ ඇති කරගත යුතු ගුණ ධර්ම මෙන්ම මෛත්‍රිය පැතිරවීමෙන් තමාට සහ සමාජයට වන යහපත සලසා ගන්නා දක්ෂ පුද්ගලයා විසින් ඇති කර ගත යුතු ගුණ ධර්ම පහළොවක් පිළිබඳ මෙහි සඳහන්ය. තමන්ට එය කළ හැකිය යන අචල විශ්වාසය හෙවත් හැකිකම (සක්කෝ), ඇද නැති බව නොහොත් අවංක බව හෙවත් මැනවින් ඍජු බව (සුජු), සුවච බව එසේත් නැතිනම් ඇහුම් කන් දෙන බව (සුවචෝ), මොලොක් ගතිය හෙවත් මෘදු ගතිය (මුදු), අතිමානය නැතිකම හෙවත් මම උසස් බව-ඔබ පහත් යන හැඟීම නැතිකම (අනතිමානී), මිනිසා සතු ඉහළම ධනය වන සතුට(සන්තුස්සකෝ), ලෙහෙසියෙන් පෝෂනය කළ හැකි බව (සුභරෝ), අල්පකෘතතාව හෙවත් වැඩ අඩු බව (අප්පකිච්චෝ), සැහැල්ලු පැවැත්ම (සල්ලහුකවුත්ති), සංවර වූ ඉඳුරන් ඇති බව (සන්තින්ද්‍රියෝ), තැනට සුදුසු නුවණ ඇති බව හෙවත් නුවණැති බව (නිපකෝ), දරදඬු, ගොරෝසු, ඔළමොල ගති නැති බව (අප්පගබ්බෝ), කුලයන්හි නොගැලුණු බව (කුලේසු අනනුගිද්ධෝ), නුවණැති අයගේ දෝෂ දර්ශනයට ලක් වන කුඩා වූ ද වරදක් නොකොට යුතු බව (නච ඛුද්ධං සමාචරේ කිංචියේන විඤ්ඤූ පරේ උපවදෙය්‍යුං), යනු එම අත්ථ කුසල පුද්ගලයා විසින් ඇති කර ගත යුතු ගුණ ධර්ම පහළොවයි.

මෙකී ගුණ ධර්ම පහළොව ඇති කර ගත් පුද්ගලයා හට මෛත්‍රිය පැතිරවිය හැකිය. එබැවින් ලෝ සත වෙත මෙත පතුරවාලන්නට නම් මෙකී ගුණ ධර්ම පහළොවෙන් සමන්විත පුද්ගලයෙකු බිහි විය යුතුය.

කරණීයමෙත්ත සූත්‍රයෙහි උක්ත ගුණ පිළිබඳව සඳහනෙන් අනතුරුව පෙන්වා දෙනු ලබන්නේ භාවනාවක් වශයෙන් මෛත්‍රිය වඩන අයුරු ය.

සියලු සත්වයෝ කායික සුවයෙන් සුවපත් වෙත්වා, බිය නැත්තෝ වෙත්වා, සිතිනුත් සුවපත් වෙත්වා, යනුවෙන් කෙටියෙන් දැක්වීමෙන් අනතුරුව සවිස්තරාත්මක මෛත්‍රිය පතුරුවාලන අයුරු පෙන්වා දෙයි. ඉතා කුඩා සත්වයාගේ සිට රහතන් වහන්සේ දක්වා වු ද සියලු සත්ව සංහතියම මෛත්‍රී භාවනාවට ලක් කොට ඇත. ඒ මේ අයුරිනි, රහත් නොවූවෝ හෙවත් තැති ගන්නා වූ සත්වයෝ (තසා), රහතන් වහන්සේ හෙවත් තැති නොගන්නා වූ අය (ථාවරා), දිග් වූ සතුන් (දීඝා), විශාල වූ සතුන් (මහන්තා), මධ්‍යම ප්‍රමාණයේ සත්තු (මජ්ඣිමා), මිටි සත්තු (දිට්ඨා), නොපෙනෙන සත්තු (අද්දිට්ඨා), දුර වසන සත්තු (දුරේ), ළඟ වසන සත්තු (අවිදුරේ), ඉපදුණු සත්තු (භූතා), ඉපදෙන සත්තු (සම්භවේසී) යනාදී වශයෙන් ය.

මේ අයුරින් පතුරුවා හරින මෛත්‍රිය විශ්ව ව්‍යාප්ත ගුණ ධර්මයන් බව පෙන්වා දී ඇති අයුරු පැහැදිළි ය. මෛත්‍රී භාවනාව වඩන්නාගේ ප්‍රාර්ථනය වනුයේ, කිසිවෙක් කිසිවෙකු නොරවටත්වා! කොහිවත් කිසිවෙක් අන් අය පහත් කොට නොසිතත්වා! කුරිරු සිතකින්, වෛර සිතකින් එකෙක් අනෙකෙකුට දුකක් වේවායි නොසිතත්වා! යන්න ය. එමෙන්ම තමන් පසණක් නොව අන් අයද මෛත්‍රී සහගත සිත් උපදවා ගනිත්වා! යි යන්න ද මෛත්‍රී භාවනාව කරන්නාගේ ප්‍රාර්ථනයක් වනු ඇත.

එපමණක් නොව මවක් තම එකම පුතා ජීවිතය පුදා ආරක්ෂා කරන්නාක් මෙන් සියළු සතුන් වෙත අප්‍රමාණව මෛත්‍රිය වැඩිය යුතු බව දත යුතුය. මින් මෛත්‍රිය අප්‍රමාණ ධර්මයක් ලෙස නොහොත් මෛත්‍රිය අප්පමඤ්ඤාවක් ලෙසින් වර්ධනය කරන අයුරු පිළිබිඹු වෙයි. මින් නොනැවතෙන මෙත් වැඩීම බඹ විහරණයක් ලෙස සිදු කළ යුතුය. ඒ කෙසේද යත් මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා යනාදී වශයෙන් වූ සතර බ්‍රහ්ම වියරණයෙන් යුක්තව මෙත් වැඩිය යුතුය.

මේ අයුරින් මෙත් වඩන පුද්ගලයා පෞද්ගලිකව තම සුඛ විහරණයට ඉන් කිසිවක් අපේක්ෂා නොකරයි. හුදෙක් ලෝකවාසී සත්වයාගේ යහපත උදෙසා මෙත් වඩයි. අද ලොව එසැනින් මිනිසා අනෙකා හොඳින් ජීවත් වනු දැකීමට ප්‍රිය නොකරයි. තමාගේ යහපත පිණිස විනා අන් අයගේ යහපත පිණිස කිසිවක් කරනු තබා යහපත් සිතින් ආශිර්වාද කිරීමට පවා මැලි වෙයි. මෙකී දුර්ජන තත්වය කොතෙක් වර්ධනය වී ඇත්ද යත් තම සහෝදර සහෝදරියන්ගේ දියුණුවට පවා එරෙහි වන සහෝදර සහෝදරියන්ද සිටිනු දක්නට ලැබීම කෙතරම් අභාග්‍යයක්ද? තම හිතවතුනනට තමන්ගේම අයවළුන් පිළිබඳව කේලාම් කියා අප්‍රසාදයට ලක් කිරීමට උත්සහ දරණ අයද නැත්තේම නොවේ. එවන් සමාජ පසුබිමක අසල්වැසියා මිත්‍රයා යනාදි වූවන්ට එරෙහි වනු දැකීම සුලභ කරුණකි. අනිටු ඵල ලැබෙනුයේ තමන්ටමය. අන් අයගේ යහපතට එරෙහි වන්නෝ දුර්ජනයෝමය. එපමනක් නොව කෙදිනක හෝ එම දුර්ජන ක්‍රියාවට ලෝක ධර්මතාවය පවා එරෙහිවනු නියතය. එබැවින් ජීවත්වන කෙටි කාලය තමන්ට වැඩදායී ලෙස මෙත් සිතින් ජීවත් වීම නුවණට හුරුය. මෙත්තානිසන්ස සූත්‍රයේ සඳහන් පරිදි සුවසේ නිදීම, සුවසේ පිබිදීම, නරක හීන නොපෙනීම මිනිසුන්ට ප්‍රිය වීම, නොමිනිසුන්ට ප්‍රිය වීම, දෙවියෝ රැක දීම, ජලය, ගිනි, විස ආයුධ යනාදියෙන් ආරක්ෂා වීම, වහා සිත එකඟ වීම, ඉපදීම යනාදිය මෛත්‍රියෙහි අනුහස්ය.

මිනිස් බව වනාහි දුර්ලභය. එකි දුර්ලභ මිනිසත් බව උදාකරගත් බව ලෝ සත වෙත මෙත පතුර වමු. එය කළ හැක්කේ මිනිසාටම පමණි. සියලු සත්වයෝ සුවපත් වෙත්වා!

ආර්.එන්.එච්.එම්.සමන් ජයරත්න

## ii පිටුවෙන්....

අන් කටාහයෙහි රෝපනය කරවු සේක. සියල්ලම බලා සිටියදීම ෂතර රියන් පමණ වූ බෝ පැල 08 ක් පැන නැංගේය. මේ ප්‍රතිහාර්ය දුටු රජතුමා ස්වේත ඡත්‍රයෙන් පූජා කොට ත්‍රිශංඛයෙන් අභිශේක ජලය වත් කලේය. මේ බෝ පැල අට

01. දඹුලු තොට
02. කමක්ක නම් බ්‍රාහ්මනයාගෙ ගම
03. ථූපාරාමය අසල
04. හසුන්ගිරි වෙහෙර
05. ප්‍රථමක චෛත්‍ය ස්ථානය
06. සෑගිරිය
07. රුහුණේ කදරගම
08. රුහුණේ සඳුන්ගම

යන ස්ථාන වල රෝපණය කරන ලදි. ඉතිරි පැල 08 ගෙන්ම 04 බැගින් පැල 32 ක් ඇති විය. දෙතිස් ඵල වුහ. බෝධීන් නමින් මේවාද ස්ථාන 32 ක රෝපණය කරන ලදි.

සඟමිත් තෙරණිය මේ රටට වැඩම වීමේ පළමු අපේක්ෂාව වූයේ ලංකාදීපය තුළ මෙහෙණි සසුන ආරම්භ කිරීමයි. පැවැද්ද ලබනු අපේක්ෂාවෙන් කලක සිට ඊට ඇප කැප වී සිටි අනුලා බිසව ප්‍රමුඛ කාන්තා පිරිස සංඝමිත්තා තෙරණියගෙන් පැවිද්ද ලබා ගෙන නොබෝ දිනකින් කෙලෙස් ප්‍රහීන කලහ. මේ අයුරින් ආරම්භ කරන ලද භික්ෂුණී සමාජය දුටුගැමුණු රාජ්‍ය කාලය වන විට ඉතාම දීප්තිමත්ව පැවතුනි. රුවන්වැලි සෑයේ කොත් පැළදවීමේ මහා උත්සවයට භික්ෂුණීහු දාහතර දහසක් සහභාගී වූ බවත් මහා වංශයේ සඳහන් වේ. මිරිස වැටිය චෛත්‍යයේ කොත් පැළදවීමේ පූජෝත්සව අවස්ථාවේදී රැස්වූ පිරිස අතර භික්ෂුණීහු අනූපන්දහසක් සිටි බව ථූපවංශයෙහි සඳහන් වේ. කාවන්තිස්ස රජුගේ දියණිවරුන් වූ මහිලා හා සමන්තා ඒ අයුරින් රජුගේ පුරෝහිත බමුණාගේ දියණියන් වූ දාසි, ගිරිකලි, සුබ්බපාසිකා, සංඛපාලි යන මෙහෙණිවරු එකළ භික්ෂුණී ශාසනය හෙබවූ බව සඳහන් වේ.

අනුරාධපුර රාජධානි අවධිඅයේ විසූ භික්ෂුණීහු ධර්මය ඉගෙනීමටද, ඉගැන්වීමටද මූලික ස්ථානය ගෙන කටයුතු කළහ. අනුරාධපුර මහා විහාරයේ වැඩ සිටි භික්ෂුණීන් වහන්සේලා එහි සිට විනය ග්‍රන්ථ 05 හා අභිධර්ම ග්‍රන්ථ 07 ම ඉගැන්වූ බව දීපවංශයේ සඳහන් වේ. වළගම්බා රජු දවස භික්ෂුණීන් දසදහසකට ප්‍රධාන වූ උත්තරා නම් භික්ෂුණියක් ත්‍රිපිටකය උගන්වා ඇත. දෙවන පෑතිස් රජ දවස විසූ මහදේවි, පදුමා, හේමා යන භික්ෂුණීහු විනය ඉගැන්වූහ. දෙටුතිස් රජුගේ බිසව රජුට පින් අනුමෝදන් කලේ පැවිදිවී අභිධර්මය ඉගෙනීමෙනි. ත්‍රිපිටකය ආරක්ෂා කර ගැනීම මුඛ පරම්පරාවෙන් පවත්වාගෙන යාම කෙරෙහි භික්ෂුණීන් වහන්සේලා ඉතා උනන්දුවෙන් කටයුතු කල බව මේ තොරතුරු වලින් අපට පෙනී යයි.

මෙසේ ඉතාම දීප්තිමත්ව පැවති භික්ෂුණී සමාජය පොළොන්නරු යුගයේ අග භාගය වන විට මේ රටට පැමිණි සොලී ආක්‍රමණ ආදි නොයෙක් ව්‍යසනයන් නිසා අතුරුදහන් විය. එහෙත් දැනට වසර 14 ට පෙර රංගිරි දඹුලු රජමහා විහාරය මුල්කරගෙන ථෙරවාදී සම්ප්‍රධායානුකූලව භික්ෂුණී සමාජය නැවත ආරම්භ විය. දැන් ශ්‍රී ලංකාව පුරා භික්ෂුණීන් වහන්සේලා දහසකට අධික පිරිසක් ධර්ම විනය ආරක්ෂා කරමින් ලෝක ආර්ථ සෙවයෙහි යෙදෙමින් වැඩවාසය කරති.

වත්මන් භික්ෂුණීන් වහන්සේලා විසින්,

**1.**දහම් පාසල් පවත්වාගෙන යමින් මේ රටේ අනාගත පරපුර ගුණ දහමින් පෝෂණය කිරීම උදෙසා ඇප කැප වී කටයුතු කරන අතරම පාසල් පෞද්ගලික පාසල් මෙන්ම විශ්ව විද්‍යාල ක්ෂේත්‍රයටද ඇතුලත් වී දරුවන් උදෙසා අධ්‍යාපනය ලබාදීමේ යෙදි වැඩ වාසය කරති.

**2.**මනෝ විද්‍යාත්මක උපදේශන සේවා පවත්වාගෙන යමින් නොයෙක් ආකාරයේ මානසික ගැටළු වලට මුහුණ පා ඇති පිරිස් එයින් මුදවාගෙන දහම් සිසිල ලබා දෙනු ලැබේ.

**3.**ධර්මය හදාරමින්, ගවේෂණය කරමින්, පොතපත ලියමින්, ග්‍රන්ථ ධූරයෙහි නියලි සිටින අතරම ධර්ම දේශනා භාවනා වැඩසටහන් පවත්වමින් සත්වයා සසර කතරින් එතෙර කිරීමේ පරමාර්ථයෙන් කටයුතු කරනුලැබේ.

**4.**පිරිත් දේශනා, බෝධි පූජා, ගිලානෝපස්ථාන ආදිය දේ සිදුකරමින් සත්වයාගේ ලෞකික ජීවිත සුවපත් කිරීමෙහිලා කටයුතු කරනු ලැබේ.

**5.**ගණිකා වෘත්තිය, මත්ද්‍රව්‍ය විකිණීම, පාවිච්චි කිරීම, සොරකම් කිරීම ආදි නොයෙක් අපචාර වලට යොමු වී ඇති කාන්තාවන් සොයා වැඩම කරවකලද භික්ෂුණීන් වහන්සේලා ඔවුන් සුමගට ගැනීමෙහිලා අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කරනු ලැබේ.

**6.**බෞද්ධයගේ උපතේ සිට මරණය දක්වා සියළු ආගමික කටයුතු කර දෙමින් ඔවුන්ගේ මෙලොව පරලොව ජීවිත සැපවත් කිරීමෙහිලා කටයුතු කරනු ලැබේ.

මේ අයුරින් වත්මන් භික්ෂුණීන් වහන්සේලා නිහඬ සමාජමෙහෙවරක යෙදෙමින් වැඩ වාසය කරනු ලැබේ.